# “අපේ ආරවුල් අපිම විසඳමු”

## පාසල් සමථකරණය තුළින් සහජීවනය වර්ධනය

සුහදශීලි ආරවුල් නිරවුල් කිරීමකට
ප්‍රායෝගික හා සාරධර්මීය ප්‍රවේශයක්

ආසියා පදනමේ මූල්‍ය සහයෝගයෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව සහ
අධිකරණ අමාත්‍යංශය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි

The Asia Foundation

# “අපේ ආරවුල් අපිම විසඳමු”

පාසල් සමථකරණය තුළින්
සහජීවනයෙන් පිරි රටක්

සුහදශීලී ආරවුල් නිරවුල් කිරීමකට
ප්‍රායෝගික හා සාරධර්මීය ප්‍රවේශයක්

# පටුන


සාමකාමී බවින් දැයේ පෙරගමන්කරුවන්  පෝෂණය කරමු v

සමථකරණය පාසල් පද්ධතියට vii

සමථකරණය තුළින් සාමකාමී සහජීවනයෙන්
යුක්ත පාසල් පද්ධතියක් ගොඩ නගමු ix

හැඳින්වීම 1

පාසල් සමථ ඒකක පිහිටුවීමේ වැඩමුළුවේ අරමුණු හා ඉලක්කයන් 2

ව්‍යාපෘතිය තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම් 2

ව්‍යාපෘතිය තුළ අපේක්ෂිත ප්‍රතිලාභ 2

පාසල් සමථ ඒකක පිහිටුවීමේ පස් දින පුහුණු වැඩසටහන 3

පාසල් සමථ ඒකකයක් යනු 3

පස් දින පුහුණු වැඩසටහන පෙළ ගැස්ම 6

පළමු දිනය

දෙවන දිනය

තෙවන දිනය

හතර වන දිනය

පස් වන දිනය

පස් දින පුහුණු වැඩසටහන - විස්තරාත්මකව 8

පළමු දිනය 9

ක්‍රියාවලියේ අරමුණ පැහැදිලි කිරීම හා පිළිගැනීම 9

සිසුන්, ගුරුවරුන් හා සම්පත් දායකයින් හඳුනා ගැනීම 10

සිසුන් හඳුනා ගැනීම සඳහා වන දෙවන ක්‍රියාකාරකම 19

ශාලා රීති ලබා ගැනීම 13

ගැටුම් නිරාකරණය සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම 14

නිර්මාණශීලීත්වය සහ විවිධ දෘෂ්ටිකෝණයන් අවබෝධ කර ගැනීම 15

'ගැටුම' හැඳින්වීම 16

ගැටුම් ගෝලය හැඳින්වීම 18

දිනය 01 - ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම 20

දෙවන දිනය 21

උදෑසන එකමුතුව, පෙර දින ඇගයීම 21

වෙනසට සංවේදී වීමේ වැදගත්කම 21

පුද්ගලික ආකල්පවල බලපෑම අවබෝධ කර ගැනීම 22

ගැටුම් කළමනාකරණය 24

පෙර දින අභ්‍යාස ඉදිරිපත් කිරීම 27
අවාචික සන්නිවේදනයේ ප්‍රායෝගික භාවිතය 30
ක්‍රියාකාරකම 2.8 - උපන් දිනයට පෙළ ගැසීම 30
සන්නිවේදන බාධක හැඳින්වීම 30
සන්නිවේදන ශිල්ප ක්‍රම 31
අනුමාන කිරීම් 35
සන්නිවේදනයේ සීමාවන් 35
දිනය 02 - ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම 36
තෙවන දිනය 37
උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම 37
පෙර දින නිවැසි ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම හා ඇගයීම 37
සාකච්ඡාව - ප්‍රායෝගික භාවිතය I 39
සාකච්ඡාව - ප්‍රායෝගික භාවිතය II 40
ආරවුල් නිරවුල් කර ගත යුතු ආකාරය 41
ගැටළුව විසඳන ආකාරය 41
දිනය 03 - ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම 42
හතර වන දිනය 43
උදෑසන එකමුතුව - පෙර දින ඇගයීම 43
සමථකරණය යනු කුමක්ද? 46
සමථකරණයේ ඉතිහාසය හා විකාශනය 46
පෙර දින නිවැසි ක්‍රියාකාරකම ලබා ගැනීම 47
සමථකරණයේ වාසි පැහැදිලි කිරීම 47
සමථකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම 48
සාර්ථක සමථකරණයක ලක්ෂණ 71
දිනය 04 - ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම 53
පස් වන දිනය 54
උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම 54
සමථ මණ්ඩල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය 54
සමථකරණ මූලධර්ම 55
සහකම්පනය සහ අනුකම්පාව 56
සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වය හා පාසල් සමථ ඒකකය පිහිටුවීම 57
දින 05 පිළිබඳ මතක සටහන් කිරීම 58
නිල ලාංඡන හා සහතික පත් ප්‍රදානය හා අවසන් දින උත්සවය 59
වැඩසටහන පසු විපරම හා අධීක්ෂණය 60

ඇමුණුම් 01 62
ඇමුණුම 02 63
ඇමුණුම 03 64

**රූපක වගුව**

1 වන රූපකය පාසල් සමථකරණ ඒකකයේ සංයුතිය
2 වන රූපකය පාසල් සමථකරණ ඒකකවල සැසිවාර ක්‍රියාත්මක වන අවස්ථාවන් සඳහා උදාහරණ (විවිධ පාසල් ඇසුරෙන්)
3 වන රූපකය ගැටුම් චක්‍රය ඇසුරෙන් ගැටුම්වලට හේතු හඳුනාගැනීම
4 වන රූපකය ගැටුම් චක්‍රය
5 වන රූපකය පුද්ගලයෙකුගේ ආකල්ප ගොඩ නැගෙන ආකාරය
6 වන රූපකය තෝමස්-කිල්මන් ගැටුම් කළමනාකරණ ආකෘතිය
7 වන රූපකය ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමවේද
8 වන රූපකය සන්නිවේදන ප්‍රවාහය
9 වන රූපකය සන්නිවේදන ප්‍රවාහය
10 වන රූපකය “මම”, පණිවිඩය
11 වන රූපකය සාකච්ඡා වර්ග
12 වන රූපකය ගැටුමකදී පුද්ගලයෙකුගේ ප්‍රතිචාර
13 වන රූපකය අවශ්‍යතා සහ වුවමනා
14 වන රූපකය සමථකරණයේ පියවර පහ
15 වන රූපකය සාර්ථක සමථකරණයේ ලක්ෂණ
16 වන රූපකය සමථකරුවකුගේ ගුණාංග

# "සමථකරණ ක්‍රියාවලිය" අධිකරණ දක්වා නොගොස් ජන සමාජයේ ආරවුල් විසඳා ගැනීමට ඇති සාර්ථකම ක්‍රියාවලියයි



1988 අංක 72 දරණ පනත මගින් බලාත්මක කොට ඇති සමථකරණ ක්‍රියාවලිය, අධිකරණය දක්වා නොගොස් ජන සමාජයේ ආරවුල් විසඳා ගැනීමට ඇති සාර්ථකම ක්‍රියාවලියයි. සෞභාග්‍යයේ දැක්ම රට ගොඩ නැගීමේ ජාතික ප්‍රතිපත්තියට අනුව අධිකරණ අමාත්‍යාංශයට පැවරී ඇති සුවිශේෂී කාර්යයභාරයන් අතර සමථකරණ ක්‍රියාවලිය සඳහා විශේෂ අවධානයක් අප මේ වන විට යොමු කොට තිබේ. ඒ අනුව දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි සමථ මණ්ඩල පිහිටුවීමට කටයුතු කොට තිබෙන අතර ඒවායේ සමථකරුවන් 9000 කට අධික සංඛ්‍යාවක් ස්වේච්ඡාවෙන් සේවය ලබාදීම සිදු කරයි. දැනට, සමථ මණ්ඩල සඳහා වසරකට යොමු වන ලක්ෂ තුනක් පමණ වූ පැමිණිලි අතරින් 70 %ක පමණ ගැටළු ප්‍රමාණයක් සමථයට පත් කිරීමට හැකිවීම සමථ මණ්ඩල ක්‍රියාවලියේ ජයග්‍රහණයයි. 2021 වසරේ දී එම ක්‍රියාකාරිත්වය දෙගුණයක් දක්වා වර්ධනය කිරීමට අප කටයුතු කොට ඇත. උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් සම්බන්ධ ගැටළු කඩිනමින් සමථකරණය කිරීමට යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වව්නියා, අම්පාර සහ ඊට අමතරව උතුරු මැද පළාතේ අනුරාධපුර, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල විශේෂ (ඉඩම්) සමථ මණ්ඩල ස්ථාපිත කර තිබේ. එයට අමතරව විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල ගැටළු විසඳීම සඳහා සහ මූල්‍ය ගැටළු විසඳීම සඳහා විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කර තිබේ.

සමථකරණ සංකල්පය වර්තමානයට උචිත නව ක්‍රමවේදයන් ඔස්සේ තවදුරටත් පොදු ජනතාවට සමීප කරවමින් ඉදිරියට ගෙන යා යුතු වේ. ඒ සඳහා දැයේ අනාගත පෙරගමන්කරුවන් වන පාසල් සිසුන්ට සමථකරණය පිළිබඳව වූ දැනුම ලබාදීම වෙනුවෙන් 2005 වසරේදී පාසල් සමථකරණ ඒකක පිහිටුවීම ආරම්භ කර ඇති අතර, එය මේ වන විට දිවයිනේ පාසල් 500 ක පමණ ප්‍රමාණයක සාර්ථකව ක්‍රියාත්මක වෙයි. සමථකරණ ක්‍රියාවලිය පිළිබඳව වූ අවබෝධය පාසල් සිසුන් අතර සාර්ථකව වර්ධනය කිරීම සඳහා පාසල් සමථකරණ පුහුණුකරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ප්‍රවර්ධනය කල යුතුව ඇත. එකී කාර්යය සාර්ථක කර ගැනීම උදෙසා පුහුණු අත්පොතක් මෙලෙස සකස් කිරීමට ගෙන ඇති උත්සාහය අගය කල යුතු කටයුත්තකි.

පුහුණුකරුවන්ට සමථ ක්‍රියාවලියේදී ඇති වන ගැටළුවලට විසඳුම් ලබා දෙමින්, පුහුණුකරුවන් සඳහා ඉවහල් වන උපදේශයන් ගෙන හැර දක්වමින්, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම මෙම අත්පොත නිර්මාණය කිරීම ඉතා ප්‍රශංසනීය වේ. දැනුමින් හා අවබෝධයෙන් සවිමත් සමථ පුහුණුකරුවන් බිහි කිරීම උදෙසා මෙම අත් පොත මහෝපකාරී වනු ඇතැයි විශ්වාස කරන අතර ඒ සඳහා මූල්‍යමය දායකත්වය ලබා දෙන ආසියානු පදනමටත්, ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ලබාදුන් සමථ මණ්ඩල කොමිෂන් සභාවට හා සහාය දුන් සියලු දෙනාටමත් මාගේ කෘතඥතාවය පළ කරමි.

**එම්. යූ. එම්. අලි සබ්රි**

ගරු අධිකරණ අමාත්‍ය

අධිකරණ අමාත්‍යාංශය

# සාමකාමී බවින් දැයේ පෙරගමන්කරුවන් පෝෂණය කරමු



නීතිගරුක හා විනය ගරුක සමාජයක් ඇති කිරීමට **“අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරිමෙන් සැලසෙන පහසුකම් මගින් අධිකරණ පද්ධතිය තුළ ප්‍රමාදවීම් වළක්වා ගැනීමට පියවර ගන්නා අතරම, සිවිල් ආරවුල් අධිකරණය දක්වා නොගොස් නිරවුල් කර ගැනීමට සමථ මණ්ඩල ක්‍රියාවලිය තව දුරටත් බල ගැන්වීම”** වත්මන් රජයේ ප්‍රමුඛ කාර්යයභාරයක් වී ඇත. ඒ අනුව 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනතින් බලාත්මකව, සුළු ආරවුල් නිරවුල් කිරිමේ ක්‍රියාවලියක් ලෙසින් ආරවුල් සහ ගැටුම්වලින් පීඩා විඳින ජනතාව ඉන් මුදවා ගැනීම සඳහා දිවයිනේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක සමථ මණ්ඩල මගින් ඉටු කරන සමාජ මෙහෙවර සුළු කොට තැකිය නොහැක. එවන් වූ මහඟු සේවාවක් ඉටු කරනු ලබන සමථකරණ ක්‍රියාවලිය සාධනීය පියවර කිහිපයක් ඔස්සේ විද්‍යානුකූල ප්‍රවේශයකින් යුක්තව සමාජගත කිරීම සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සහ අධිකරණ අමාත්‍යාංශයේ ඒකායන අභිප්‍රායයි.

ඒ අනුව දැයේ පෙරගමන්කරුවන් වන පාසල් සිසුන්ට සමථකරණ සංකල්පය හඳුන්වා දීම 2005 වර්ෂයෙන් ආරම්භ වූ අතර වර්තමානය වන විට දිවයින පුරා පාසල් 500 ට ආසන්න සංඛ්‍යාවක **“පාසල් සමථ ඒකක”** සක්‍රීයව ක්‍රියාත්මක වනු ලබයි. එහි ඉදිරි පියවරක් ලෙස, පාසල් සමථ ඒකක ස්ථාපනයේ දී පුහුණුකරුවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරවීම අත්‍යාවශ්‍ය වී ඇත. එකී කාර්යයභාරය සාක්ෂාත් කර ගැනීම පිණිස පුහුණුකරුවන් සඳහා පුහුණු අත්පොතක් සැකසීම ඉතා ප්‍රශංසනීය කටයුත්තක් ලෙස හැඳින්විය හැක.

පුහුණුකරුවන් සඳහා මාර්ගෝපදේශ දක්වමින් පුහුණු කිරීම්වල දී ඇති විය හැකි ගැටළුවලට විසඳුම් ලබා දෙමින් පාසල් සමථකරුවන්ගේ දැනුම හා ආකල්ප සංවර්ධනයේ දී මෙතෙක් අඩුපාඩුවක් ව පැවති පුහුණු අත්පොතක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම සැකසීම පිළිබඳව මම ඉතා සතුටට පත් වන අතර, පුහුණකරුවන් යාවත්කාලීන දැනුමින් සන්නද්ධ කිරීමට මෙම අත්පොත මහෝපකාරි වන බව මාගේ විශ්වාසයයි.

මෙම අත්පොත සැකසීමට මූල්‍යමය දායකත්වය සැපයූ ආසියානු පදනමටත් අවශ්‍ය මගපෙන්වීම් සිදු කල සමථ මණ්ඩල කොමිෂන් සභාවටත් ඒ සඳහා දායකත්වය ලබා දුන් සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සම්පත් දායකයින්ටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

**එම්. එම්. පී. කේ. මායාදුන්න,**

**ලේකම්,**

අධිකරණ අමාත්‍යාංශය.

# සමථකරණය පාසල් පද්ධතියට



1990 වර්ෂයේ දී ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රමවේදයක් ලෙසින් ස්ථාපිත කරන ලද සමථ මණ්ඩල වසර 33 ක් පුරා ඉතාමත් සාර්ථක අයුරින් ක්‍රියාත්මක වන බව මම ඉතා සතුටින් ප්‍රකාශ කරමි. දිවයින පුරා විසිර සිටින 9000 ක් පමණ වන සමථකාරවරුන් හා සමථකාරවරියන් නිස්සරණාධ්‍යාසයෙන් වසරකට සමථ මූල මණ්ඩලවලට ලැබෙන ලක්ෂ 03 කට ආසන්න වූ ආරවුල් අතරින් සාකච්ඡාවට බඳුන් කරනු ලබන ආරවුල් වලින් 70% ක ප්‍රතිශතයක් නිරවුල් කිරීමට සහය වන අතර, එය ගැටළුවලට මැදිහත්ව පීඩා විඳින පුද්ගලයන්ට මහඟු අස්වැසිල්ලක් වන්නේ සමථකරණ ක්‍රියාවලිය තුළින් ආරවුලේ මූල හේතුව ඉවත් කරමින් ආරවුලට සම්බන්ධ දෙපාර්ශවයටම දිනන විසඳුමක් ලබා දීමට සමත් වන හෙයිනි.

සමථකරණය යනු සමාදානය ඇති කිරීම පමණක්ම නොවේ. සමථකරණය යනු සහමන්ත්‍රණය කේන්ද්‍ර කර ගනිමින් ගැටුම් පාර්ශවයන් තෘප්තිමත් එකඟතාවයකට යොමු කිරීමට සමත් සාර්ථක ගැටුම් නිරාකරණ ක්‍රමවේදයකි. එවන් වූ සමාජයීය දැනුමක් පාසල් පද්ධතියට හඳුන්වා දීමට ලැබීම සමථ මණ්ඩල කොමිෂන් සභාව ලෙස අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

ආරවුලකදී මැදිහත් වන්නකු ලෙසින් සහය වීම පහසු කටයුත්තක් නොවනවා සේම එම දක්ෂතා සහජයෙන් පුද්ගලයකුට හිමි නොවන බැවින්, දැනුම් පරිචය තුළින්ම එය උකහා ගත යුතුව ඇත. කෝපයෙන් යුක්තව කළකිරුණු මානසික මට්ටම් සහිත, සැකසහිත හා වෛරී සිතුවිලිවලින් යුත් පාර්ශවයන් සමග ගනුදෙනු කිරීමේ දී සහකම්පනය, මානව හැසිරීම් රටා තේරුම් ගැනීම, ආකල්ප වෙනස් කිරීමට පුද්ගලයන් සවිබල ගැන්වීමේ ශක්‍යතාවය, සන්නිවේදන ශිල්ප ක්‍රම, ඵලදායී සාකච්ඡාවක් මෙහෙයවීමේ හැකියාව ආදී වූ ක්ෂේත්‍රයන් ගණනාවක් පිළිබඳ පුළුල් දැනුමකින් මැදිහත්කරු සන්නද්ධ විය යුතුව ඇත.

පාසල් සමථකරුවන් නිර්මාණය කිරීමේ කාර්යයේ දී මෙය තවදුරටත් සංකීර්ණ වන්නේ ළමා මානසිකත්වයට බලපෑමක් නොවන අන්දමින් මෙම දැනුම දරුවන්ට ප්‍රවේශ කල යුතු වන හෙයිනි. ඒ අනුව පාසල් දරුවන්ට ආධුනික මාතෘකාවක් වන සමථකරණ ක්‍රියාවලිය ක්‍රියාකාරකම්, කතන්දර, භූමිකා රංගන මෙන්ම නාට්‍යානුසාරයෙන් සිසුන්ට හඳුන්වා දීමට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මගින් ගත් උත්සාහය ඉතා අගය කොට සලකනු ලබන අතරම, පුහුණුකරුවන් සඳහා මෙතෙක් අඩුපාඩුවක්ව පැවති මුද්‍රිත අත්පොතක අවශ්‍යතාවය ඉටු කර දීමට මූල්‍යමය සහාය දැක්වූ ආසියානු පදනමටත්, පාසල් සමථකරණ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දෙන අධ්‍යාපන අමාත්‍යාංශයටත්, මෙම ව්‍යායාමය සාර්ථක කර ගැනීමට සහාය දැක්වූ සැමටත්, මාගේ කෘතඥතාවය පළ කරන අතරම පාසල් සමථකරණ කටයුතු සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

**හෙක්ටර් එස්. යාපා**

**සභාපති,**

සමථ මණ්ඩල කොමිෂන් සභාව

# සමථකරණය තුළින් සාමකාමී සහජීවනයෙන් යුක්ත පාසල් පද්ධතියක් ගොඩ නගමු



"හොඳම දේ දරුවන්ට " ලබා දිය යුතු වන්නේ දරුවන් මුළු මහත් සමාජයේම අනාගත ජීවනාලිය වන නිසාවෙනි. එකිනෙකා පරයා තම අභිමතාර්ථ පමණක් සාක්ෂාත් කර ගැනීමට උත්සුක වන්නා වූ වත්මන් සමාජ ක්‍රමය තුළ වඩා සාමකාමී සහ පරාර්ථකාමී ආකල්පයන්ගෙන් හෙබි අනාගත පරපුරක් බිහි කිරීමේ අති දුෂ්කර වෑයම ඉටු කරගනු වස් **"අපේ ආරවුල් අපිම විසඳමු"** තේමාව යටතේ පාසල් පද්ධතියට සමථකරණ සංකල්පය හඳුන්වා දෙන ලදී.

ඒ අනුව දිවයින පුරා පාසල් ගණනාවක ක්‍රියාත්මක කරනු ලබන සමථ ඒකක මගින් පාසල තුළ දී සිසු දරුවන් අතර ඇතිවන සුළු ආරවුල් නිරවුල් කර ගැනීමට සිසුන් ඍජුවම දායක කර ගැනීමෙන්, පාසල් වියේදීම ගැටුම් නිරාකරණ සංකල්ප ක්‍රමවේද පිළිබඳ දැනුම හා ප්‍රායෝගික කුසලතාවයන් ඔප් නංවා ගැනීමේ අවස්ථාව සිසු දරු දැරියන්ට හිමි වේ. එහිදී, පාසල තුළ තෝරා ගත් සිසුන් කණ්ඩායමකට, සමථකරණ ක්‍රියාවලියේ න්‍යායාත්මක කරුණු පිළිබඳව හා ප්‍රායෝගික භාවිතයන් පිළිබඳව දින 05 ක පුහුණු වැඩසටහනකින් පසුව සිසුන් අතර ඇතිවන සුළු ආරවුල් නිරවුල් කිරීමට යොමු වීමට හැකියාව ලැබේ.

පාසල් සිසුවකු මැදිහත්කරුවකු ලෙසින් සමථකරණය පිළිබඳ දැනුමින් සන්නද්ධ කිරීමේ කාර්යයේදී පුහුණුව අතිශයින් වැදගත් වේ. එහිදී පුහුණුකරුවන් මුහුණ දෙන අභියෝගයන්ට විසඳුමක් ලෙසින් දින 05 ක පුහුණු කාලයක් තුළ පූර්ණ සමථකරුවකු බිහිකිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙමින් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් සහ 'විද්‍යුත් පොත්' ලෙසින් මාර්ගෝපදේශ සංග්‍රහයක් පුහුණුකරුවන් අතට පත් කිරීමට හැකි වීම පිළිබඳව මම ඉමහත් ප්‍රීතියට පත් වෙමි.

එම කාර්යය සාර්ථක කර ගැනීම උදෙසා සමථ මණ්ඩල කොමිෂන් සභාවට "සැමට සාරධර්ම" ව්‍යාපෘතිය හරහා මූල්‍යමය දායකත්වය දැක්වූ ආසියානු පදනමට හෘදයාංගම ස්තූතිය පළ කරන අතරම පාසල් සමථකරණ ක්‍රියාවලිය අඛණ්ඩව වසර 16 ක් පුරා ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දෙන අධ්‍යාපන අමාත්‍යාංශයටත්, පාසල් සමථකරණය තවදුරටත් සාර්ථක කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් හා සහාය ලබා දෙන අධිකරණ අමාත්‍යාංශයටත්, මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීමේ දී සම්පත් දායකත්වය සැපයූ සමථ මණ්ඩල කොමිෂන් සභාවේ නිලධාරීන්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුද කරමි.

අනාගත නායකයින් වන සිසු පරපුරට සමථකරණ සංකල්පය හඳුන්වා දීම තුළින් සාමකාමී සහජීවනයෙන් යුක්ත සමාජයක් දැයට දායාද කිරීමට හැකි වනු ඇතැයි මා විශ්වාස කරමි.

**තිලිනි ගම්මුනගේ,**

**ලේකම්,**

සමථ මණ්ඩල කොමිෂන් සභාව.

# පාසල් සමථකරණය තුළින් සමාජ ඒකාබද්ධතාව ඉහළ නැංවීම



ශ්‍රී ලංකාව තුළ සමථකරණය සමාජගත කිරීම වෙනුවෙන් දීර්ඝ කාලයක සිට කටයුතු කරන ආසියා පදනම, එහි එක් පියවරක් ලෙස සමථ මණ්ඩල කොමිෂන් සභාව සමග එක්ව 'පාසල් සමථකරණය තුළින් සහජීවනය වර්ධනය' නම් වූ මෙම පුහුණු අත්පොත නිකුත් කිරීමට ලැබීම මහත් භාග්‍යයක් ලෙස සලකයි.

යම් ආරවුලක් හෝ ගැටුමක් ඇතිවූ විට ඒ දෙස අප බලන ආකාරය හා එයට ප්‍රතිචාර දක්වන ආකාරයෙහි යහපත් වෙනසක් ඇති කිරීමට සමථකරණය දායක වේ. ඒ තුළින් ස්වයං විනය වර්ධනය වන්නාක් සේම, අන් අය කෙරෙහි ගෞරවය දැක්වීම, ඉවසීම, කරුණාව ආදී ගුණාංගද පුරුදු පුහුණු කරවයි. එමෙන්ම ඍජු ලෙසම අපගේ සමාජ ආකල්ප හා හැසිරීම් වර්ධනය කිරීමට ද සමථකරණය ඉවහල් වේ. ආසියා පදනමෙහි සාරධර්ම සංග්‍රහය (Values Curriculum) හා එහි අන්තර්ගත විශේෂිත ක්‍රියාකාරකම් කිහිපයක් මෙම අත්පොතට ඇතුළත් කරනු ලැබූයේ එම යහපත් අරමුණ පෙරදැරි කර ගනිමිනි. ආසියා පදනමෙහි 'Values4All' (සැමටම සාරධර්ම) වැඩසටහන මගින් සක්‍රීයව සවන් දීම, සාමය, ගෞරවය, ඉවසීම, කරුණාව, අවංක බව හා සහයෝගයෙන් වැඩ කිරීම ආදී ක්‍රියාකාරකම් හරහා දරුවන් සහ යෞවනයන් තුළ එකමුතු බව හා සුහදශීලී බව පිළිබඳ හැඟීම් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

පාසල් සමථකරණ වැඩසටහන තුළින් දරුවන් හට මහත් ප්‍රතිලාභ අත්වනු ඇති බවත්, තමන් මෙන්ම අනුන් පිළිබඳව ද නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට සහාය වනු ඇති බවත්, විශේෂයෙන්ම කුඩා කල සිටම ප්‍රචණ්ඩ නොවන සන්නිවේදනය තුළින් ගැටුම් නිරාකරණය කර ගැනීමට ඉගෙනගත හැකි වනු ඇති බවත් අපි විශ්වාස කරමු. සිසුන් පාසලේදී උගත සමථකරණ ශිල්ප ක්‍රමයන් පාසලෙන් පිටතදී භාවිතා කල අවස්ථාවන් පිළිබඳව අසන්නට ලැබෙන අතර, බ්‍රිතාන්‍ය පාසල්වල සමථකරණය ක්‍රියාත්මක කල මුල් අවධියේ, සමථකරණය අත්දුටු දරුවෝ නිවසේදී තම සහෝදර සහෝදරියන් අතර ගැටුම් මෙන්ම ඉන් පිටත තම සම වයසේ දරුවන් අතර ගැටුම් ද නිරාකරණය සඳහා තම සමථකරණ හැකියාවන් යොදා ගත්හ. (ජොන්සන්, ජොන්සන් හා ඩඩ්ලි, 1992 හා 1997).

මෙම අත්පොත සකසනු ලැබුයේ සමථ මණ්ඩල කොමිෂන් සභාව සමග දශක තුනක් පුරා අත්වැල් බැඳගෙන ශ්‍රී ලංකාව තුළ සමථකරණය සමාජගත කිරීම වෙනුවෙන් කැප වූ ආසියා පදනම මගිනි. ශ්‍රී ලංකාවේ සමථකරණය වෙනුවෙන් දායකත්වය දක්වන සමථ මණ්ඩල කොමිෂන් සභාව හා අධිකරණ අමාත්‍යාංශයට අපගේ හද පිරි ස්තුතිය පුද කරමු. ශ්‍රී ලංකාව තුළ සමථකරණය ස්ථාපනය කිරීමෙහිලා සාධනීය මෙහෙවරක් ඉටු කල ආසියා පදනම ඉදිරියේදී ද ඒ වෙනුවෙන් ඇපකැප වන්නෙමු. මෙම පුහුණු අත්පොත හරහා ශ්‍රී ලාංකීය පාසල් තුළ ද සමථකරණය ස්ථාපනය කිරීමට හැකි වෙනු ඇතැයි අප අපේක්ෂා කරන අතර, මෙම වැඩසටහනට ඉදිරියේදී සම්බන්ධ වන සියලුම තරුණ සමථකරුවන් හට ජය පතමි.

**දිනේෂා ද සිල්වා වික්‍රමනායක**

ශ්‍රී ලංකා නියෝජිත

ආසියා පදනම

# හැඳින්වීම

අන්‍යෝන්‍ය වශයෙන් තැනැත්තන් විසින් දකිනු ලබන පරස්පර විරෝධී ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීමේදී එකිනෙකාට කරනු ලබන බාධා කිරීම් ගැටුමක් ලෙස හැඳින්විය හැකි අතර, එය සියළු සමාජයන්හි ද, ප්‍රජාවන්හි ද, අනිවාර්ය සංසිද්ධියක් ලෙසින් බලාපොරොත්තු විය යුත්තකි. කයින් මෙන්ම මනසින් ද එකිනෙකාට වෙනස් මිනිස් සමාජයක් තුළ පුද්ගලයන් අතර ඇති වන අනේක විධ වූ අපේක්ෂාවන් යථාර්ථයක් කර ගැනීමට යාමේදී මතු වන ආරවුල් සහගත තත්වයන් මෙන්ම, එම ආරවුල්වලට සම්බන්ධ වූ සියළු පාර්ශවයන් තෘප්තිමත් වන ආකාරයෙන් ගැටුම් නිරාකරණ ක්‍රමවේදයන් වෙත යොමු නොවීම, ආරවුල්කරුවන් මෙන්ම සමාජය ද මුහුණ දෙන ප්‍රබල බාධකයක් වී ඇත.

ඒ අනුව දෙපාර්ශවයක් අතර ඇති වන ආරවුලක් දුරදිග නොයා තෙවන පාර්ශවයක් මැදිහත් වීමෙන් සාකච්ඡාමය ක්‍රියාවලියක් තුළින් නැවත එවන් ආරවුලක් ඇති නොවන මට්ටමට එනම්, ගැටුමේ මූල හේතුව ඉවත් වන පරිදි විද්‍යානුකූල පදනමකින් නිරවුල් කිරීමකට යොදා ගන්නා ඵලදායී ක්‍රමවේදයක් ලෙසින් සමථකරණය හැඳින්විය හැකිය. එලෙසින්ම ආරවුලක අවසානය විනාශයක් නොවී ධනාත්මක ප්‍රවේශයකින් යුක්ත නිමාවක් කරා ගෙන යාමට ආරවුල්කරුවන්ට මඟ විවර කර දීමට සමථකරණය තුළින් හැකියාව ලැබෙනු ඇත.

මෙම ඵලදායි ගැටුම් නිරාකරණ ක්‍රමවේදය දැයේ හෙට දවසේ උරුමකරුවන් වන පාසල් සිසුන්ට ප්‍රවේශ කරලීමේ මහඟු කර්තව්‍යය 2004 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධිකරණ අමාත්‍යාංශයේ මෙහෙයවීම මත, තෝරා ගත් පාසල් 30 ක නියමු ව්‍යාපෘතියක් ලෙසින් ක්‍රියාත්මක කරනු ලැබීය. උක්ත වැඩසටහනේ සාර්ථකත්වය මත වර්තමානය වන විට දිවයිනේ පාසල් විශාල සංඛ්‍යාවක "පාසල් සමථ ඒකකයන්" සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබන අතර ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන යටතේ 2018 වර්ෂයේ දී පාසල් 85 ක් හා 2019 වර්ෂයේ දී පාසල් 96 ක් වශයෙන් පාසල් 189 ක සමථ ඒකකයන් සක්‍රීයව ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම 2005 වර්ෂයේ සිට මේ දක්වා පාසල් 500 ට ආසන්න ප්‍රමාණයක පාසල් සමථ ඒකකයන් ස්ථාපිත කර ඇත.

# පාසල් සමථකරණ ඒකක පිහිටුවීමේ වැඩමුළුවේ
# අරමුණු හා ඉලක්කයන්

**ප්‍රධාන අරමුණ :-**

- ගැටුම් අවම සාමකාමී පාසල් පද්ධතියක් තුළින් සහජීවනයෙන් හෙබි සමාජයක් බිහි කිරීම.

**සෙසු ඉලක්කයන් :-**

- පාසල් පද්ධතිය තුළ ගැටුම් අවම කිරීම.
- පාසල් සිසුන් තුළට සමථකරණ සංකල්පය ප්‍රවේශ කරලීම.
- පාසල් තුළ ඇතිවන සුළු ආරවුල් පාසල් සිසුන් මගින්ම නිරාකරණය කිරීම.
- ගැටුම් හේතුවෙන් එම ගැටුම් නිරාකරණය වෙනුවෙන් ගුරුවරුන්ට ගත වන කාලය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සහ දැනුම ආකල්ප සංවර්ධනයට යොදා ගැනීම.
- සමථකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම පාසල් අවධියේ පටන්ම සිසුන්ට ලබා දීම.
- පාසල් සිසුන් සමථකරුවන් ලෙස ප්‍රාදේශීය සමථ මූල මණ්ඩල වෙත ආකර්ශණය කර ගැනීම.
- සමථකරණ සංකල්පය සමාජගත කිරීම හා ආරවුල්කරුවන් සෘජුවම සමථ මූල මණ්ඩල කරා තම ආරවුල් යොමු කිරීමට සමාජය තුළට දැනුම ප්‍රවේශ කරලීම.

## ව්‍යාපෘතිය තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම්

- ලංකාවේ සියළු පාසල් ආවරණය වන පරිදි පාසල් සමථ ඒකක පිහිටුවීම.
- සිසුන්ගේ සුළු ආරවුල් යොමු කිරීමට පැමිණිලි පෙට්ටි පාසල්වලට ලබා දීම.
- ආකෘති පත්‍ර භාවිතයෙන් පාසල් සමථ ඒකකයේ ප්‍රගති වාර්තාවන් විදුහල්පති සහ කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව හරහා අධිකරණ අමාත්‍යාංශයට යොමු කිරීම.
- පාසල් සමථ ඒකක සිසුන් සඳහා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම.
- පාසල් සමථ ඒකක සිසුන් සඳහා දීප ව්‍යාප්ත තරඟාවලියක් හෝ පුහුණු කඳවුරක් පැවැත්වීම.

## ව්‍යාපෘතිය තුළ අපේක්ෂිත ප්‍රතිලාභ

- සමථකරණ ශිල්පීය දැනුමකින් සන්නද්ධ පාසල් සිසුන් දැයට දායාද කිරීම.
- සමථකරණ හැකියාවෙන් යුක්ත ගුරුවරුන් පාසල් පද්ධතියට එක් කිරීම.
- නායකත්ව කුසලතා සහිත ආත්මාභිමානයෙන් යුක්ත දරුවන් පිරිසක් බිහි කිරීම.



# පාසල් සමථ ඒකක පිහිටුවීමේ පස් දින පුහුණු වැඩසටහන

පාසල් සමථකරණ ඒකක ස්ථාපනයේ දී දින 05 ක පුහුණු වැඩසටහනක් පාසල තුළ පවත්වනු ලබන අතර, ඒ සඳහා සම්බන්ධවන්නන්ගේ කාර්යයභාරයන් හා වගකීම් පහතින් දක්වා ඇත.




**ගුරුවරුන්** - 05

පාසල් සමථ ඒකකය අධීක්ෂණය, යාවත්කාලීන කරමින් අඛණ්ඩව පවත්වාගෙන යාම, මාසික වාර්තාවන් අදාළ ආයතනවලට යොමු කිරීම, සිසුන් අභිප්‍රේරණය කරමින් එම ඒකකය ක්‍රියාකාරීව පවත්වාගෙන යාම.



**සම්පත් දායකයින්** - 03

සිසුන් හා ගුරුවරුන් සඳහා පස් දින පුහුණු වැඩසටහන් පැවැත්වීම, සමථ සංකල්පය න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ඉලක්ක කණ්ඩායමට ප්‍රවේශ කරලීම, සමථකරණ ඒකකයේ කටයුතු යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම, සිසුන් සඳහා නායකත්ව කුසලතා ප්‍රවර්ධනයට හා ආකල්ප සංවර්ධනයට අවශ්‍ය දැනුම හා මඟ පෙන්වීම ලබා දීම, අවශ්‍ය අවස්ථාවල දී අධිකරණ අමාත්‍යාංශය හා සමථ මණ්ඩල කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. මෙම සම්පත්දායකයින් ලෙස සේවයේ අවශ්‍යතාවය මත සමථ පුහුණු නිලධාරීන්, සමථ වැඩසටහන් නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් (සමථ) කටයුතු කරනු ලබයි.



**සිසුන්** - 35

පාසල තුළ සිසුන් අතර සිදුවන ආරවුල් නිරවුල් කිරීම, පාසල් සමථකරණ ඒකකය සක්‍රීය ව පවත්වාගෙන යාම. පාසල තුළ සිසුන් අතර සමථකරණ ඒකකය ප්‍රචලිත කිරීම, මාසික වාර්තාවන් සකස් කර ඒකකය භාර ගුරුභවතාට ලබා දීම.



**පහසුකම් සපයන්නන්** - 02

පාසල් පස් දින පුහුණු වැඩසටහන පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසා දීම.

**එක් වැඩසටහනකට සහභාගී වන මුළු සංඛ්‍යාව** = 45

## පාසල් සමථ ඒකකයක් යනු :-

පාසල් සමථ ඒකකයක් වශයෙන් හඳුන්වනුයේ සමථකරණ සංකල්පයේ න්‍යායික කරුණු මෙන්ම ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ හැකියාවෙන් හා දැනුමෙන් සමන්විත පුහුණු කරන ලද සිසුන් හා ගුරුවරුන්ගෙන් සැදුම්ලත් ඒකකයකි. එම ඒකකයේ සිසුන් මඟින්, පාසලේ සිසුන් අතර ඇති වන පාසල් විනය කඩතුව මැදිහත් වන (උදා:- සිසුන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතා, ළමා අපචාර වැනි) ආරවුල් හැර සෙසු ආරවුල් නිරවුල් කිරීමක් සිදු කරයි. එසේම පාසල් සමථ ඒකකයේ දී නිරවුල් නොවූ ආරවුල් මෙන්ම, සිසුන්ට නිරවුල් කිරීමක් සිදු කිරීමට බලයක් නොමැති ආරවුල් පාසල් සමථ ඒකකයට යොමු වූ අවස්ථාවන්වල එම ආරවුල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය මැදිහත් වීම් කල හැකි පුද්ගලයන් හා ආයතන සඳහා යොමු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් ද සිදු කරනු ලබයි.

**අ: පාසල් සමථකරණ ඒකකයට ඉදිරිපත් කල හැකි ආරවුල් වර්ග**

මෙම ආරවුල් පාසලේ විනය මණ්ඩලයේ විෂය පථයට පරිබාහිරව ඇතිවන ඒවා වන අතර, සිසුන් අතර ඇතිවන ආදර සබඳතා හා අපයෝජන සම්බන්ධ ගැටළු විනය මණ්ඩලය මගින් අධීක්ෂණය කෙරේ. පහත සඳහන් කරුණුවලට අදාළ ගැටළුවලට මැදිහත් වීම සඳහා පාසල් සමථකරණ ඒකකය බලාත්මක කර තිබේ. වාචික හිංසනය, ඕපාදූප සහ කටකථා, සම්පත්වලට ප්‍රවේශ වීම හෝ ලබාගැනීම, ඊර්ෂ්‍යාව, ශාරීරික ගැටුම්, අධ්‍යයන/ශාස්ත්‍රීය කාර්යයන්වලදී ඇතිවන ආරවුල්, රහස්‍යභාවය උල්ලංඝනය කිරීම් සහ වාචික නොවන තර්ජනාත්මක සන්නිවේදනය ඇතුළු ශිෂ්‍යයන් අතර සහ පාසල් භූමිය තුළ ඇතිවන අන්තර් පුද්ගල ගැටළු (මූලාශ්‍රය: ජොන්සන්, ඩී., සහ ජොන්සන්, ආර්. (1996). ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ගැටුම් නිරාකරණය හා සම වයස් සමථකරණ වැඩසටහන්: පර්යේෂණ පිළිබඳ සමාලෝචනයක්. (අධ්‍යාපනික පර්යේෂණ සමාලෝචනය, 66(4). 459-506.).

පාසලේ පවත්නා සෙසු සමිති සමාගම් ලෙසම සමථ ඒකකය ද පාසලේ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ සක්‍රීය දායකත්වය මත ක්‍රියාත්මක වේ.


පාසල් සමථ ඒකකය සඳහා සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, ප්‍රචාරක නිලධාරි, හා කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත නිලධාරි මණ්ඩලයක් ඒකකයේ සිසුන් අතරින් තෝරා පත්කර ගත යුතු අතර, ඒකකය භාර ගුරුභවතා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය හා සමථ මණ්ඩල කොමිෂන් සභාව සමඟ අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණ කටයුතු සිදු කල යුතුය. එසේම පාසලට අභිමත පරිදි තවත් තනතුරු පාසල් සමථ ඒකකය තුළ ස්ථාපිත කර ගැනිමේ හැකියාව ද ඇත. උදා - පාසලට අවශ්‍ය නම් උප සභාපති, උප ලේකම් ආදී තනතුරු ඒකකයේ සක්‍රීය ක්‍රියාකාරීත්වය වෙනුවෙන් නිර්මාණය කර ගත හැක.

පාසලේ සිසුන්ට තමන් අතර ඇති ආරවුල් සමථ ඒකකයට යොමු කල හැකි අතර, සිසුන්ට ආරවුල් යොමු කිරීමට පැමිණිලි පෙට්ටියක් පාසල තුළ ස්ථාපිත කර තිබිය යුතුය. පැමිණිළි පෙට්ටිය සම්බන්ධයෙන් වගකීම ඒකකය භාර ගුරුභවතා සතු වේ. එසේම ඒකකයේ සිසුන් ආරවුල් නිරවුල් කිරීම සිදු කරන වේලාව හා ස්ථානය පිළිබඳව විදුහල්පතිතුමන් දැනුවත් කර තිබීම වැදගත් වේ.

**ආ: පැමිණිලි පෙට්ටිය**

සාමාන්‍යයෙන් නිර්නාමික පැමිණිලි සඳහා පැමිණිලි පෙට්ටිය භාවිතා කෙරේ. කෙසේ වෙතත් පාසලකදී පෙට්ටියට පැමිණිල්ලක් දැමීමේදී තම නම සහ පන්තිය සඳහන් කරමින් ආරවුල ඉදිරිපත් කල යුතු බවට සිසුන් දැනුවත් කර තිබීම වැදගත්ය. එමඟින් ඒකකයට ආරවුලට මැදිහත් වූ සිසුන් සමඟ සම්බන්ධ වී සමථකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වේ. පාසලේ වෙනත් සිසුන් සමඟ හෝ පාසල තුළ ලියාපදිංචි වී ඇති සංගමයක් හෝ සමාජයක් සමඟ හවුල්ව පැමිණිලි ඉදිරිපත් කිරීමට ද අවස්ථාවක් ඇත.

තෝරාගත් දිනයක හා ස්ථානයක සමථකරණය පිළිබඳ පුහුණු වූ සිසුන් අතරින් තිදෙනෙක් එක් වී සාදා ගනු ලබන සමථ මණ්ඩලයක් හරහා ආරවුල් සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසේ. ආරවුල සාකච්ඡාවට බඳුන් කරන සමථ මණ්ඩලයේ මැද සිටින සාමාජිකයා ප්‍රධාන සමථකරු වනවා සේම දෙපස සිටින සිසුන් සම සමථකරුවන් වේ. ආරවුලෙන් ආරවුලට ප්‍රධාන සමථකරුවන් වෙනස් විය හැක.




*රූප සටහන 1 - පාසල් සමථ ඒකකයේ ප්‍රධාන සාමාජිකයින්*

පාසල් සමථ ඒකකය හරහා සිසුන් අතර ඇති වන ආරවුල් සිසුන්ටම සාකච්ඡා කර නිරවුල් කර ගැනීමට අවස්ථාව උදාවන අතර, ආරවුලට සම්බන්ධ වන සිසුන් සවිබල ගන්වමින් කල්පවත්නා නිරවුල් කිරීමකට එළඹීමට කුඩා කල සිටම මඟ පෙන්වීමක් ද ලබා දෙයි. එමගින් ආරවුල් නිරවුල් කිරීමට ගත වන කාලය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වැය කිරීමට ගුරුවරුන්ට හැකි වන අතරම පාසලේ විනය මණ්ඩලයට ද පාසල් සමථ ඒකකය සහයක් වනු ඇත.



*රූප සටහන 2 - පාසල් සමථ ඒකකයන් පුහුණු කරන අවස්ථාවක*

## පස් දින පුහුණු වැඩසටහන පෙළ ගැස්ම.

**පළමු දිනය**

| | | |
|---|---|---|
| පෙ. ව. | 8.00 - 9.00 | - අරමුණ පැහැදිලි කිරීම හා පිළිගැනීම |
| පෙ. ව. | 9.00 - 10.00 | - සිසුන් ගුරුවරුන් හා සම්පත් දායකයින් හඳුනාගැනීම |
| පෙ. ව. | 10.00 - 11.00 | - සිසුන් හඳුනාගැනීම ක්‍රියාකාරකම් I |
| පෙ. ව. | 11.00 - 11.30 | - උදෑසන තේ විවේකය |
| පෙ. ව. | 11.30 - 12.40 | - ශාලා රීති ලබා ගැනීම |
| ප. ව. | 12.40 - 1.00 | - සිසුන් හඳුනාගැනීම ක්‍රියාකාරකම් II |
| ප. ව. | 1.00 - 1. 30 | - දිවා ආහාරය |
| ප. ව. | 1.30 - 2. 30 | - ගැටුම හැඳින්වීම |
| ප. ව. | 2.30 - 2. 45 | - සවස තේ විවේකය |
| ප. ව. | 2.45 - 3. 45 | - ගැටුම් ගෝලය හැඳින්වීම |
| ප. ව. | 3.45 - 4. 00 | - දිනය ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම : පළමු දිනය |

**දෙවන දිනය**

| | | |
|---|---|---|
| පෙ. ව. | 8.00 - 8.30 | - උදෑසන එකමුතුව, පෙර දින ඇගයීම |
| පෙ. ව. | 8.30 - 9.00 | - වෙනසට සංවේදී වීමේ වැදගත්කම |
| පෙ. ව. | 9.00 - 9.30 | - පෞද්ගලික ආකල්ප සිදු කරන බලපෑම |
| පෙ. ව. | 9.30 - 10.30 | - ගැටුම් කළමනාකරණය |
| පෙ. ව. | 10.30 - 10.40 | - උදෑසන තේ විවේකය |
| පෙ. ව. | 10.40 - 11.40 | - පෙර දින අභ්‍යාස ඉදිරිපත් කිරීම |
| පෙ. ව. | 11.00 - 12.00 | - සන්නිවේදනය හැඳින්වීම |
| ප. ව. | 12.00 - 12.30 | - අවාචික සන්නිවේදනයේ ප්‍රායෝගික භාවිතය |
| ප. ව. | 12.30 - 1.00 | - සන්නිවේදන බාධක හැඳින්වීම |
| ප. ව. | 1.00 - 1.30 | - දිවා ආහාරය |
| ප. ව. | 1.30 - 2.00 | - සන්නිවේදන ශිල්ප ක්‍රම |
| ප. ව. | 2.00 - 2.30 | - අනුමාන කිරීම් පිළිබඳ අභ්‍යාසය |
| ප. ව. | 2.30 - 3.00 | - සන්නිවේදනයේ සීමා |
| ප. ව. | 3.00 - 3.30 | - සවස තේ විවේකය |
| ප. ව. | 3.30 - 4.00 | - දිනය ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම : දෙවන දිනය |

**තෙවන දිනය**

| | | |
|---|---|---|
| පෙ. ව. | 8.00 - 8.30 | - උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම |
| පෙ. ව. | 9.00 - 9.30 | - සන්නිවේදන ශිල්ප ක්‍රම ප්‍රායෝගික භාවිතය |

| | | | |
|---|---|---|---|
| පෙ. ව. | 9.30 - 10.00 | - | පෙර දින නිවැසි ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම හා ඇගයීම |
| පෙ. ව. | 10.00 - 10.30 | - | උදෑසන තේ විවේකය |
| පෙ. ව. | 10.30 - 11.30 | - | සාකච්ඡාව හැඳින්වීම |
| ප. ව. | 12.00 - 1.00 | - | සාකච්ඡාව ප්‍රායෝගික භාවිතය I |
| ප. ව. | 1.00 - 1.30 | - | දිවා ආහාරය |
| ප. ව. | 1.30 - 2.30 | - | සාකච්ඡාව ප්‍රායෝගික භාවිතය II |
| ප. ව. | 2.30 - 3.00 | - | ආරවුල් නිරවුල් කර ගත යුතු ආකාරය |
| ප. ව. | 3.00 - 3.30 | - | සවස තේ විවේකය |
| ප. ව. | 3.30 - 4.00 | - | වැඩසටහන ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම |

## හතර වන දිනය

| | | | |
|---|---|---|---|
| පෙ. ව. | 8.00 - 8.30 | - | උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම |
| පෙ. ව. | 10.00 - 10.30 | - | උදෑසන තේ විවේකය |
| පෙ. ව. | 11.00 - 11.30 | - | සමථකරණය යනු කුමක් ද නිර්වචනය ලබාදීම හා පැහැදිලි කිරීම |
| පෙ. ව. | 11.30 - 12.00 | - | සමථකරණයේ ඉතිහාසය හා විකාශනය පැහැදිලි කිරීම |
| ප. ව. | 12.00 - 1.00 | - | පෙර දින නිවැසි ක්‍රියාකාරකම් ලබා ගැනීම |
| ප. ව. | 1.00 - 1.30 | - | සමථකරණයේ වාසි පැහැදිලි කිරීම |
| ප. ව. | 1.30 - 2.00 | - | දිවා ආහාරය |
| ප. ව. | 2.00 - 3.00 | - | සමථකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම : පියවර 1 - 2 |
| ප. ව. | 3.00 - 3.30 | - | සවස තේ විවේකය |
| ප. ව. | 3.30 - 4.00 | - | සමථකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම : පියවර 3 - 5 |
| | | - | සාර්ථක සමථකරණයක ලක්ෂණ හඳුන්වා දීම |
| ප. ව. | 4.00 - 4.30 | - | වැඩසටහන ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම : හතර වන දිනය |

## පස් වන දිනය

| | | | |
|---|---|---|---|
| පෙ. ව. | 8.00 - 8.30 | - | උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම |
| පෙ. ව. | 8.30 - 10.30 | - | සමථ මණ්ඩල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය |
| පෙ. ව. | 10.30 - 11.00 | - | උදෑසන තේ |
| පෙ. ව. | 11.00 - 11.30 | - | සමථකරුවකු සතු ගුණාංග |
| පෙ. ව. | 11.30 - 12.00 | - | සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වය හා පාසල් සමථ ඒකකය ස්ථාපිත කිරීම |
| ප. ව. | 12.00 - 12.30 | - | වෙනත් පුද්ගලයකුගේ තත්වය තමාට ආදේශ කර ගැනීම |
| ප. ව. | 12.30 - 1.00 | - | දින 05 තුළ සහෝදර ශිෂ්‍යයන් පිළිබඳ මතකයන් සටහන් කිරීම |
| ප. ව. | 1.30 - 2.00 | - | දිවා ආහාරය |
| ප. ව. | 2.00 - 4.30 | - | නිල ලාංඡන හා සහතික පත් ප්‍රදානය හා අවසන් දින උත්සවය |

# පස් දින පුහුණු වැඩසටහන - විස්තරාත්මකව

පහත දැක්වෙන්නේ සෑම දිනකම පැවැත්වෙන ක්‍රියාකාරකම් ලැයිස්තුවයි.

එක් එක් ක්‍රියාකාරකම් සඳහා උපදෙස් අවශ්‍ය ද්‍රව්‍ය, සාකච්ඡා කල යුතු කරුණු, අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල මෙහි සඳහන් කර ඇත.

06 වන කොටසේ සඳහන් වැඩසටහන පරිශීලනයෙන් එක් එක් ක්‍රියාකාරකම සඳහා ගත වන කාලය පිළිබඳව අවබෝධය ලබා ගත හැක.







# පළමු දිනය

## ක්‍රියාවලියේ අරමුණ පැහැදිලි කිරීම හා පිළිගැනීම.

### සමථ මණ්ඩල කොමිෂන් සභාවේ අරමුණු

- ප්‍රජා සමථකරණය සාර්ථක ක්‍රියාවලියක් බවට පත් කිරීම.
- වසරකට අධිකරණයට යාමට තිබූ ආරවුල්වලින් වැඩි ප්‍රමාණයක් සමථකරණය තුළින් නිරවුල් කිරීමකට ලක්කිරීම තුළින් අධිකරණවල නඩු තදබදය අවම කිරීම.
- සමථකරණය තුළින් දෙපාර්ශවයටම සතුටු විය හැකි දිනන විසඳුමක් ලැබීමෙන් පාර්ශවයන් අතර සම්බන්ධතා ආරක්ෂා වීම.
- සමථකරණය තුළින් ආරවුලේ සැබෑ හේතුව ඉවත් කිරීමක් සිදු කිරීමෙන් නැවත එවන් ආරවුලක් ඇති නොවීම.

### පාසල් සමථ ඒකකය ස්ථාපනයේ අරමුණු

- පාසල යනු ප්‍රජාවේම කොටසක් බව ස්ථාපිත කිරීම.
- ගැටුම් අවම පාසලක් බිහි කිරීම සඳහා සමථකරණය සහායක් දැක්වීම.
- ගැටුම් නිරාකරණයේදී සිසුන්ගේ දායකත්වය ඉහළ නැංවීමට හැකි වීම.
- පාසල් පද්ධතියෙන් හෙට දිනයට බිහි කරන නායකයින්, සාමකාමී පුද්ගලයන් කිරීම තුළින් සහජීවනය ගොඩ නැගීම.
- අනාගතයේ විවිධ ගැටුම්වලට සම්බන්ධ වීමෙන් බන්ධනාගාර ගත වීමට හෝ පරිවාස ගත වීමට ලක් වන ළමුන් ඉන් මුදවා ගැනීමට අවශ්‍ය සමාජයීය දැනුම දරුවන් කරා ප්‍රවේශ කරලීම.
- සමාජ ගැටුම් අවස්ථාවන් සහ අපයෝජනයන්, සිදුවීමට හැකි සමාජ වට පිටාවන් පිළිබඳ දරුවන් පූර්ව දැනුවත් කිරීමක් සිදු කිරීම.
- ජාතීන්, ආගම්, භාෂාවන් හා ප්‍රාදේශීයව මෙන්ම වත්පොහොසත්කම් අනුව ඇති වන සමාජයීය වෙනස්කම්වලට දරුවන් සංවේදී කරලීම.
- ගැටුම් නිරාකරණය සඳහා ගුරුවරුන්ට වැය වන කාලය ඵලදායී ලෙස අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීම.



## සිසුන්, ගුරුවරුන් හා සම්පත් දායකයින් හඳුනා ගැනීම

### ක්‍රියාකාරකම 1.1. පළතුරු පිරුණු ගස



අවශ්‍ය ද්‍රව්‍ය:

- සුදු ඩිමයි කොළ කිහිපයක්
- විවිධ පාට සහිත මාකර් පෑන් (රතු, කොළ, නිල්, කහ)
- කොළ රඳවනයක්

ක්‍රියාකාරකම සඳහා උපදෙස්:


**පළමු අවස්ථාව :-**

1. එකම ගසක විවිධ පළතුරු සහිතව චිත්‍රයක් ඇඳීම හා සිසුන්ට එම ගස දුටු විට ඇති වන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම.
2. එවැනි ගසකින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව සාකච්ඡාවක් ගොඩ නැගීම.

**දෙවන අවස්ථාව**

දෙවන අවස්ථාවේදී එම පළතුරුවලට ආරෝපිත අවස්ථාවන් ලබාදීම මගින් සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ තොරතුරු දැන ගැනීම.

සම්පත් දායකයන් විසින් පළමුව තමන් පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින් ක්‍රියාකාරකමට යොමු වීමට ප්‍රවේශයක් ලබා දීම.






ඉගෙනුම් කරුණු :-

- විවිධ පළතුරු එකම ගසකින් ලැබීමෙන් අත්වන වාසි.
- ඒ අයුරින් එකම ශිෂ්‍යයකු තුළ විවිධ දක්ෂතා ඇති විට පෞද්ගලිකව තමන්ටත් සමාජයටත් අත්වන ප්‍රතිලාභ පැහැදිලි කිරීම.

මෙම වැඩමුළුවේ අපේක්ෂාව එවැනි ශිෂ්‍යයකු පාසලට හා සමාජයට දින 05 අවසානයේ දායාද කිරීම බව පැහැදිලි කිරීම.

- තමා පිළිබඳව ප්‍රකාශ කිරීමෙන් තමා සතු දක්ෂතා පිළිබඳව සිසුන් තුළ අභිමානයක් ඇති කිරීම. වැදගත් කරුණු :- ඉගෙන ගැනීමට ඇති හැකියාව පමණක් නොව කෑම පිසීම, ක්‍රීඩා කිරීම, ඇඳුම් මැසීමේ හැකියාව මෙන්ම සිසුන් සමග එකමුතුව සිටීම, සහයෝගයෙන් කටයුතු කිරීම ආදියත් දක්ෂතා බව සිසුන්ට අවබෝධ කරවීම.
- තමා සතු ගුණාංග වර්ධනයටත් නොමැති දක්ෂතා ගුණාංග සංවර්ධනයටත් වැඩසටහන තුළින් අවස්ථාවන් ලැබෙන බව ප්‍රකාශ කිරීම.
- ශිෂ්‍යයන් සියල්ලන්ටම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම මගින් සමාන අවස්ථා සියල්ලන්ටම ලැබෙන බව ඒත්තු ගැන්වීම.
- ලාංකීය සමාජය තුළ විවිධ ආගම් ජාතීන් ජීවත් වන හෙයින් සියල්ලන්ම සමානව සලකමින් සහජීවනයෙන් යුක්තව ජීවත් වීමෙන් රට තුළ අභ්‍යන්තර ආරවුල් වියවුල් අඩු වීමත් එමගින් සංවර්ධනය වේගවත් වන බවත් පැහැදිලි කිරීම.

## සිසුන් හඳුනා ගැනීම සඳහා වන දෙවන ක්‍රියාකාරකම

### ක්‍රියාකාරකම 1.2a බෝලය ක්‍රියාකාරකම

අවශ්‍ය ද්‍රව්‍ය

- සුළං පිරුණු දැල් පන්දුවක් හෝ වොලි බෝලයක්
- සිසුන් හට තම නමේ කැමති කොටසක් සඳහන් සටහන් පත්‍රයක් ලබා දීම (Name Card)

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :

1. සිසුන් හා ගුරුවරුන් රවුමක් ආකාරයට සිට ගැනීමට සලස්වා සියල්ලන්ගේම නම පැහැදිලිව අනෙක් අයට පෙනෙන අයුරින් පැළඳ ගතයුතුය.
2. ක්‍රියාකාරකමට පෙර රවුමේ සිටින සියල්ලන් දෑතම පහළට දමාගෙන සිටිය යුතුය.
3. ක්‍රියාකාරකම ආරම්භයේ දී තමන් ඉදිරියේ සිටින, රවුමේ සිටින කෙනෙකුගේ නම ශබ්ද නගා ප්‍රකාශ කර, එම පුද්ගලයාට අල්ලා ගැනීමට හැකි වන අයුරින් බෝලය දමන ලෙස ප්‍රකාශ කිරීම.
4. බෝලය දැමූ පුද්ගලයා තමන්ගේ දෑත් ඉදිරියට බැඳ ගත යුතුය.
5. බෝලය තමන්ට ලැබුණු පසු දෑත් පහළ තබා සිටින අයෙකුට පමණක් බෝලය දැමිය යුතුය.
6. ක්‍රියාකාරකම සම්පත්දායකයා විසින් ආරම්භය කල යුතුය.
7. මේ ආකාරයට බෝලය සියල්ලන්ටම දැමීම කල යුතුය.
8. ඉන් පසුව නැවත බෝලය ආපස්සට යොමු කිරීමට කණ්ඩායම දිරි ගැන්විය යුතුය.

9. එනම් තමන්ට බෝලය දැමූ පුද්ගලයාගේ නම මතක් කර එය ශබ්ද නගා ප්‍රකාශ කර එම පුද්ගලයාට බෝලය නැවත දැමිය යුතුය.

10. දෙවන වර බෝලය ඇල්ලූ කෙනා අත් පහත දැමිය යුතුය. එනම් ක්‍රියාකාරකම ආරම්භයේ සිටි ඉරියව්වට පැමිණිය යුතුය.

11. අතර මඟදී තමන්ට බෝලය දැමූ පුද්ගලයා අමතක වුවහොත් එම පුද්ගලයා මතක් කර නැවත බෝලය දැමීමට අන් අය ඔවුන්ට සහය විය යුතුය.

12. ක්‍රියාකාරකම සාර්ථක නම් අවසානයේ සම්පත්දායකයා කරා බෝලය පැමිණිය යුතුය.

13. ක්‍රියාකාරම සාර්ථක වූ පසු කණ්ඩායම අගය කල යුතුය.

**ඉගෙනුම් කරුණු :-**

- මතක තබා ගැනීම මගින් ක්‍රීඩාව තුළ රැඳී සිටීමට අවස්ථාව ලැබෙන බව.
- ක්‍රියාශීලී බව වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම.
- අවධානය සුළු මොහොතකට හෝ බිඳ වැටීම තරඟයෙන් ඉවත් වීමට හේතු වන බව.
- මතකය බිඳ වැටීමෙන් කුඩා ක්‍රියාකාරකමක් පවා සිදුකිරීමේ දී ගැටළු ඇති වන බව.
- අවධානය බිඳ වැටීමෙන් සුළු දෙයක් පවා ක්ෂණිකව අමතක වන බව.
- වැඩසටහන තුළ නව සංකල්පයක් ඉගෙන ගන්නා බැවින් මතකය සහ අවධානය අත්‍යාවශ්‍ය බව.
- සහයෝගයෙන් සමථ ඒකකය ඉදිරියට පවත්වා ගැනීමට එකිනෙකා පිළිබඳ අවබෝධය වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම.

## ක්‍රියාකාරකම 1.2b බෝලය ක්‍රියාකාරකම

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. මෙහිදී ද, පෙර පරිදිම සියළු දෙනා රවුමක රඳවා තමන් ඉදිරියේ සිටින කවුරුන් හෝ කෙනෙකුගේ නම ප්‍රකාශ කර බෝලය දමන ලෙස පැවසිය යුතුයි.

2. බෝලය දැමූ පුද්ගලයා බෝලය අල්ලන පුද්ගලයා සිටින ස්ථානයට පැමිණිය යුතුයි.

3. බෝලය අල්ලන පුද්ගලයා බෝලය දැමූ පුද්ගලයා තමන්ගේ ස්ථානයට පැමිණීමට පෙර වෙනත් කෙනෙකුගේ නම ශබ්ද නගා ප්‍රකාශ කර එම පුද්ගලයා සිටින ස්ථානයට යා යුතුයි.

4. බෝලය ඇල්ලීමට නොහැකි වන හෝ ශබ්ද නගා නම ප්‍රකාශ නොකරන හා ස්ථානය නිසි අයුරින් මාරු නොවන අය තරඟයෙන් ඉවත් කල යුතුය.

5. අවසානයේ තිදෙනෙකු ඉතිරි වන තුරු තරඟය ක්‍රියාත්මක වේ.

6. පළමුව තරඟයෙන් ඉවත් වූ අයගෙන් ද අවසානයේ ඉතිරි වූ අයගෙන් ද එසේ වීමට හේතු විමසීම මගින් ඉගෙනුම් කරුණු සාකච්ඡා කෙරේ.

**ඉගෙනුම් කරුණු :-**

- අවධානය ඒකාකාරිව රඳවා තබා ගැනීමේ වැදගත්කම.
- ක්‍රියාශීලී බව.
- මතකය නිවැරදිව තබා ගැනීම වැදගත් වන ආකාරය.
- ක්ෂණික තීරණ ගැනීම වැදගත් වන ආකාරය.
- නිවැරදි තීරණ ගැනිම වැදගත් වන ආකාරය.

අවධානයට :

- සිසුන් තම කණ්ඩායමේ සියලු දෙනාගේම නම් මතක තබා ගැනීම අත්‍යාවශ්‍ය බව.
- එකිනෙකා අතර සුහදතාවය වර්ධනයට එය වැදගත් වන බව.
- කණ්ඩායමක් ලෙස පාසල් සමථ ඒකකය තුළ කටයුතු කිරීමේ දී එකිනෙකා පිළිබඳව අවබෝධයකින් යුක්ත විය යුතු බව.
- නම සඳහන් කාඩ් පත් නොබලා සිසුන්ට නම් මතක තබා ගැනීමට අවස්ථාවක් එමගින් උදා වීම.

## ශාලා රීති ලබා ගැනීම.

### ක්‍රියාකාරකම 1.3. ශාලා රීති ලබා ගැනීම.

අවශ්‍ය ද්‍රව්‍යඃ

- සුදු ඩිමයි 05
- පාට මාකර් (රතු නිල් කළු)

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. සිසුන් හා ගුරුවරුන් සියල්ලන්ම අඩ කවයකට සිටින සේ අසුන් ගන්වා ඔවුන්ට පොත් හා පෑන් ලබා දීම.
2. සුදු ඩිමයි කොළයක් ගෙන එය ඔවුන් ඉදිරියේ රැඳවුමක තැබීම.
3. සිසුන් අතරින් කෙනෙකුට එම කොළයේ සියළුම දෙනා පවසන අදහස් විවිධ පාටින් ලියන ලෙස උපදෙස් ලබා දීම.
4. කණ්ඩායමේ සියළු දෙනාම එක් අයෙක් එක් අදහස බැගින් මෙම දින 05 පුරා ශාලාව තුළ මෙන්ම වැඩසටහන අතරතුර හැසිරිය යුතු ආකාරය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.

   උදා :-

   - වැඩසටහන ආරම්භ කරන අවසන් කරන වේලාව.
   - වැඩසටහන අතරතුර හැසිරිය යුතු ආකාරය.
   - දිනපතා පැමිණීම.
   - වැඩසටහනේ විවේක කාලයන්.
   - සාමූහික බව, ක්‍රියාශීලිබව, පන්තිය පිරිසිදු කිරීම ආදී වශයෙන්.

5. අංක දමමින් ශාලා රීති ලිවීම.
6. අවසානයේ රීතීන් 45 ක් ලබා ගත හැකිවන අතර, අනතුරුව එම රීතීන් එකිනෙක සිසුන් සමඟ සාකච්ඡා කර අනුමැතිය ලබා ගැනීම.
7. එකඟ නොවන කරුණු එකඟ විය හැකි අයුරින් වෙනස් කිරීම.
8. සිසුන්ට රීතීන් හා නීතීන්ගේ වෙනස පැහැදිලි කර දීම.
9. රීතීන් හා එකඟ වීමෙන් වැඩමුළුව සාර්ථක වීමත්, රීතීන් කැඩීමෙන් වැඩමුළුව අසාර්ථක වන හෙයින් රීතීන් කඩන සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතු අකාරය පිළිබඳව ද එකගතා ලබා ගැනීම. උදාහරණ ලෙස සිංදුවක් කීම හෝ නැටුමක් ඉදිරිපත් කිරීම සඳහන් කළ හැක.

**ඉගෙනුම් කරුණු :-**

- සියල්ලන්ගේම සහයෝගය, අවධානය හා හැසිරීම වැඩසටහනට අනුගත කර ගැනීම.
- සාමූහික බව කණ්ඩායම් ක්‍රියාකාරිත්වයේ දී වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම.
- වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සියල්ලන්ම දැනුවත් වීම, වැඩමුළුවේ සාර්ථකත්වයට බලපාන බව පැහැදිලි කර දීම.

**අවධානයට -:**

1. ගැටුම් නිරාකරණ ක්‍රියාවලිය තුළදී සාමූහිකව ක්‍රියා කිරීම වැදගත් වන බව අවබෝධ කරවීම.
2. පහසුකම් සපයන්නෙකු වශයෙන් එක්ව කටයුතු කිරීම අතිශයින් වැදගත් වන බව.
3. සාමූහිකත්වය බිඳ වැටුණු පසු අරමුණු ජය ගැනීමට අපහසු වන බව අවබෝධ කරවීම
4. එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් කණ්ඩායමක් ලෙස අරමුණු ජය ගත් අවස්ථාවන් සාකච්ඡා කිරීම.
5. කණ්ඩායමක් ලෙස අසීරු අවස්ථාවන් ජය ගත් අවස්ථාවන්ට අදාළ වීඩියෝ පට ප්‍රදර්ශනය කිරීම.

   උදා: සතුන් කණ්ඩායමක් ලෙස කටයුතු කර ජයගත් අවස්ථාවන් හා තනිව පරාජය වූ අවස්ථාවන්ට අදාළ වීඩියෝ ප්‍රදර්ශනය කිරීම.

## ගැටුම් නිරාකරණය සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම

### ක්‍රියාකාරකම 1.4. සහයෝගීතාව අවබෝධ කර ගැනීමේ ක්‍රියාකාරකම

*(මූලාශ්‍රය: සහයෝගීතාව සහ එකට වැඩ කිරීම පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 7.5)*
Link: www.values4all.lk/Sinhala/chapter-07/activity-7.5.html

**අවශ්‍ය ද්‍රව්‍ය :**

- පැත්තක දිග මීටර් 2 ක් පමණ වන සමචතුරස්‍රාකාර රෙදි කැබැල්ලක්
- බෝල 03 ක්

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. සිසුන් 1, 2, 3, ලෙස ගණන් කර කණ්ඩායම් 3 ට බෙදිය යුතුය.
2. පසුව සෑම කණ්ඩායමකටම පැත්තක දිග මීටර් 2 ක් පමණ වන සමචතුරස්‍රාකාර රෙදි කැබැල්ලක් හා බෝලයක් ලබා දිය යුතුය.
3. සියළු දෙනාම රෙදි කැබැල්ල අල්ලාගෙන විනාඩි 05 ක් තුළ නොවැටී වැඩිම වාර ගණනක් බෝලය උඩ දැමිය යුතුය.
4. ජයග්‍රාහී කණ්ඩායම තේරීම.
5. ජයග්‍රාහකයින් අගය කිරීම.

**ඉගෙනුම් කරුණු :-**

- සියල්ලන්ගේම සහයෝගය තුළින් සාර්ථකත්වය ළඟා කර ගැනීම පහසු බව.
- සාමූහික බව කණ්ඩායම් ක්‍රියාකාරිත්වයේ දී වැදගත් වන බව.
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීමට කණ්ඩායමේ සාමාජිකයින්ගේ භූමිකා වැදගත් වූ ආකාරය

උදා : නායකයා හා අනුගාමිකයින් කණ්ඩායම් ක්‍රියාකාරිත්වයේ දී වැදගත් වන අකාරය.
අවස්ථානුකූල නායකත්වය වැදගත් වන ආකාරය.

- ගැටුම් නිරාකරණය සඳහා මැදිහත් වන පහසුකම් සපයන කණ්ඩායමක් ලෙස සියලු දෙනාගේ සහයෝගය වැදගත් වන අවස්ථාවන් හා ආකාරයන් පිළිබඳව සාකච්ඡා කිරීම.
- සහයෝගයෙන් කටයුතු කිරීමේ දී ඇතිවන හැඟීම් පිළිබඳව සාකච්ඡා කිරීම.
- සමාජයේදී සහයෝගයෙන් කටයුතු කල යුතු අවස්ථාවන් පෙන්වා දීම.
- සහයෝගයෙන් කටයුතු නොකිරීම නිසා සිදු විය හැකි කරදරකාරී අවස්ථාවන් හා එහිදී ඇතිවන හැඟීම් පිළිබඳව සාකච්ඡා කිරීම.

## නිර්මාණශීලිත්වය සහ විවිධ දෘෂ්ඨිකෝණයන් අවබෝධ කර ගැනීම

### ක්‍රියාකාරකම 1.5. තිත් නවය අභ්‍යාසය


**අවශ්‍ය ද්‍රව්‍ය:**

- සුදු ඩිමයි 01
- පාට මාකර් (රතු, කළු)


**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. සරල රේඛා හතරකින් ඉහත තිත් නවය පෑන ඔසවන්නේ නැතිව කැපීමට උපදෙස් දීම

ක්‍රියාකාරකමට පෙර



ක්‍රියාකාරකමට පසු



2. පළමුව එය නිම කල සිසුවා අගය කිරීම හා ඉදිරියට පැමිණ එය අනෙක් සිසුන්ට ඇඳ පෙන්වීමට අවස්ථාව ලබා දීම.

**ඉගෙනුම් කරුණු :-**

- නිර්මාණශීලී බව.
- වෙනස් අයුරින් සිතීම හා දැකීම.
- ගැටළුවකට විසඳුම් සෙවීමේ දී රාමුවකට කොටු නොවිය යුතු වීම.
- ගැටළු ගවේෂණයේ දී හා ආරවුල් නිරාකරණයේ දී වෙනස් අයුරින් සිතන ආකාරය වැදගත් වන බව.
- අගය කිරීම මගින් සිසුන් අභිප්‍රේරණය කිරීම.

වැදගත් කරුණු :-

- ගැටළුවක් නිරවුල් කර ගැනීමේදී පුද්ගලයන් නිර්මාණශීලී විය යුතු බව.
- ගැටළුවක් ඇති පුද්ගලයාට ගැටළුව නිසා ඇති ආවේග හේතුවෙන් එහි විසඳුම් නොපෙනෙන බව.
- ගැටළුවකින් තොර තෙවැනි පාර්ශවයට වෙනත් කෙනෙකුගේ ගැටළුවක් නිරවුල් කිරීමක දී ප්‍රශස්ත මැදිහත්කරුවෙකු විය හැකි බව.
- පාසලේ ආරවුල් නිරවුල් කිරීමට තෙවැනි පාර්ශවයක් ලෙස මෙම සිසුන්ට විශාල කාර්යයභාරයක් ඉටු කිරීමට හැකි බව පැහැදිලි කර දීම.

## ගැටුම හැඳින්වීම

### ක්‍රියාකාරකම 1.6. ගැටුම හැඳින්වීම

අවශ්‍ය ද්‍රව්‍යඃ

- පාට ඩිමයි, කණ්ඩායමකට එක බැගින්
- පාට මාකර් (රතු නිල් කළු) - කණ්ඩායමකට එක බැගින්

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. කණ්ඩායම් 04කට බෙදා තමන් සතුව ඇති දැනුම උපයෝගි කර ගනිමින් ගැටුම පිළිබඳව නිර්වචනයක් සකස් කිරීමට විනාඩි 10 ක කාලයක් ලබා දීම.
2. පසුව කණ්ඩායම ගොඩ නැගූ නිර්වචනය හා කණ්ඩායමේ අංකය පාට ඩිමයි කොලයක ලියා කණ්ඩායම නියෝජනය කරමින් එක් සිසුවකුට හෝ කිහිප දෙනෙකුට ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම.

ඉගෙනුම් කරුණු :-

- ගැටුමක් යනු කුමක්ද යන්න හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.
- සාමූහික බව.
- අදහස් ප්‍රකාශ කිරීම.
- ඉදිරිපත් වීමේ හැකියාව.
- නිර්වචනයක් ගොඩ නැගීම.
- නිර්මාණශීලී බව.

වැදගත් කරුණු :-

- ගැටුම් හා ආරවුල් සම්බන්ධයෙන් සිසුන් සතුව ඇති දැනුම් මට්ටම පිළිබඳව අදහසක් ලබා ගැනීමට ද මෙම ක්‍රියාකාරකම මගින් වැඩමුළුව මෙහෙයවන්නාට අවස්ථාව උදා වේ.
- සිසුන්ගේ ඉදිරිපත් වීමේ කුසලතා කණ්ඩායම් ඇසුරින් අගය කිරීම හා දියුණු කර ගත යුතු දක්ෂතා පිළිබඳව සාකච්ඡා කිරීම.
- ඔවුන්ගේ නිර්වචන අගය කිරීම හා නිවැරදි කිරීම.
- පොදු නිර්වචනයක් ලබා දීම.

**ඇ: ගැටුම් අධ්‍යයනය - ගැටුම් හේතුවෙන් ඇති වන සමාජ බලපෑම අවබෝධ කර ගැනීම.**

ගැටුම් ඇති වීම මානව ඉතිහාසයේ ආරම්භය දක්වා දිව යයි. බලය ලබා ගැනීම සහ භෞතික දේපල කොල්ලකෑම වැනි විවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේදී අතීතයේ මෙන්ම වර්තමානයේදී ද විවිධ පාර්ශව අතර ගැටුම් නිර්මාණය වී තිබේ.

ගැටුම් සමාජයේ සෑම තරාතිරමකම මානව සම්බන්ධතා සමඟ එකට වෙලී ඇති අතර, එහි ධනාත්මක ගුණාංග ද ඇත. එම නිසා ගැටුම් සමාජ පරිවර්තන ක්‍රියාවලියක් ලෙස ද හඳුනාගත හැක. ගැටුමක් සහජයෙන්ම ප්‍රචණ්ඩ නොවේ. එය සාමකාමී ද ප්‍රචණ්ඩ ද යන්න තීරණය වන්නේ ගැටුම තුළ පුද්ගලයන් හැසිරෙන ආකාරය මතයි.

**සිසුන් සමග සාකච්ඡා කල යුතු කරුණු :-**

- ගැටුමේ ආරම්භය හා විකාශණය.
- ගැටුම් ඇති වන්නේ යම් පරස්පරතාවයක ප්‍රතිඵලයක් මත බව සහ ගැටුම් ඇති වීමට හේතු ගැටුම් ගෝලය තුළින් හඳුනා ගත හැකි බව.
- ගැටුම හැඳින්විය හැකි විවිධ නම්
- ගැටුමක හොඳ හා නරක ප්‍රතිඵල
- ගැටුම් නිසා වන හානි.
- ගැටුම් ඇති කරන පාර්ශවයන් හා අවස්ථාවන්
- ගැටුමක් ඇති වීමට අවශ්‍ය අවම පුද්ගලයින් ගණන.
- ගැටුම සාමාන්‍ය සංසිද්ධියක් බව.
- ගැටුම ධනාත්මක ප්‍රවේශයකින් හඳුනා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම.


## ක්‍රියාකාරකම 1.6. බහුවිධ දෘෂ්ටිකෝණයන් අවබෝධ කර ගැනීම

**අවශ්‍ය ද්‍රව්‍ය :-**

- එකම රූපයක විවිධ අවස්ථාවන් පෙනෙන රූප.

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. එක් එක් රූපයේ දැකිය හැකි විවිධ වස්තූන් හඳුනා ගැනීමට සිසුන්ට පවසන්න.
2. පිළිතුරු වෙනත් සිසුන් සමඟ සසඳන්න.





රූපය B


**ඉගෙනුම් කරුණු :-**

- එකම දෙයක් / එකම ආරවුලක් දෙස විවිධ කෝණයන්ගෙන් බැලිය හැකි බව.
- එකම ආරවුල විවිධ පුද්ගලයින් විවිධ ආකාරයෙන් දැකිය හැකි බව.
- සාමූහිකව කටයුතු කිරීම තුළින් වඩාත් නිවැරදිව යමක් තේරුම් ගැනීමට හැකි වන බව.

## ගැටුම් ගෝලය හැඳින්වීම


**ගැටුම් ගෝලය යනු කුමක්ද ?**

ආචාර්ය ක්‍රිස්ටෝපර් මුවර් විසින් හඳුන්වා දෙනු ලැබූ ගැටුම් ගෝලය මගින් ගැටුම් ඇති විමට බලපාන හේතුන් ගණනාවක්ම විග්‍රහ කරනු ලබයි. මෙහිදී අධ්‍යයනයේ පහසුව සඳහා ගැටුම ඇති වීමට බලපාන හේතුන් පාදක කර ගනිමින් සැබෑ ගැටුම් හා අනවශ්‍ය ගැටුම් ලෙස ප්‍රධාන කොටස් දෙකකට වෙන් කල ද, කඩ ඉර මගින් නිරූපණය කර ඇත්තේ ගැටුමේ තීව්‍රතාවය හා එය පුද්ගලයාට බලපෑම් කරන ආකාරය අනුව, අනවශ්‍ය ගැටුම් හා සැබෑ ගැටුම් ගැටුම් ගෝලයේ කොටස් පහ තුළම අන්තර්ගත විය හැකි බවයි.




*රූප සටහන 3 - ගැටුම් ගෝලය*

**ගැටුමක් ආරම්භක අවස්ථාවේ සිට ප්‍රචණ්ඩත්වය තීව්‍ර වෙමින් විකාශනය වන ආකාරය**



**වැදගත් කරුණු :-**

- අනවශ්‍ය ගැටුම්
- සැබෑ ගැටුම් වෙන් වෙන්ව පැහැදිලි කිරීම
- කතන්දර හා කෙටි ක්‍රියාකාරකම් ඇසුරින් එය විග්‍රහ කිරීම
- අනවශ්‍ය ගැටුම් නිරාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග හා සැබෑ ගැටුමක් නිරවුල් කිරීමේ දී වැදගත් වන කරුණු කෙටියෙන් පැහැදිලි කිරීම.

## ක්‍රියාකාරකම 1.7 ගැටුම් කළමනාකරණය අවබෝධ කර ගැනීම - "ඉඩම බෙදීම ක්‍රියාකාරකම"

**අවශ්‍ය ද්‍රව්‍ය:**


- සුදු ඩිමයි
- පාට මාකර් (රතු, නිල්)


**ක්‍රියාකාරකම සඳහා උපදෙස්:**

පහත රූපසටහන් භාවිතා කරමින් ඉඩම බෙදීම සඳහා සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

**ඉඩම බෙදීමේ කොන්දේසි**

- සමචතුරශ්‍රාකාර ඉඩමකි.
- අයිතිකරුවන් 04 සිටින අතර ඔවුන්ට සමාන ප්‍රමාණයෙන් හා හැඩයෙන් බෙදා දිය යුතුයි.
- ළිඳ පොදුවේ පැවතිය යුතුයි.
- පොල් ගස් 01 බැගින් 04 දෙනාටම අයිති විය යුතුයි.





- තමන්ගේ ඉඩමෙන් ළිඳට යාමට පාරක් තිබිය යුතුයි.

පහත අන්දමින් ආකාර කිහිපයකින් ගැටළුව විසඳිය හැක.

**දිනය 01 ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම**

**දිනය ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් - 01**

1. කණ්ඩායම් 04 කට බෙදා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම.
2. පහත නිවැසි ක්‍රියාකාරකම් මාතෘකා ලබා දිය හැක.
    - ගැටුම මාතෘකා කරගෙන නාට්‍යයක්
    - ගැටුම් ඇති වීමට බලපාන හේතූන් පිළිබඳව පවත්වන රූපවාහිනි වැඩසටහනක්.
    - ගැටුම තේමා කර ගත් විරිඳුවක්
    - දිනයේ ඉගෙන ගත් දෑ ඇසුරින් නිර්මාණශීලී ඉදිරිපත් කිරීමක්
3. වැඩසටහන පිළිබඳව තනි වචනයකින් අදහසක් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම. මෙහිදි කෙනෙක් කියූ අදහසක් තවත් කෙනෙකුට ප්‍රකාශ කල නොහැක.

**ඉගෙනුම් කරුණු :-**

- නිර්මාණශීලී බව
- සහයෝගය
- අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම
- අභියෝග භාර ගැනීම
- ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.

# දෙවන දිනය

## උදෑසන එකමුතුව, පෙර දින ඇගයීම

### ක්‍රියාකාරකම 2.1. රුචිකත්වයන්ගේ විවිධත්වය හඳුනා ගැනීම.

අවශ්‍ය ද්‍රව්‍ය :-

- සුදු ඩිමයි
- පාට මාකර් (රතු, නිල්, කොළ, කළු)

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

- සහභාගීවන්නන්ට තමන් කැමතිම මල සහ එම මලට කැමති වීමට බලපෑ හේතුව සඳහන් කිරීමට පවසන්න.
- මෙය පිළිවෙලට ගත යුතු අතර ඔවුන් ප්‍රකාශ කරන මල්වල නම් සුදු කොළයක විවිධ පාටින් අපිළිවෙලට ලිවීම.
- අවසානයේ විවිධ මල්වල නම් විවිධ පාටින් අලංකාරව ඩිමයි කොළය මත දිස් වීම.

ඉගෙනුම් කරුණු :-

- රුචිකත්වයන්ගේ විවිධත්වය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම.
- රුචිකත්වයන් සමාන වුවත් එයට හේතුන් වෙනස් වන බව සිසුන්ට පෙන්වා දීම.
- වෙනස් බව නිසා අලංකාරය ඇතිවන බව.
- එසේම විවිධත්වය නිසා ගැටුම් ඇතිවීමේ ඉඩක් පවතින බව.
- වෙනස තේරුම් ගත් විට හා වෙනසට සංවේදි වීමෙන් ගැටුම් අවම කරගත හැකි බව.

## වෙනසට සංවේදිවීමේ වැදගත්කම

### ක්‍රියාකාරකම 2.2. වෙනසට සංවේදිවීමේ ක්‍රියාකාරකම

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

- සිසුන් 1 හා 2 ලෙස ගණන් කර කණ්ඩායම් දෙකකට බෙදීම.
- එකිනෙකාට මුහුණලා අඩි 10 ක පමණ පරතරය සහිත පේළි දෙකක් ලෙසට සිටගෙන සිටින්නට සැලැස්වීම.
- ඉන්පසු පේළියේ මැද දුරකට සියල්ලන්ම පැමිණ තමන්ගේ සපත්තු ගැලවිය යුතු වීම.
- නැවත තමා සිටින තැනට පැමිණි පසුව සියල්ලන්ම ඉදිරියට ගොස් තමා ඉදිරියෙන් සිටි සිසුවාගේ සපත්තු දමා ගෙන පේළියේ එම සිසුවා සිටි තැනට ගමන් කිරීම.
- පසුව සිසුන් සමග වෙනත් සිසුවකුගේ සපත්තුව දමා ගෙන සිටීමේදී ඇති වූ තත්ත්වය පිළිබඳ සාකච්ඡාවක් ගොඩනැගීම.

### ඉගෙනුම් කරුණු :-

- වෙනත් පුද්ගලයෙකු හා සමවීමේදී ඇතිවන තත්ත්වය පිළිබඳ අවබෝධය ලබා දීම.
- එම තත්ත්වයට පත්වීමේ දී ඉවසිලිවන්ත බව වැදගත් වන ආකාරය හා අපහසුතා දරා ගැනීම.
- ගැටුම් අවස්ථාවන්වල එවැනි තත්ත්වයන් උදා වූ විට ක්‍රියා කරන ආකාරය පැහැදිලි කිරීම පාදක කර ගත් සාකච්ඡාවක් ගොඩනැගීම.

විවිධත්වය ගැන ඉගෙන ගැනීමට සහ වෙනස්කම්වලට මුහුණ දීමට විකල්ප සාකච්ඡා මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරකම්; ක්‍රියාකාරකම් 5.3 - අගයන් විෂය මාලාවෙන් ✓

## ක්‍රියාකාරකම 2.3. - 7 ට ගණන් කිරීම

### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

සහභාගීවන්නන් සියල්ලම රවුමට සිටුවා එකේ සිට පිළිවෙලට ගණන් කිරීමට පවසන්න. මෙහි දී එකෙන් පටන් ගෙන පිළිවෙලට එක් අයෙක් එක් ඉලක්කමක් ලෙස ගණන් කල යුතු අතර 07 සහ හතේ ගුණාකාරවලට අදාළ ඉලක්කම් (එනම් 7,14,21, ආදී වශයෙන්) එන සිසුවා එම ඉලක්කම නොකියා පාස් යැයි කීම. එසේම 7 න් අවසන් වන 17, 27, 37, වැනි ඉලක්කම්වලින් අවසන් වන සංඛ්‍යා එන සිසුන් ද එම ඉලක්කම නොකියා පාස් යැයි කීම. කිසිවෙකු හෝ වැරැද්දුවහොත් එම සිසුවා ඉවත් කර නැවත 01 සිට ආරම්භ කිරීම. අවසානයේ ජයග්‍රහණය කරන එක් සිසුවකු දක්වා තරඟය කරගෙන යාම.

### ඉගෙනුම් කරුණු :-

- අභියෝග ජය ගැනීම.
- අවස්ථානුකූලව ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීම.
- අඛණ්ඩව අවධානය රඳවා ගැනීම.
- මතකය.
- ජයග්‍රහණයේදී සතුටු වීම.
- හොඳින් සවන් දීම.
- උපක්‍රමශීලී බව.
- වෙනස් වූ තත්වයට අනුගත වීමට ඇති හැකියාව.

# පුද්ගලික ආකල්පවල බලපෑම අවබෝධ කර ගැනීම

## ක්‍රියාකාරකම 2.4: අභ්‍යාසය වකුගඩු ශල්‍යකර්මය

### වකුගඩු අභ්‍යාසය සඳහා උපදෙස් :-

- සිසුන් කණ්ඩායම් 05 කට බෙදීම.
- කණ්ඩායම් පහ වෙන් වෙන්ව රවුම් පහක් ආකාරයට අසුන් ගැන්වීම.
- සියළුම සිසුන්ට ඇස් පියා ගන්නා ලෙස පවසා තමන් ශිෂ්‍යයා යන භූමිකාවෙන් ඉවත්ව ජාත්‍යන්තර රෝහලක වෛද්‍යවරයෙකු සේ සිතීමට උපදෙස් දීම.
- කණ්ඩායමේ සාමාජිකයින් හට තෝරා ගැනීමක් කිරීමට සිදුවන බවත් එහිදී සියල්ලන් එක්ව කණ්ඩායමක් ලෙස තෝරා ගැනීම කල යුතු බවත් ප්‍රකාශ කරන්න.

- හදිසි වකුගඩු ශල්‍යකර්මයක් කල යුතු රෝගීන් 06 ක් සිටින බවත් නමුත් ඇත්තේ එක් වකුගඩුවක් පමණක් වන හෙයින් ඉතා හොඳින් සාකච්ඡා කර එක් රෝගියකු පමණක් තෝරා ගත යුතු බව දැන්වීම.
- ශල්‍යකර්මය හදිසි හෙයින් විනාඩි 10 ක් ඇතුළත රෝගියා තෝරා ගත යුතු බව ද කණ්ඩායම්වලට ඒත්තු ගැන්වීම.
- තම කණ්ඩායම තෝරා ගත් රෝගියා පිළිබඳව හා සෙසු රෝගීන් ඉවත් කිරීමට හේතු ප්‍රකාශ කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන බව ද දැනුම් දෙන්න.
- කණ්ඩායම් සියල්ලටම පහත තොරතුරු අන්තර්ගත කාඩ්පත් ලබා දෙන්න.

ඔබ සියල්ලෝම ජාත්‍යන්තර රෝහලක ශල්‍ය වෛද්‍යවරුන් වේ. ඔබගේ කමිටුවට ඉතා වැදගත් තීරණයක් ගැනීමට සිදුව ඇත. වකුගඩුවක් බද්ධ කිරීමේ ශල්‍යකර්මයක් නොකළහොත් මිය යාමට ඉඩ ඇති රෝගීන් කිහිපදෙනෙක් ආරෝග්‍යශාලාවේ සිටී. වකුගඩුවක් ප්‍රදානය කිරීමට කැමති අය ඇත්තේ එක් අයෙක් පමණි. පහත දැක්වෙන රෝගීන් අතරින් වකුගඩුවක් බද්ධ කිරීමට ඔබගේ කමිටුව තෝරා ගන්නේ කුමන රෝගියා ද, එසේ තෝරා ගැනීමට හේතු වූ කාරණා මොනවාද යන්න සාකච්ඡා කල යුතු අතර කණ්ඩායමට ඒ සඳහා විනාඩි 10 ක කාලයක් හිමි වේ. තෝරා ගැනීම සඳහා කණ්ඩායමේ එකඟතාවය අනිවාර්ය වේ.

- තම වෘත්තියෙන් ඉහළම තැන සිටින ශල්‍ය වෛද්‍යවරියකි. ඇය අවිවාහක කළු ජාතික කාන්තාවකි. වසය අවුරුදු 31 කි.
- වයස අවුරුදු 18 ක් වූ ජපන් ජාතික කාන්තාවකි. ඇය අති දක්ෂ සංගීතඥයෙකි.
- වයස අවුරුදු 40 ක් වූ ගුරුවරයෙකි. දරුවන් දෙදෙනෙකුගේ පියෙකි.
- වයස අවුරුදු 15 ක් වූ ගැබිණියකි. අවිවාහකය. සුදු ජාතික අයෙකි. වෙනත් දරුවන් නැත.
- වයස අවුරුදු 17 ක් වූ ආපන ශාලා සේවිකාවක්. සුදු ජාතික අයෙකි. වැඩි දුර අධ්‍යාපනයක් ලබා නොමැත. ඇයගේ ඉපැයීම් වලින් පවුල නඩත්තු කරයි.
- ඒඩ්ස් රෝගය සඳහා ප්‍රතිකාරයක් ඉතා ඉක්මණින් සොයා ගැනීමට උත්සාහ කරන අවුරුදු 38 ක් වයසැති  සමලිංගික කාන්තාවකි. ඇය විද්‍යාඥවරියකි.

- විනාඩි 10 ක කාලයෙන් අනතුරුව ඒ ඒ කණ්ඩායම් වල තේරීම් සියල්ලන්ටම පෙනෙන අයුරින් වගුවකට ලබා ගැනීම.
- කණ්ඩායම්වලින් තමන්ගේ තෝරාගැනීමට හේතුව සහ අනෙක් රෝගීන් තෝරා නොගැනීමට හේතු වූ කරුණු ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.
- අදහස් දැක්වීම විවාදයක් දක්වා තීව්‍ර කර ගැනීම. එමගින් අදහස් විවිධ වීමෙන් තෝරා ගැනීමක් සිදු කල යුතු අවස්ථාවන්වලදී ආරවුල් ගොඩනැගෙන ආකාරය ප්‍රායෝගිකව පැහැදිලි කර දීම.


**පුහුණුකරුවන් සඳහා විශේෂ උපදෙස් -**

- වෘත්තිය, ජාතිකත්වය, වයස, විවාහක අවිවාහකබව, ස්ත්‍රී පුරුෂ භාවය, පෞද්ගලික ජීවන චර්යාවන් පාදක කරගෙන පුද්ගලයන් සඳහා අගය එක් කිරීම් සිදු නොකළ යුතු බව සිසුන්ට අවබෝධ කරවීම.

- විවිධ පුද්ගලික ආකල්ප පාදක කරගෙන සමාජය තුළ ගොඩනගන පොදු මතවාද හරහා පුද්ගලයන්ට හෝ ඔවුන්ගේ හැසිරීම්වලට අගය එක් කිරීමට යාමෙන් ආරවුල් නිර්මාණය වන බව පහදා දීම.
- සමාජයේ උසස් යැයි සම්මත වෘත්තීන්වල නියැලෙන්නන් සඳහා සමාජය විසින්ම නිර්මාණය කර ඇති වටිනාකම් හේතුවෙන් සෙසු වෘත්තීන්වල නියැලෙන්නන්හට නිර්මාණය වන අවම වටිනාකම් සාධාරණීය නොවන බව සිසුන්ට පහදා දීම.
- ඒඩ්ස් වැනි රෝග තත්ත්වයන් පුද්ගලයන්ට බෝ වන ආකාරය පිළිබඳව සිසුන් තුළ පවතින දුර්මත ඉවත් කිරීම උදා - ඒඩ්ස් රෝගය වැරදි ලිංගික හැසිරීම්වලින් පමණක්ම බෝ නොවෙන බව සිසුන්ට අවබෝධ කරලීම. එවැනි රෝගයක්, නිවැරදිව සිදු නොකරන රුධිර පාරවිලනයකින් පවා බෝ විය හැකි බව සිසුන්ට පෙන්වාදීම. එසේම සමලිංගිකත්වය යනු උපතින්ම ජාන අනුව ඇතිවන තත්වයක් බව සිසුන්ට අවබෝධ කරලීම. ඒ අනුව එවැනි හැසිරීමක් ප්‍රකට කරනු ලබන පුද්ගලයන් කොන් කිරීමෙන් වැළකී ඔවුන්ට සමාජයීය වශයෙන් වටිනාකමක් ලබා දිය යුතු බව සිසුන්ට පහදා දීම.
- ආකල්ප ගොඩ නැගීමේදී ඒ ඒ පුද්ගලයන් පිළිබඳව සිසුන් හොඳ යැයි විශ්වාස කරන ගුණාංගවලට හෝ ආකල්පයන්ට පමණක් වටිනාකමක් ලබා නොදී සියල්ලන් පිළිබඳව පොදු මනුෂ්‍යත්වයෙන් සිතීමෙන් බොහෝ ආරවුල් පහසුවෙන් නිරවුල් කිරීමට හැකි බව.
- පුද්ගල මතවාද ජයග්‍රහණය කිරීම සඳහා තර්ක ගොඩ නගන බවත් ඒ තර්ක වෙනුවෙන්, තර්කවලට පක්ෂපාතී  අදහස් ගොඩ නගන බවත් පෙන්වා දීම.
- කණ්ඩායමක් තුළ තර්ක ජයග්‍රහණය පහසු වන ආකාරය, කණ්ඩායමේ ජයග්‍රහණය වෙනුවෙන් පුද්ගලයන් පෙනී සිටින ආකාරය, තර්ක හෝ මතවාද පරාජය වන අවස්ථාවන්වල ගැටුම් නිර්මාණය වන ආකාරය සිසුන්ට අවබෝධ කරවීම.
- සමාජයේ සෙසු පිරිස හා ගැටුම් ඇති වීමට පුද්ගල ආකල්ප ඇති කරනු ලබන බලපෑම සිසුන්ට පෙන්වා දීම.
- ජාත්‍යන්තර රෝහලක වෛද්‍යවරුන් සේ සිතා කටයුතු කරන්න යැයි පැවසුව ද තීන්දු තිරණ ගැනීමේදී, මතවාදයන් පිළිබඳ කථා බහේදී අපගේ සුපුරුදු චර්යාවන් ඉස්මතු වන ආකාරය සිසුන්ට පෙන්වා දීම.

**ඉගෙනුම් කරුණු :-**

- කණ්ඩායම් හා පුද්ගලයන් අතර අනවශ්‍ය ආරවුල් ඇතිවන ආකාරය පැහැදිලි කිරීම.
- තේරීම නිසා කණ්ඩායම් තුළ ගැටළු ඇති වන බව පෙන්වීම.
- ජාති ආගම් පිළිබඳ ආකල්ප නිසා මිනිසුන් ආරවුල් ඇති කර ගන්නා අකාරය පෙන්වා දීම.
- එයට හේතු වන කරුණු සහ පුද්ගල ආකල්ප ගොඩ නැගෙන ආකාරය සිසුන්ට අවබෝධ කර දීම. (රූප සටහන 05 ඇසුරින්)
- ක්‍රියාව වෙනස් කිරීම වෙනුවට ආකල්ප වෙනස් කල යුතු බව පෙන්වා දීම.
- එවැනි ආරවුලක් සහිත අවස්ථාවකදී අප සහාය විය යුතු ආකාරය, මෙන්ම එවැනි ආරවුලක් ඇති නොවන ලෙස අප කටයුතු කල යුතු ආකාරය පහදා දීම.
- පුද්ගල ආකල්ප වෙනස් වීමට හේතු වන කරුණු පහත රූප සටහන ඇසුරින් පහදා දීම.




*රූප සටහන 5 - පුද්ගල ආකල්ප ගොඩ නැගෙන ආකාරය*

**ගැටුම් කළමනාකරණය :-**

ගැටුමක් ඇති වූ අවස්ථාවක එය නිරවුල් කර ගැනීම සඳහා විවිධ ක්‍රම යොදා ගත හැක. ආරවුලේ තීව්‍රතාවය සහ එය පුද්ගලයාට ඇති කරන බලපෑම අනුව විවිධ පුද්ගලයන් ගැටුම් අවස්ථාවලදී ඉන් මිදීමට ගන්නා තීන්දු තීරණ විවිධාකාර වේ.

ඒ අනුව ගැටුමක් සහිත පුද්ගලයෙකුට ඉන් මිදීමට සහයවීම, යහපත් තුන්වන පාර්ශවයක වගකීමයි. මැදිහත්කරුවා සහ ගැටුම් පාර්ශවකරුවන් එකිනෙකාව හොඳින් අවබෝධ කර ගැනීම තුළින් යහපත් ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා හොඳින් සහාය විය හැකි වේ. සමථකරුවකු වශයෙන් ඔබගේ වගකීම වන්නේ ද එයයි.

සමථකරණ ක්‍රියාවලියේදී පාර්ශවකරුවන් ආරවුලට මුහුණ දෙන ආකාරය ගැන සමථකරු ඉක්මනින් තක්සේරු කරගැනීම වැදගත් වේ. ඔහු හෝ ඇය **තරඟකාරීද? අනෙක් අයට ඉඩ දෙනවාද? ගැටළු මඟ හරිනවාද? සාකච්ඡා කරුවකු වශයෙන් සම්බන්ධ කර ගත හැකිද?** යන්න අවබෝධ කර ගත යුතුය. ඒ අනුව ස්ථිරසාර විසඳුමක් කරා පාර්ශවකරුවන් ගෙන යාමට නම් ගැටළු මඟහැරයන්නන් සාකච්ඡාවට එක්කර ගැනීමට සහ තරඟකාරීත්වයෙන් සිටින අය ඉන් මුදවා සාකච්ඡාවට සම්බන්ධ කරගැනීමට මැදිහත්කරුවකු වශයෙන් ඔබ දක්ෂ විය යුතුය.

## ක්‍රියාකාරකම 2.5: තෝමස් කිල්මන් අභ්‍යාසය

**අවශ්‍ය ද්‍රව්‍ය :-**

- තරඟය, සාකච්ඡාව, අතරමැදි විසඳුම, මගහැරීම, ඉවත් වීම ආදී ලෙස සටහන් කල කාඩ් පත්
- සෙලෝ ටේප්

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. කාඩ් බිම අලවා තිබීම.
2. ඒ ඒ කාඩ් පත මගින් ප්‍රකාශ කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර දීම.
3. ගැටුම් ඇති වන අවස්ථාවන් කිහිපයක් පවසා ඒ ඒ අවස්ථාවන්වලදී සිසුන්ට තමන් ගන්නා තීරණය සඳහන් කාඩ් මතට පැමිණීමට උපදෙස් දීම.

ගැටුම් අවස්ථාවන් සඳහා නිදසුන් :-


- ප්‍රධාන ශිෂ්‍ය නායකයා වීමට තමන්ට සුදුසුකම් තිබෙන නිසා බොහෝ බලාපොරොත්තු තබාගෙන සිටිය දී එම තනතුර වෙනත් අඩු සුදුසුකම් සහිත ශිෂ්‍යයකු හට ලබා දීමට සැරසෙන්නේ යැයි අසන්නට ලැබීම.
- රු 20 ක වටිනාකමක් සහිත ගමනාන්තයකට රු 1000 නෝට්ටුවක් දීම නිසා මාරු කාසි නොදුන්නැයි ප්‍රකාශ කරමින් බසයේ කොන්දොස්තර මහතා පිරිසක් ඉදිරියේ බසයේදී තදින් බැන වැදීම.
- වෙනත් ආගමක යැයි පවසා පාසලේ සිසුන් තමන්ගේ සහෝදර ශිෂ්‍යයකුට අවමන් කිරීම.
- තමාගේ හොඳම මිතුරාට පිරිසක් මහ මගදී පහර දීම, තමන් පමණක් ඒ අවස්ථාවේදී එතැන සිටීම සහ උදවුවට කෙනෙක් නොසිටීම.

4. එක් එක් අවස්ථාව බැගින් ගෙන ඒ පිළිබඳව පැහැදිලි කර එවැනි ගැටුම් අවස්ථාවකට මුහුණ දුන්නේ නම් තමන් ගන්නා තීන්දුව සහිත ස්ථානයට (බිම අලවා ඇති කාඩ් පත අසලට) පැමිණීමට සිසුන්ට උපදෙස් ලබා දීම.
5. එකම ස්ථානයක සිටින සිසුන් එම ස්ථානයට පැමිණීමට හේතු වූ කරුණු පිළිබඳව ඔවුන් සමග සාකච්ඡා කිරීම.
6. නැවත වෙනත් ගැටුම් අවස්ථාවක් ලබා දී සිසුන් එහිදී තමන් තෝරා ගන්නා ස්ථානයට යන ලෙස පැවසීම සහ එම තීරණය ගැනීමට හේතු වූ කරුණු සාකච්ඡා කිරීම.
7. ඉහත ගැටුම් අවස්ථාවන් සියල්ලම අවසන් වනතුරු සිසුන් සමඟ ක්‍රියාකාරකම සිදු කිරීම.

**ඉගෙනුම් කරුණු :-**

- විවිධ ආරවුල්වල දී විවිධ පුද්ගලයන් ගන්නා ක්‍රියාමාර්ග වෙනස් වන බව පැහැදිලි කිරීම.
- එකම ආරවුලකදි විවිධ පුද්ගලයන් ගන්නා ක්‍රියාමාර්ග වෙනස් බව පෙන්වා දීම.
- තනි පුද්ගලයෙක් ගත් විට විවිධ ආරවුල්වල දී හැසිරෙන ආකාරය වෙනස් බව පෙන්වා දීම.
- ආරවුල එක් එක් පුද්ගලයාට දැනෙන ප්‍රමාණය වෙනස් බව පෙන්වා දීම.
- ආරවුල ඇති වන ස්ථානය මත එයට දක්වන ප්‍රතිචාර වෙනස් වන බව සිසුන්ට ඒත්තු ගැන්වීම.
- ආරවුල සමාන වුවත් අවස්ථාවන් අනුව ගන්නා ක්‍රියාමාර්ග වෙනස් වන බව පෙන්වීම.
- ගැටළුවකට ඇත්තේ එකම විසඳුමක් නොවන බව පෙන්වීම.

සහයෝගයෙන් කටයුතු කිරීමට අප දක්වන කැමැත්තට සාපේක්ෂව අපගේ ස්ථිරභාවය මැනීමෙන් ගැටුම් සම්බන්ධව කටයුතු කරන ආකාරය තීරණය කල හැකි බව 1977 දී කෙනත් ඩබ්ලිව් තෝමස් සහ රැල්ෆ් එච්. කිල්මන් සොයාගෙන ඇත. ගැටුමකදි ගන්නා විවිධ ප්‍රවේශයන් අවබෝධ කර ගැනීමට පහත රූප සටහන අපට උපකාරී වේ.




*රූප සටහන 6: තෝමස් කිල්මන් ගැටුම් නිරාකරණ ක්‍රම*

**කොටුව ඇ: කෙනත් ඩබ්ලිව්. තෝමස් සහ රැල්ෆ් එච්. කිල්මන් විසින් ඉදිරිපත් කරන ගැටුම් කළමනාකරණ න්‍යාය**

තෝමස් සහ කිල්මන් විසින් වෙනස්කම් කළමනාකරණය කිරීමේ මෙවලමක් (Management-of-Differences Exercise - MODE) ඉදිරිපත් කර ඇති අතර, එය, එයටම අදාළ ධනාත්මක හා ඍණාත්මක ගුණාංග සහිත අන්තර් පුද්ගල ගැටුම්වලට මුහුණදෙන ප්‍රවේශයන් පහක මිනුමකි, ඒවානම් - තරගකාරීත්වය, සහයෝගයෙන් කටයුතු කිරීම (සාකච්ඡාව), සම්මුතිවාදය (අතරමැදි විසඳුම), මගහැරීම සහ අනෙක් අයට ඉඩ ලබාදී කටයුතු කිරීමයි.

*(මූලාශ්‍රය : කිල්මන්, ආර්. එච්. සහ කේ. ඩබ්ලිව්. තෝමස්. 1977. යොමු කරන ලද - තෝරා ගැනීමේ ගැටුම්-හැසිරවීමේ චර්යාවට මිනුමක් වර්ධනය කිරීම. වෙනස්කම් කළමනාකරණය කිරීමේ මෙවලම. අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක මිනුම)*

## ක්‍රියාකාරකම 2.6. ගැටුම හා සාමය

**අවශ්‍ය ද්‍රව්‍ය :-**

- පාට ඩිමයි කණ්ඩායම්වලට ගැලපෙන පරිදි
- විවිධ පාටින් යුක්ත මාකර් හෝ ප්ලැටිග්නම්

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :**

**පළමු අවස්ථාව:**

- සිසුන් කණ්ඩායම් 04 කට බෙදා ගැටුම් පිළිබඳව විස්තර කෙරෙන පුවත් පත් දැන්වීමක් නිර්මාණය කිරීමට උපදෙස් ලබාදීම.
- එම දැන්වීම කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීම.
- දැන්වීමෙන් ප්‍රකාශ වන අයුරින්, ඔවුන් කුමන කරුණක් හේතුවෙන් ආරවුල් ඇති කර ගන්නේද, ඒ සඳහා ගැටුම් ඇති කර ගැනීම වෙනුවට වෙනත් විකල්ප පවතින්නේද යන්න කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීම.
- පසුව කණ්ඩායම තුළ සාකච්ඡා කල කරුණු සියල්ලන්ට ඉදිරිපත් කිරීම.

දෙවන අවස්ථාව :-

පළමුව නිර්මාණය කල පුවත්පත් දැන්වීම ප්‍රචණ්ඩකාරිබව අවම වන අන්දමින් පණිවිඩය සමාජගත කල හැකි ආකාරයෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාවක් ලබා දීම. (ගැටුම ආකර්ෂණීය සමාජ පණිවිඩයක් නොවන ආකාරයෙන්)

ඉගෙනුම් කරුණු :-

- ගැටුම පිළිබඳව මාධ්‍ය භාවිතය තුළින් සමාජයට ඇති කරන බලපෑම පිළිබඳව අවබෝධයක් ලබා දීම.
- ගැටුම වෙනුවට ආරවුල් නිරාකරණයට ඇති වෙනත් විකල්ප පිළිබඳව සිසුන්ගේ අවධානය ඇති කිරීම.
- සිසුන්ගේ නිර්මාණශීලි බව ඇති කිරීම.

## පෙර දින අභ්‍යාස ඉදිරිපත් කිරීම.

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :

- නිවැසි ක්‍රියාකාරකම් අගය කිරීම.
- වැරදි අවස්ථාවන් නිවැරදි කිරීම.
- සිසුන් ප්‍රශ්න ඇසීමට උනන්දු කරවීම.
- සංකල්පය තේරුම් ගැනීම විමසුමට ලක් කිරීම.

## සන්නිවේදනය හැඳින්වීම.

සන්නිවේදනය යනු කිසියම් අදහසක් ප්‍රකාශ කිරීමට කරනු ලබන ඕනෑම හැසිරීමක් ලෙසින් සරලව හැඳින්විය හැක. ඒ අනුව පුද්ගලයා ස්වකීය අදහස් තවත් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට දැන්වීමේ දී සන්නිවේදනය යොදා ගනු ලබයි. එය වාචික, අවාචික, ලිඛිත, සංඥා සංකේත වැනි ආකාරවලින් හඳුනා ගත හැක. මානව පරිණාමයට සාපේක්ෂව සන්නිවේදනය ද පරිණාමය වී ඇත. ඒ අනුව රූපාක්ෂරවල සිට වර්තමානය වන විට චන්ද්‍රිකා තාක්ෂණය දක්වා සන්නිවේදනය දියුණුවට පත්ව ඇත.

## ක්‍රියාකාරකම 2.7. සමථකරණයේදී සන්නිවේදනයේ වැදගත්කම

සන්නිවේදනය පිළිබඳව නිර්වචනයක් ගොඩ නැගීම.

අවශ්‍ය ද්‍රව්‍ය :-

- පාට ඩිමයි කොළ
- පාට කිහිපයක මාකර්

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :

- සිසුන් කණ්ඩායම් 5 ට බෙදීම.
- කණ්ඩායමේ සියල්ලන් සාකච්ඡා කර නිර්වචනයක් ඉදිරිපත් කලයුතු වීම.
- කණ්ඩායමේ නිර්වචනය ඩිමයි කොළයක පැහැදිලිව ලියා කණ්ඩායම වෙනුවෙන් එක් අයෙක් එය ඉදිරිපත් කල යුතු වීම. මුල් අවස්ථාවල ඉදිරිපත් කිරීම් සිදු කල සිසුන් වෙනුවට වෙනත් සිසුන්ට කණ්ඩායම නියෝජනය කිරීමට අවස්ථාව ලබා දීම.
- නිර්වචනය සකස් කිරීමට විනාඩි 10 ක කාලයක් ලබා දීම.

- ඒ ඒ කණ්ඩායම්වල නිර්වචනයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.
- ඉදිරිපත් කරන්නන් අගය කිරීම හා නිර්වචනය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.

අවබෝධයට කරුණු :-

1. පහත කරුණු පිළිබඳව සිසුන් සමග කතිකාවතක් ගොඩ නගා ගත යුතුය.

   - **සන්නිවේදන විකාශනය පිළිබඳව සාකච්ඡා කිරීම.**

     සන්නිවේදනය අතීතයේ සිට වර්තමානය දක්වා විකාශනය වන ආකාරය, ඒ අනුව රූපාක්ෂරවල සිට අකුරු සොයා ගැනීම, විවිධ සන්නිවේදන ක්‍රම (දුම් ගැසීම, සතුන් යොදා ගැනීම, දූන්නෙන් විදීම, අණ බෙර ගැසීම, සංඥා සංකේත යොදා ගැනීම ආදියෙන් පසු ලියුම්, දුරකථනය, අන්තර්ජාලය දක්වා විකාශනය වූ ආකාරය) පිළිබඳව පැහැදිලි කිරීම.

   - **සන්නිවේදනය කොටස් වන ආකාරය පැහැදිලි කිරීම**

     වාචික අවාචික වශයෙන් කොටස් වන ආකාරය හා එය භාවිතයට ගන්නා අවස්ථාවන්

     අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

     පුද්ගලාන්තර සන්නිවේදනය

     සමූහ සන්නිවේදනය

     ජන සන්නිවේදනය


     විශ්ව සන්නිවේදනය ආදී වශයෙන් කොටස් වන ආකාරය

     තිරස් හා සිරස් සන්නිවේදනය යනු කුමක් දැයි පැහැදිලි කිරීම.

   - සන්නිවේදන ගැලීම් චක්‍රය පැහැදිලි කිරීම

**ඒක රේඛීය සන්නිවේදනය**

සන්නිවේදනයේදී අදහසක් එක් පුද්ගලයෙකුගේ සිට තවත් පුද්ගලයකු දක්වා ගමන් කිරීම ආකාර දෙකකින් හඳුනා ගත හැක. ඒ අනුව ඒක-රේඛීය සන්නිවේදනය ලෙසින් හඳුන්වන්නේ සන්නිවේදකයා විසින් කිසියම් මාධ්‍යයක් ඇසුරු කර ගනිමින් ග්‍රාහකයා වෙත පණිවිඩයක් ලබා දෙන අවස්ථාවයි. එහිදී සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ප්‍රතිපෝෂණයක් සිදු නොවන අතර ඒ හේතුවෙන් ගැටුම් නිරාකරණයේදී භාවිතා කල හැකි සාර්ථක ක්‍රමවේදයක් ලෙස ඒක-රේඛීය සන්නිවේදනය හැඳින්විය නොහැක .





*රූප සටහන 7: සන්නිවේදන ගැලීම් චක්‍රය*

**චක්‍රීය සන්නිවේදනය**

චක්‍රීය සන්නිවේදනය ලෙසින් හඳුන්වන්නේ සන්නිවේදකයකු විසින් කිසියම් මාධ්‍යයක් උපයෝගි කර ගනිමින් කිසියම් පණිවිඩයක් ග්‍රාහකයා වෙත ලබා දීමේදී සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ප්‍රතිපෝෂණයක් සිදු වන අවස්ථාවයි. ඒ අනුව පණිවිඩය නිසි අයුරින් ග්‍රාහකයා ලබා

ගත්තේද, නැතිද යන්න පිළිබඳ අවබෝධය සන්නිවේදකයාට ලබා ගැනීමට මෙමඟින් හැකියාව ලැබේ. ඒ හේතුවෙන් මෙවැනි සන්නිවේදන රටාවක් අපට සමථකරණ ක්‍රියාවලියේදී භාවිතයට ගත හැක.




*රූප සටහන 8 සන්නිවේදන චක්‍රය*

2. සමථකරණයේදී සන්නිවේදනය භාවිතයට ගන්නා අකාරය පහත ලැයිස්තු ගත කර ඇති කරුණු ඇසුරින් පැහැදිලි කල යුතුය.
    - සමථකරණයේදී සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කිරීම.
    - ආරවුල් ඇති වීමට දුබල සන්නිවේදනය හේතු වීම.
    - ආරවුල් ඇති බව සෙසු පුද්ගලයන් හඳුනාගන්නේ ආරවුල් කරුවන් අතර ඇති සන්නිවේදනය හේතුවෙනි.
    - සමථකරණයේදී ආරවුල් නිරවුල් කර ගැනීමට සන්නිවේදනය උපයෝගි කර ගැනීම.

## අවාචික සන්නිවේදනයේ ප්‍රායෝගික භාවිතය.

### ක්‍රියාකාරකම 2.8. - උපන් දිනයට පෙළ ගැසීම.

#### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. සිසුන් සියලු දෙනාටම නැගිට සිටීමට පැවසීම.
2. තමා උපන් වර්ෂය නොසලකා උපන් මාසය හා දිනයට අනුව පමණක් ජනවාරි සිට දෙසැම්බර් දක්වා පේළියක් සෑදීමට අවශ්‍ය බව පැහැදිලි කිරීම.
3. ක්‍රියාකාරකම අතරතුර කිසිවෙකුට කථා කල නොහැකි බවත් අතින් හෝ පෑනකින් හෝ දිනය හා මාසය ඇඳ පෙන්විය නොහැකි බවත්, දින දර්ශන, හැඳුනුම්පත් ආදිය මගින් උපන් දිනය පෙන්විය නොහැකි බවටත් කොන්දේසි ලබා දීම.
4. වෙනත් ඕනෑම ක්‍රමයක් යොදා ගනිමින් තමන්ගේ උපන් දිනය සෙසු සිසුන්ට ප්‍රකාශ කර තනි පේළියක් සෑදිය යුතු බව පැවසීම.
5. පේළිය සෑදීම සඳහා විනාඩි 10 ක කාලයක් ලබා දීම.
6. පේළිය සාදා අවසන් වූ පසු අනුපිළිවෙලට සිසුන්ගෙන් උපන් මාසය හා දිනය අසන්න.

7. පේළිය වරද්දන සිසුන්ට යම් ඉදිරිපත් කිරීමකට අවස්ථාවක් ලබා දීම.
8. නිවැරදිව පේළිය සෑදුවේ නම් සිසුන් අගය කිරීම.

**ඉගෙනුම් කරුණු :-**

- උපක්‍රමශීලිබව වැදගත් වන අවස්ථාවන් හඳුන්වා දීම.
- සහයෝගය තුළින් අරමුණු ඉටු කර ගැනීම පහසු වන බව.
- අවාචික සන්නිවේදනයේ ප්‍රායෝගික භාවිතය පෙන්වා දීම.
- වාචික සන්නිවේදනය මෙන්ම අවාචික සන්නිවේදනය ද වැදගත් බව
- නිර්මාණශීලීබව
- අභියෝග ජය ගැනීම
- අවාචික සන්නිවේදනයේදී ඇති වන බාධාවන් හඳුනා ගැනීම.
- සන්නිවේදනයේ බාධාවන් පැන නගින අවස්ථාවන්වලදී එය කළමනාකරණයට විසඳුම් පවතින බව සිසුන්ට අවබෝධ කරවීම.

## සන්නිවේදන බාධක හැඳින්වීම.

### ක්‍රියාකාරකම 2.9. රහසක් කීම.

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. සමාන උච්ඡාරණයක් එන දිගු වාක්‍යයක් පිරිස අතර සන්නිවේදනය කරවීම.
2. මුලින්ම කැමැත්තෙන් ඉදිරිපත් වන එක් සිසුවෙකුට පමණක් අදාළ වාක්‍යය ලබා දීම.
3. ඔහු හෝ ඇය මගින් පිළිවෙලට එකිනෙකා හරහා පණිවිඩය ගලා යාමට සැලැස්වීම.
4. අවසානයට පණිවිඩය ලැබුණු සිසුවාට සියළුන්ටම ඇසෙන පරිදි තමන්ට ලැබුණු පණිවිඩය කීමට අවස්ථාව ලබා දීම.
5. අවසානයේ, මුලින්ම පණිවිඩය ලබා දුන් සිසුවාට එය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.
6. පණිවිඩය වෙනස් වී ඇති ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.
7. එසේ වෙනස් වීමට හේතු හඳුනා ගැනීම.

**ඉගෙනුම් කරුණු :-**

- සන්නිවේදන බාධක ඇති වන ආකාරය ප්‍රායෝගිකව පෙන්වීම.
- පිරිසක් තුළ සන්නිවේදනයේදී අර්ථය වෙනස් වන බව හා අර්ථය අඩු වැඩි වීම් සිද්ධ වන බව.
- තාක්ෂණික, පාරිසරික, සංස්කෘතික, ආගමික, ජාතීන් අතර භාෂා වෙනස්කම් මගින් තොරතුරු වෙනස් වන බව පැහැදිලි කිරීම.
- ප්‍රායෝගිකව සිසුන්ට සන්නිවේදන බාධාවන් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම.
- විනෝදය සමගින් ඉගෙනුම් අවස්ථාවන් ලබා දීම.

## සන්නිවේදන ශිල්ප ක්‍රම

යම් ක්‍රියාකාරකමක් ප්‍රායෝගිකව භාවිතා කිරීමට උපකාරි වන දැනුම හා හැකියාව ශිල්ප ක්‍රමයක් ලෙසින් හඳුන්වනු ලබයි. ඒ අනුව සන්නිවේදනය මනාව හැසිරවීමට අවශ්‍ය වන උපාංග සන්නිවේදන ශිල්ප ක්‍රම ලෙසින් හැඳින්විය හැකි අතර මනා දැනුවත්බව හා හසුරු භාවිතය තුළින් එය සංවර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.

### 1. ක්‍රියාකාරී සවන්දීම

කිසියම් පුද්ගලයකු යම් ප්‍රකාශයක් කිරීමේ දී එයට සවන් දෙන පුද්ගලයා බාහිර වැඩ නවත්වමින්, තමාගේ පූර්ණ අවධානය, ප්‍රකාශය කරන තැනැත්තාට ලබා දෙමින් සවන් දීම හා තමා එම ප්‍රකාශයට සවන් දෙන බව ප්‍රතිචාර මගින් ප්‍රකාශය කරන පුද්ගලයාට දැනගැනීමට සැලැස්වීම ක්‍රියාකාරී සවන්දීමේදී වැදගත් වේ. එසේම අවශ්‍ය අවස්ථාවල දී ප්‍රශ්න අසමින් හා වාචික හා අවාචික ප්‍රතිචාර මගින් ප්‍රකාශය කරන තැනැත්තා දිරි ගැන්වීම ද ක්‍රියාකාරී සවන් දීම තුළ අන්තර්ගත විය යුතුය.

## ක්‍රියාකාරකම 2.10. සක්‍රීය සවන්දීමේ ක්‍රියාකාරකම

*(මූලාශ්‍රය : සක්‍රීය සවන්දීම පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 1.2)*
Link: www.values4all.lk/Sinhala/chapter-01/activity-1.2.html

**අවශ්‍ය ද්‍රව්‍ය**

- ටෙනිස් බෝලයක්

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :**

**පළමු අවස්ථාව:**

- කණ්ඩායමේ සියළු දෙනාම කණ්ඩායම් දෙකකට බෙදී වෙන් වෙන්ව පේළි 02 ක් සෑදීම.
- එක් පේළියක සිසුන් තමාගේ ඉදිරියේ සිටින සිසුවා අසලට ගොස් තමන්ට ඉතාමත් තදින් දුකක් හෝ තරහක් දැනුන අවස්ථාවක් ප්‍රකාශ කිරීම.
- එයට සවන් දුන් සිසුවා එම ප්‍රකාශය නැවත පළමු සිසුවාට පෙරළා ඉදිරිපත් කිරීම.
- අවසානයේ සිසුන් නැවත එක් රවුමකට ගෙන ඉහත ප්‍රකාශය ඇසීමේදී හා තේරුම් ගැනීමේදී මෙන්ම නැවත ප්‍රකාශනයේ දී ඇති වූ සාධනීය තත්ත්වයන් මෙන්ම බාධාවන් පිළිබඳව ද සාකච්ඡා කිරීම.

**දෙවන අවස්ථාව :-**

- සිසුන් සියළු දෙනා රවුමට සිට ගැනීම.
- ස්වේච්ඡාවෙන් එක් අයෙක් රවුම මැදට පැමිණීම.
- මැද සිටින සිසුවා අතට බෝලයක් දීම.
- බෝලය අතින් ගෙන රවුම මැද සිටින සිසුවා තමා සංවේදි වූ අවස්ථාවක් රවුම වටේ සිටින පිරිසට හොඳින් ඇසෙන සේ ප්‍රකාශ කිරීම.
- අනතුරුව තමා අතේ ඇති බෝලය කැමති සිසුවකුගේ නම ප්‍රකාශ කර එම සිසුවාට දැමීම.
- බෝලය අල්ලා ගත් සිසුවා තමන් සවන් දුන් ප්‍රකාශය කණ්ඩායම මැදට පැමිණ නැවත ප්‍රකාශ කිරීම.
- පසුව බෝලය වෙනත් සිසුවකුට දැමීම බෝලය අල්ලා ගත් සිසුවා වෙනත් ප්‍රකාශයක් ඉදිරිපත්

කිරීම ආදී වශයෙන් ක්‍රියාකාරකම ඉදිරියට කරගෙන යාම.

අවධානයට:

- ක්‍රියාකාරී සවන්දීමේ දී භාවිතා කරන ශිල්පීය ක්‍රම පිළිබඳව සිසුන්ට අවබෝධය ලබා දීම.
- ඇස් සම්බන්ධතාවය, බාහිර වැඩ නැවැත්වීම, ගැලපෙන ප්‍රශ්න ඇසීම, අවාචික ප්‍රතිචාර ආදිය පිළිබඳ ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබා දීම.
- ක්‍රියාකාරී සවන්දීම හේතුවෙන් ප්‍රකාශය ඉදිරිපත් කරන තැනැත්තාට ඇතිවන සාධනීය තත්ත්වයන් පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.

**2. නැවත ප්‍රකාශය**

ප්‍රකාශයක අන්තර්ගත හැඟීම්, විෂය කරුණු, ස්ථාවරයන් හා උවමනාවන් තේරුම් ගෙන, සිදුවීමට අදාළ විෂය කරුණු සහ හැඟීම් ලේබල් කර කිසිවෙකුගේ සිත රිදීමක් නොවන පරිදි ප්‍රකාශය සිදු කල තැනැත්තාට පෙරළා ප්‍රකාශ කිරීම නැවත ප්‍රකාශයයි.

01. නැවත ප්‍රකාශයේ අරමුණ වන්නේ ඔවුන් කී දේට සවන් දුන් බව, ප්‍රකාශ කල පුද්ගලයාට දැන ගැනීමට සැලැස්වීම.
02. ප්‍රකාශය අසන තැනැත්තා එම පණිවිඩය නිවැරදිව අර්ථකථනය කර ඇති බව ප්‍රකාශ කල තැනැත්තාට දැන ගැනීමට සැලැස්වීම.
03. ප්‍රකාශය කල තැනැත්තාට තමා කල ප්‍රකාශය පිළිබඳ නිරවුල් බවක් ඇති කර ගැනීමට සහය වීම.

**3. පරාවර්තනය**

ප්‍රකාශයක ඇති හැඟීම්, චිත්තවේග නම් කර සවන් දෙන්නා විසින් නැවත ප්‍රකාශ කිරීමයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රකාශය කරන තැනැත්තාට හැඟෙන ආකාරය හා ඔහු සැලකිලිමත් වන දේ ප්‍රකාශය අසන පුද්ගලයා තේරුම්ගත් බව ඔහුට පෙන්නුම් කිරීමයි.

(උදා මේ සිදුවීම නිසා ඔබ ඉන්නේ කලකිරීමකින්, දුකකින්, තරහවකින් ආදී ලෙස ප්‍රකාශ කිරීම)

ආරවුලකදී පාර්ශවකරුවකු ඉදිරිපත් කරන අන්දමේ ප්‍රකාශයක් සිසුන්ට ලබා දී එය පරාවර්තනය කර ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**4. සාරාංශකරණය**

යම් දීර්ඝ ප්‍රකාශයක ඇති හැඟීම්, කරුණු හොඳින් තේරුම් ගෙන වැදගත්ම කරුණු කෙටියෙන්, පැහැදිලිව, සරලව ඉදිරිපත් කිරීම සාරාංශකරණය ලෙසින් හැඳින්වෙන අතර එමගින් සාකච්ඡාව තවදුරටත් පවත්වාගෙන යාම පිළිබඳව පදනමක් සැකසිය හැක.

**5. රාමු කිරීම**

ස්ථාවරයන් තුළින් උවමනාවන් ඉස්මතු වන පරිදි ඍණාත්මක ප්‍රකාශ ධනාත්මක බවට පෙරළමින් සාකච්ඡාවට බාධා වන හිත් රිදෙන ප්‍රකාශ ඉවත් කරමින් අවශ්‍යම කරුණු ප්‍රකාශ කිරීම රාමු කිරීම ලෙසින් හඳුන්වයි.

සිසුනට ප්‍රකාශයක් ලබා දී එය නැවත ප්‍රකාශයට, පරාවර්තනයට හා සාරාංශකරණයට අවස්ථාව ලබා දීම.

උදා :- අද මම ඉස්කෝලේ එනකොට අපේ පාරේ බස් එක තිබ්බේ නෑ. හුඟාක් දුර පයින් ඇවිත් තමා එහා ගමේ ඉඳලා එන බස් එක අල්ලා ගත්තේ. ඒකෙත් හොඳටම සෙනඟ. බෑග් එක බස් එක අස්සේ

හිර කරනවා අනිත් අයට ඉඩ නෑ කියලා කොන්දොස්තරත් මට බැන්නා. බස් එකේ සෙනඟත් මං දිහා බැලුවා. ලැජ්ජාවෙත් බෑ. ඒ මදිවට අද එසෙම්බ්ලි එකනේ, මම අද කථාවක් කරන්නත් හිටියේ රැස්වීමේ. මම හොඳටම බය වෙලා හිටියේ, වෙලාවට එන්න බැරිවෙයි කියලා. මම ඉස්කෝලෙ ළඟින් බස් එක නවත්තපු ගමන් දුවගෙන ආවේ රැස්වීමට යන්න. එතකොට තමා මේ සුදේශ් බූරුවෙක් වගේ ඇවිත් මගේ ඇගේ හැප්පුනේ. මේ බලන්න මේ මෝඩයා හැප්පිලා මම වැටුණා. ඇඳුමේ මඩත් එක්ක මට යාළුවොත් විහිළු කළා මඩ කනයා වගේ ඉස්කෝලේ ආවා කියලා.

***නැවත ප්‍රකාශය, පරාවර්තනය හා සාරාංශකරණය***

*සුපුන් කියන්නේ, සුපුන් අද ඉස්කෝලේ එනකොට බස් එක තිබ්බේ නෑ. ඒ නිසා අමාරුවෙන් තමා ඉස්කෝලෙට ආවේ. ඒ එනකොට අතර මඟදී වුණ සිදුවීමකින් වැටිලා ඇඳුමේ මඩ ගෑවුණා කියලා නේද? ඒ නිසා ඔයා අපහසුතාවයට පත් වුණා කියලා නේද?*

**6. ප්‍රශ්න වර්ග හඳුනා ගැනීම**

**විවෘතාන්ත ප්‍රශ්න**

විස්තරාත්මකව තොරතුරු වැඩි ප්‍රමාණයක් ලබා ගත හැකි ප්‍රශ්න මෙයට අයත්ය.

උදා :- **කුමක්ද? කොහේද? කවදාදා? කවුද? කෙසේද?**

**සංවෘත ප්‍රශ්න**

ඔව්, නෑ, වැනි කෙටි පිළිතුරු ලැබෙන සංවෘත ප්‍රශ්න අවශ්‍යම අවස්ථාවන්වලදී පමණක් භාවිතා කිරීම.

**තත්කාලීන ප්‍රශ්න**

අතීතයේ ඇති වූ සිදුවීමක් හේතුවෙන් ඇති වූ ගැටුමකට වර්තමානයේ විසඳුම් සොයන අවස්ථාවක, අතීතයේ එම ගැටුම ඇති වීමට බලපෑ මානසික තත්ත්වයන් පිළිබඳව වර්මානයට ආදේශ කර ගනිමින් ප්‍රශ්න කිරීම.

උදා :- **එදා වූ සිදුවීම සම්බන්ධයෙන් අද මේ මොහොතේ දී ඔබට සිතෙන්නේ කුමක්ද ?**

**ගැටුම් නිරාකරණයේදී ඵලදායී සාකච්ඡාවක් තුළ ප්‍රශ්න ඇසීම වැදගත් වන ආකාරය.**

විවිධ ප්‍රශ්න යොදා ගනිමින් ප්‍රායෝගිකව තොරතුරු වැඩි ප්‍රමාණයක් දැන ගැනීමට මෙන්ම සාකච්ඡාවේ ගමන් මඟ වෙනස් කිරීමට ප්‍රශ්න ඇසීම යොදා ගත හැකි අතර එය සාකච්ඡාවක් තුළ භාවිතා කරන ආකාරය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබා දිය යුතුය.


**7. "මම" පණිවිඩය**

කිසියම් වැරදි දෙයක් කරන පුද්ගලයෙකුට එම පුද්ගලයාගේ සිත නොරිදෙන පරිදි එම වැරැද්ද පෙන්වා දීම හා එය දිගින් දිගටම සිදු කලහොත් ඉන් ඇතිවන හානිදායක තත්ත්වය මෙන්ම එය නොකර සිටීමෙන් අත්වන ප්‍රතිලාභ පෙන්වා දීම මගින් එම වැරදි ක්‍රියාව කිරීමේ හෝ නොකර සිටීමේ වගකීම එම පුද්ගලයා සතු වන බව පෙන්වා දීමට "මම" පණිවිඩ භාවිතා කරනු ලබයි. මම පණිවිඩයක් විධානයක් ලෙස සැලකිය නොහැක.

- මම පණිවිඩයක හා විධානයක ඇති වෙනස සිසුන්ට පැහැදිලි කිරීම.

**විධානය (චෝදනාව)**

මධූෂ ඔයා පන්තියේ නිතරම කෑ ගහනවා. අපට හරිම කරදරයි. ආයම කෑ ගැහුවොත් අපි ප්‍රින්සිපල්




සර්ට ගිහින් කියනවා. අපට වැඩක් කර ගන්නත් නෑ.

**මම ප්‍රකාශය :-**

## ක්‍රියාකාරකම

- අහඹු ලෙස සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- එක් සිසුවකු විසින් අනෙත් සිසුවාට පළමු අවස්ථාවේ ඔහු කරන යම් වැරදි හැසිරීමක් උපකල්පනය කර එය විධානයක් ලෙස ප්‍රකාශ කල යුතුය.
- දෙවන අවස්ථාවේදී එම ප්‍රකාශයම මම පණිවිඩයක් ලෙස ඉදිරිපත් කල යුතුය.
- මෙහිදී පුහුණුකරු විසින් එක් එක් සිසුන් ඉදිරිපත් කරන ප්‍රකාශ පිළිබඳ පූර්ණ අවධානය යොමු කර ඔවුන්ගේ ප්‍රකාශයන් හි අඩු පාඩු ඇත්නම් නිවැරදි කල යුතුය.
- සිසුන් සියළු දෙනාටම තම ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

### ක්‍රියාකාරම සඳහා උපදෙස් :-

පහත දැක්වෙන විධාන ප්‍රකාශය සඳහා මම පණිවිඩය භාවිතා කිරීම සඳහා භූමිකාවක් ඉටුකරන ලෙස ඉල්ලා සිටීම.

**විධානය (හෝ චෝදනාව) :**

*"සමන් ඔයා කවදාවත් පන්තිය අතුගාන දවසට උදෙන්ම එන්නේ නෑ. හෙට උදෙන්ම පන්තිය අතුගාන්න ආවේ නැත්නම් මම පන්ති භාර ගුරුතුමියට කියලා දඬුවම් කරවනවා."*

සිසුන්ගෙන් අපේක්ෂිත 'මම' පණිවිඩය :-

*"සමන් හෙට පන්තිය අතු ගාන දවස. ඔයා හෙට පන්තිය අතු ගාන්න ආවොත් අපිට ඉක්මනටම පන්තිය අතු ගාන්නත් පුළුවන්. මම කැමතියි ඔයා හෙට උදෙන්ම පන්තිය අතු ගාන්න එනවනම්."*

## අනුමාන කිරීම්

### ක්‍රියාකාරකම 2.12. - මල් ඉත්ත

අවශ්‍ය ද්‍රව්‍යඃ

- සුදු ඩිමයි
- පාට මාකර්

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. සුදු ඩිමයි කොළය මත මල් ඉත්තක් ඇඳ එය කුමක්දැයි සිසුන් එකිනෙකාගෙන් විමසීම.
2. අවසානයේ පුහුණුකරු මල් ඉත්ත යම් සංකල්පයක් ප්‍රකාශ කිරීමක් බව පැවසීම.

   උදා :-

   මල් - සමථ ඒකකයේ සිසුන්

   කොළ - පාසලේ ගුරුවරුන්

   පෝච්චිය - පුහුණු කරුවන් පාසල් සමථ ඒකකය පවත්වා ගැනීමට ලබා දෙන සහයෝගය

අවධානයට :-

- අනුමාන කිරීම් සැම විටම නිවැරදි නොවන බව හා ගැටළුවක දී අනුමාන කිරීම් ඇසුරින් තීන්දු තීරණ ගැනිමේ දී ගැටුම්කාරී අවස්ථාවන් නිසි අයුරින් නොවිසඳෙන බව.

ඉගෙනුම් කරුණු :-


- අනුමාන කිරීම් අත්දැකීම් මත පදනම් වන බව.
- අනුමාන කිරීම් සැම අවස්ථාවකදීම නිවැරදි නොවන බව.
- සිදුවීම කුමක්දැයි දැන ගැනීමට අනුමාන නොකර අදාළ පුද්ගලයාගෙන්ම විමසිය යුතු බව.
- ගැටුම් අවස්ථාවන්හි දී එයට හේතුව අනුමාන කිරීමට පුද්ගලයන් පෙළඹෙන බවත් එය සැම අවස්ථාවකදීම නිවැරදි නොවන බවත් එයට මුල් වූ සැබෑ හේතුව දැන ගැනීමට අදාළ පුද්ගලයාගෙන්ම විමසීම වැදගත් වන බවත් සිසුන්ට පෙන්වා දීම.

## සන්නිවේදනය සීමා.

### ක්‍රියාකාරකම 2.13. - ගණිතමය චිත්‍රය ඇඳීම

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. කැමති ශිෂ්‍යයකුට ඉදිරියට පැමිණීමට ආරාධනා කර ඔහුට යම් රූපයක් පෙන්වීම.
2. ගණිතමය සංකල්ප වලින් පමණක් (අංග චලනවලින් තොරව) එම රූපය විස්තර කොට සෙසු සිසුන් ලවා එය ඇන්දවිය යුතු බවට උපදෙස් දීම.
3. පහත ආකාරයේ රූපයක් උදාහරණයක් ලෙස යොදා ගත හැක.



**ඉගෙනුම් කරුණු :-**

- සන්නිවේදනය සීමා වීමේදී තොරතුරු ප්‍රකාශ කිරීමට බාධාවන් සිදු වන බව හා ඒ හේතුවෙන් පණිවිඩය නිවැරදිව තේරුම් ගැනීමට නොහැකි වන බව.
- තොරතුරු ප්‍රකාශනයේ දී අවාචික සන්නිවේදනය ද වැදගත් වන බව.
- නිසි තොරතුරු නොලැබීමෙන් පණිවිඩය විකෘති වන බව.
- සෑම අවස්ථාවකදීම සන්නිවේදකයා හා ග්‍රාහකයා මනා අන්තර් සබඳතාවක් පවත්වා ගැනීමෙන් නිවැරදිව තොරතුරු ලබා ගත හැකි බව.
- ගැටුම් නිරාකරණයේ දී නිවැරදි තොරතුරු නොලැබීමෙන් ඇති වන හානිදායක තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීම.

## වැඩසටහන ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම (දෙවන දිනය)

## දිනය ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් - 02

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. කණ්ඩායම් 04 කට බෙදා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම.
2. පහත නිවැසි ක්‍රියාකාරකම් මාතෘකා ලබා දෙන්න.
    - සන්නිවේදන විකාශනය පිළිබඳ නාට්‍යයක්
    - සන්නිවේදනයේ වැරදි භාවිතය නිසා ආරවුල් ඇති වන ආකාරය පිළිබිඹු වන ආකාරයේ දෙබසක් හෝ නාට්‍යයක්
    - සන්නිවේදන ශිල්ප ක්‍රම රූකඩ නාට්‍යයක් ඇසුරින් ඉදිරිපත් කිරීම.
    - සන්නිවේදනයේ නිවැරදි භාවිතය විදහා දැක්වෙන වීදි නාට්‍යයක්.

3. දිනය පිළිබඳ වචන 02 න් අදහස් ප්‍රකාශ කිරීමට සෑම සිසුවකුටම අවස්ථාව ලබා දීම.
4. කෙනෙක් කියූ අදහසක් තවත් කෙනෙකුට ප්‍රකාශ කල නොහැක.
5. දිනය පිළිබඳ සමාලෝචනය.





# තෙවන දිනය

## උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම

### ක්‍රියාකාරකම 3.1 - පොත් සමාජය

තමන් කැමතිම පොත, එහි කර්තෘ හා එයට හේතුව ප්‍රකාශ කිරීම

### ක්‍රියාකාරකම 3.2 - 20 ට ගණන් කිරීම

**ක්‍රියාකාරම සඳහා උපදෙස් :-**

1. සිසුන් රවුමට සිටුවා ඇස් වසා ගන්නා ලෙස ප්‍රකාශ කර 01 සිට 20 දක්වා කණ්ඩායමක් ලෙස එක්ව ගණන් කල යුතු බව පැවසීම. ඒ සඳහා තරඟ කොන්දේසි කිහිපයක් ද ලබා දීම.
2. එනම්, එක් ශිෂ්‍යයකු එක් ඉලක්කමක් පැවසූ පසු ඔහු දෙපස සිටින දෙදෙනාට ආසන්න ඊළඟ ඉලක්කම පැවසිය නොහැක.
3. එක් සිසුවකුට එක් තරඟ වටයක් අවසන් වන තෙක් පැවසිය හැක්කේ ඉලක්කම් 02 ක් පමණි.
4. එකම ඉලක්කම දෙදෙනෙකු ප්‍රකාශ කළහොත් නැවත මුල සිට ගණන් කල යුතුය.
5. අවස්ථා 03 ක් මුල් වර ලබා දීම, එම අවස්ථාවන් 03 දී කල නොහැකි වුවහොත් තත්පර 30 සුදානම් කාලයක් දී නැවත අවස්ථාවන් 03 ක් ලබා දීම.

**ඉගෙනුම් කරුණු :-**

- කණ්ඩායම් හැඟීමකින් යුක්තව කටයුතු කිරීමේ වැදගත්කම.
- ඕනෑම අවස්ථාවකදී සුදානම්ව සිටීමෙන් අසීරු අවස්ථාවන් පවා ජය ගැනීමට හැකි වන බව.
- අභියෝග ජය ගැනීම සඳහා එක්ව කටයුතු කිරීම.
- නිර්මාණශීලී බව තුළින් නව උපක්‍රම ජනනය කර ගැනීම.
- සැලසුම්සහගත බව අරමුණු ජයග්‍රහණයට වැදගත් වන ආකාරය.
- කණ්ඩායමේ සැලසුම් පිළිබඳ සියල්ලන් දැනුවත් කිරීම හේතුවෙන් බාධාවකින් තොරව කටයුතු කිරීමට හැකි වීම හා සියල්ලන්ටම වෙන්ව වගකිම් පැවරීමෙන් අරමුණු ජය ගැනීමට පහසු වීම හා කණ්ඩායම් හැඟීම වර්ධනය වීම.
- අවස්ථානෝචිතව ක්ෂණිකව සැලසුම් වෙනස් කිරීමට ඇති හැකියාව.

**පෙර දින නිවැසි ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම හා ඇගයීම**

- නිවැසි ක්‍රියාකාරකම් අගය කිරීම
- වැරදි අවස්ථාවන් නිවැරදි කිරීම
- සංකල්පය තේරුම් ගැනීම විමසුමට ලක් කිරීම.

**සාකච්ඡාව හැඳින්වීම.**


නිර්වචනය ලබා දීම හා සාකච්ඡාව කොටස් වන ආකාරය පැහැදිලි කිරීම.

සාමාන්‍ය සාකච්ඡාවක් යනු පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිපදෙනෙක් එක්වී සුහදතාවය වෙනුවෙන් හෝ සම්බන්ධතා ගොඩ නගා ගැනීම, පවත්වා ගැනීම සඳහා කරනු ලබන කථා බහකි.

නමුත් ඵලදායී සාකච්ඡාවක් ලෙස හඳුන්වනු ලබන්නේ දෙදෙනෙක් හෝ කීපදෙනෙක් සිය උවමනාවන් ඉටු කර ගැනීම සඳහා හෝ ගැටළුවක් නිරාකරණය කර ගැනීම අරමුණු කරගනිමින් ඔවුනොවුන් හා අදහස් හුවමාරු කර ගන්නා ස්වෙච්ඡාමය ක්‍රියා මාර්ගයකි.

**සාකච්ඡාව හැඳින්වීමේ දී අන්තර්ගත විය යුතු කරුණු**

- සාකච්ඡාවක් යනු කුමක්ද ?
- සාකච්ඡාවක් වැදගත් වන ආකාරය.
- සමථකරණයේ දී සාකච්ඡාව යොදා ගන්නා ආකාරය.
- නිර්වචනය ලබා දීම හා සාකච්ඡාව කොටස් වන ආකාරය පැහැදිලි කිරීම.
- සාකච්ඡාකරුවකු සතු ගුණාංග.




*රූප සටහන 10 සාකච්ඡාව කොටස් වන ආකාරය*

**ඵලදායී සාකච්ඡාවක තිබිය යුතු ලක්ෂණ** :-

- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වේ.
- ගැටළුව නිරාකරණය හෝ උවමනාවන් ඉටු කර ගැනීම පදනම්ව සාකච්ඡාව පවත්වාගෙන යනු ලබයි.
- එකිනෙකා වෙනුවෙන් කැප කිරීම් කිරීමේ හැකියාවෙන් යුක්තය.
- තමන්ට සාකච්ඡා කර ආරවුල නිරාකරණය කරගත හැකි බවට ඇති විශ්වසනීය බව.
- සාකච්ඡාකර ආරවුල නිරවුල් කර ගැනීමට ඇති කැමැත්ත.

## ක්‍රියාකාරකම 3.4. අභ්‍යාසය අත මිට මෙළවීම

### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

- දෙදෙනා බැගින් කණ්ඩායම් වීම.
- එක් අයෙක් තමාගේ එක් අතක් මිට මොළවා ගැනීම හා අනෙකාට තමාගේ අතදිග හරින ලෙස අභියෝග කිරීම.
- මුලින්ම අත දිග හරින සිසුන් දෙදෙනා ජය ගන්නා බව පැවසීම.

ඉගෙනුම් කරුණු :-

- සහයෝගය තුළින් ජය ගත හැකි බව.
- බලය යෙදීම වෙනුවට සාකච්ඡා කර පහසුවෙන් ආරවුලක් නිරාකරණය කර ගත හැකි බව.
- තමන්ගේ අත පහසුවෙන්ම දිග හැරිය හැක්කේ තමාටම වන බවත් එලෙස ආරවුලකදී තමා කැප කිරීමක් කරන්නේ නම්, ගැටුම් නිරාකරණය කර ගැනීමට ද පහසු වන බව පෙන්වා දීම.
- අත් මට මොළවා සිටින අයුරින් තමා කැප කිරීමක් නොකර සියල්ලම තමාට හිමි වන පරිදි කටයුතු කිරීමෙන් තමන් මෙන්ම අනුන් ද පීඩාවට පත්වන බව.
- ගැටළුවක් ජයග්‍රහණයට තමන් යම් කැප කිරීමක් කල යුතු බව.
- කැප කිරීම තුළින් දෙදෙනාම "දිනන දිනන" විසඳුමක් ලබා ගත හැකි බව.
- යම් දෙයක් හිමි කර ගැනීමට දෙපාර්ශවයම කැපකිරීමක් කල යුතු බව.
- බලය යෙදීම වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් පහසුවෙන් ප්‍රශ්නය විසඳා ගත හැකි බව.

## සාකච්ඡාව ප්‍රායෝගික භාවිතය I

## ක්‍රියාකාරකම 3.5. දොඩම් ගෙඩිය

### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. පහත ආරවුල නිරවුල් කරන ආකාරය පිළිබඳව සිසුන්ගෙන් විමසීම:

   නිවසේ දොඩම් ගසක අවාර කාලයේ එක් ගෙඩියක් පමණක් සෑදී ඇති අතර, එම දොඩම් ගෙඩියම තමන්ට අවශ්‍ය බව පවසා නිවසේ දරුවන් දෙදෙනා වන අක්කා හා මල්ලී රණ්ඩු කිරීම. දොඩම් ගෙඩිය තමන්ට නොලැබුන හොත් පාසල් නොයන බව දෙදෙනාම පැවසීම.

2. සිසුන්ගෙන් එම ගැටළුවට විසඳුම් ඉල්ලීම හා සිසුන් ප්‍රකාශ කරන විසඳුම් වගු ගත කිරීම. එවිට පහත ආකාරයේ තොරතුරු රාශියක් ලබා ගත හැක.

   a. දෙදෙනාටම භාගයක් බැගින් ලබා දීම

   b. අක්කාට ගෙඩියම දීම

   c. මල්ලීට ගෙඩියම දීම

   d. කිසිවෙකුට නොදීම

   e. බීම සාදා දෙන්නාටම දීම

3. එවැනි විසඳුමක් ලබා ගැනීම තුළින් දෙදෙනාම සතුටු වන්නේ දැයි සිසුන්ගෙන් විමසීම. එසේ තෘප්තිමත් නොවන්නේ නම්, ඔවුන් තෘප්තිමත් වන හැකි ආකාරයේ විසඳුමක් ලබා ගන්නේ කෙසේ දැයි බුද්ධි කලම්භනයක් ඇති කිරීම.

### අවබෝධයට :-

- සාර්ථකම විසඳුම සාකච්ඡා කිරීම බව.
- ගෙඩියක් අවශ්‍ය කෙනාට භාගයක් දීමෙන් සතුටු නොවන බව.
- ගෙඩියම ඉල්ලන්නේ කුමක් නිසාද යන්නත් පාසල් නොයාමට දොඩම් ගෙඩිය හේතු වන්නේ කෙසේදැයි යන්නත් හඳුනා ගැනීම. එනම් ආරවුලක් නිරාකරණයේ දී ආරවුල ඇති වීමට හේතු සොයා ගැනීම වැදගත් වන බව.

- ආරවුලකදී ස්ථාවරයන් හා උවමනාවන් පවතින බව සහ ඒවා වෙන්ව හඳුනා ගත යුතු බව.
- අවසානයේ ආරවුල්කරුවන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සහ මැදිහත්කරුවාගේ උපකල්පන මත තීන්දු තීරණ නොගත යුතු බව.

  උදා :-

  - මල්ලී දොඩම් ගෙඩිය කෑමටත්
  - අක්කා පාසලේ කෘෂිකර්ම පාඩමට දොඩම් ඇට ගෙන යාමට පොරොන්දු වී සිටීමත්.


- අවශ්‍යතා වෙන් වෙන්ව ඔවුන්ගෙන්ම හඳුනා ගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීම.

## සාකච්ඡාව ප්‍රායෝගික භාවිතය II


ගැටළුවක් ලබා දී එය සාකච්ඡාවක් තුළින් විසඳා ගන්නා ආකාරය සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීම.

a. උවමනාවන් හා ස්ථාවරයන් වෙන් වෙන් වශයෙන් හඳුන්වා දීම.

b. ද්‍රව්‍යාත්මක, ක්‍රියාපටිපාටිමය, මනෝ විද්‍යාත්මක අවශ්‍යතා පිළිබඳව වෙන්වෙන්ව පැහැදිලි කිරීම.




*රූප සටහන 11 ගැටුමක දී පුද්ගලයා ක්‍රියාත්මක වන ආකාරය*




*රූප සටහන 12 අවශ්‍යතා සහ උවමනාවන්*

## ආරවුල නිරවුල් කර ගත යුතු ආකාරය

### ක්‍රියාකාරකම 3.6. එළුවන් බෙදා ගැනීම

ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. පහත ප්‍රශ්නයට විසඳුමක් යෝජනා කිරීමට සිසුන්ගෙන් ඉල්ලා සිටින්න.

   - එක් පියෙකුට දරුවන් 03 කු සිටී. ඔහු සතුව එළුවන් 17 ක් සිටින අතර පියා මරණයට පෙර තමා මිය ගිය දිනක එම එළුවන් පහත අයුරින් බෙදා ගත යුතු බව පැවසීම. එනම්,

     - වැඩිමහල් දරුවාට මුළු එළුවන්ගෙන් භාගයක්
     - දෙවැනියාට මුළු එළුවන්ගෙන් තුනෙන් එකක්
     - තුන් වැනියාට මුළු එළුවන්ගෙන් නවයෙන් එකක්

     වන ලෙස.

   - පියාගේ මරණින් පසු පාසල් අධ්‍යාපනය නොමැති දරුවන්ට එම ආරවුල විසඳා ගැනීමට අවබෝධයක් නොවීම.
   - පියාගේ මිතුරකු වන එළුවන් විකුණන මාමා කෙනෙකු හමුවී ආරවුල නිරවුල් කර ගැනීම.
   - එම මාමා තමා යැයි සිතා ගණිත ශාස්ත්‍රය නොදන්නා දරුවන්ට ඇස් පනාපිට මෙම ආරවුල නිරවුල් කර දෙන ලෙස පැවසීම.

   **ආරවුලේ ඇති ස්ථාවරයන් හඳුන්වා දීම :-**

   - පියා පැවසූ පරිදි එළුවන් බෙදා ගැනීම.
   - තමන්ට හිමි විය යුතු කොටස අනිවාර්යයෙන් ලබා ගැනීම.

   **ආරවුලේ ඇති උවමනාවන් හඳුන්වා දීම :-**

   - ගණිතය නොදන්නා හෙයින් ඇස් පනාපිට ආරවුල නිරවුල් කර ගත යුතු වීම.
   - නිරවුල් කල ආකාරය පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ඇති වීම.
   - නිරවුල් කර ගත් ආකාරය පිළිබඳව ඔවුන් සතුටට පත් වීම.

2. සිසුන්ට තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් ආරවුල නිරවුල් කර ගැනීමට අවස්ථාව දීම.
3. බුද්ධි කලම්භනය මගින් අවශ්‍යතා තේරුම් ගැනීමට සැලැස්වීම.

ගැටළුව විසඳන ආකාරය :-

- මාමා විසින් දරුවන් 04 දෙනාට තමා ළඟට එළුවන් 17 දෙනා රැගෙන එන ලෙස පවසා, දරුවන් පාසල් ගොස් නැති නිසා ගණිත කර්මවලින් තොරව ඇස් පනාපිට එළුවන් බෙදා දීමට කටයුතු කරන බව පැවසීම.
- ඉන් අනතුරුව මාමා විසින් බෙදීමේ පහසුව සඳහා එළුවන් ගොඩට තමාගේ එළුවකු ද දමන බවත්, නමුත් බෙදීමෙන් පසු තමාගේ එළුවා තමා ගන්නා බවත්, එම නිසා තමාගේ එළුවාට සංකේතයක් දමා එළුවන් ගොඩට දමන බවත් ප්‍රකාශ කරන්න.
- පසුව මාමා විසින් තමාගේ එළුවා දැමූ පසු 18 ක් වූ මුළු එළුවන්ගෙන් භාගයක් එනම් 9 ක් වැඩිමහල් පුතාටත් අනතුරුව නැවතත් මුළු එළුවන්ගෙන් 1/3 ක් වන 6 ක් දෙවන පුතාටත් 1/9 ක් එනම් 2 තුන් වන පුතාටත් ලබා දීමට කටයුතු කරන බව පවසන්න.

- පසුව එම මුළු එළුවන් ප්‍රමාණයේ එකතුව එනම් 9+6+2 එකතුව 17 ක් වන බවත් ඉතිරි එළුවා තමාගේ එළුවා බවත් සිසුන්ට ප්‍රකාශ කරන්න.
- මෙහිදී ගණිත කර්මයෙන් මෙම ගැටළුව විසඳීමේ දී ලැබෙන පිළිතුර හා මෙම ක්‍රමයෙන් විසඳීමේ දී ලැබෙන පිළිතුර සමාන වන බවත්, මෙහිදී දරුවන්ට අවබෝධ වන අයුරින් ගැටළුව විසඳීම මගින් දරුවන් තෘප්තිමත් වන අයුරින් ගැටළුව නිරවුල් කර ගැනීමට හැකි වන බවත්, ඒ ඒ පුද්ගලයන්ගේ මානසික මට්ටම් දැනුම් මට්ටම්වලට ගැලපෙන අයුරින් නිරවුල් කිරීමකට යොමු වීමෙන් පුද්ගලයන් ගැටුම නිරවුල් කර ගැනීම පිළිබඳ තෘප්තිමත් වන ආකාරය පිළිබඳත් අවබෝධය සිසුන්ට ලබා දෙන්න.

## වැඩසටහන ඇගයීම නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම (තෙවන දිනය)

### දිනය ඇගයීම හා නිවැසි ක්‍රියාකාරකම් - 03

#### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

1. කණ්ඩායම් - 04 ට බෙදා නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම.
2. පහත නිවැසි ක්‍රියාකාරකම් මාතෘකා සපයන්න.
    - සාකච්ඡාව තුළින් ආරවුලක් නිරවුල් කර ගන්නා ආකාරය
    - ඵලදායී සාකච්ඡාවක් පවත්වන අයුරු භූමිකා රංගනය
    - ගැටුමක් නිරවුල් කිරීමේදී සාකච්ඡාවේ වැදගත්කම පිළිබඳ ඉදිරිපත් කිරීමක්
    - මෙතෙක් ඉගෙන ගත් කරුණු ඇසුරින් නිර්මාණශීලි ඉදිරිපත් කිරීමක්
3. දිනය පිළිබඳ වචන 03 කින් අදහස් ප්‍රකාශය කිරීමට සෑම සිසුවකුටම අවස්ථාව ලබා දීම.
4. කෙනෙක් කියූ 'අදහසක්' තවත් කෙනෙකුට ප්‍රකාශ කල නොහැක.



# හතර වන දිනය

## උදෑසන එකමුතුව - පෙර දින ඇගයීම

### ක්‍රියාකාරකම 4.1: විවිධත්වය

තමාට විශේෂ අද්භූත හැකියාවක් ලැබුනහොත් එම බලය උපයෝගී කර ගෙන කිරීමට කැමති පළමුවෙනි දේ ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම.

**ඉගෙනුම් කරුණු :-**

- පුද්ගලයන් තුළ විවිධත්වයට ඇති කැමැත්ත පෙන්වා දීම.
- කැමැත්ත අනුව බලාපොරොත්තු විවිධ වන බව.
- පරාර්ථකාමී සිතුවිලිවලින් වන සමාජයීය බලපෑම.
- සමාජයීය පුද්ගල විවිධත්වය මත ආරවුල් ගොඩ නැගෙන බව අවබෝධ කරවීම.

**ඉ: හොඳ සමථකරුවකු විවිධත්වයට හා අන්තර්කරණයට සංවේදීව කටයුතු කරයි**

විවිධත්වය හා අන්තර්කරණය පිළිබඳ සමථකරුවකුගේ දැනුවත් භාවය, පාර්ශවකරුවන්ට පහසු පරිසරයක් නිර්මාණය කිරීමට, ක්‍රියාවලිය පිළිබඳව විශ්වාසය ඇති කරලීමට සහ ඔවුන්ගේ ආරවුල සඳහා සාමූහික විසඳුමක් සඳහා යොමුවීම සඳහා වැදගත්වන මෙවලමකි.

සියළුම දෙනා සංස්කෘතික වශයෙන් අද්විතීය බව සමථකරු මතක තබා ගත යුතු අතර, එමනිසා අප ගැටළුවලට ප්‍රවේශ වන ආකාරය ද ඒ අනුව වෙනස් විය යුතුය. සංස්කෘතිය පිළිබඳ අපගේ සංජනනය, පුද්ගලයෙකුගේ අනන්‍යතාවය අප වටහා ගන්නා ආකාරය පිළිබඳව විශාල බලපෑමක් ඇති කරයි. පුද්ගලයෙකුගේ සමේ පැහැය, ආගම, භාෂාව, උච්චාරණය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ලිංගික නියෝජනය, සමාජ තත්වය හෝ තනතුර අනුව අනන්‍යතාවය ගොඩනැගීමක් සිදු විය හැක.

යමෙකු නුසුදුසු යැයි පෙනෙන ආකාරයට ප්‍රතිචාර දක්වන්නේ නම්, සමථකරු ක්ෂණයකින් සෘණාත්මක උපකල්පනවලට එළඹීමෙන් වැලකී සිටිය යුතුය. සමථකරු ඒ වෙනුවට, එම ප්‍රතිචාර පිටුපස තිබිය හැකි ගැඹුරු මූලික හේතු සඳහා පැහැදිලි කිරීම් සෙවිය යුතුය. හැකිනම් එම පුද්ගලයාට ඵලදායි විය හැකි, සම්බන්ධ වීමට හැකි පහසු පරිසරයක් නිර්මාණය කිරීමට සමථකරු උදව් කල යුතුය.

විවිධත්වයට සංවේදීවීමට නම්, ඉවසීම, විවෘත මනසක්, තමන්ගේම සාරධර්ම හා හැසිරීම් ප්‍රශ්න කිරීමේ හැකියාවක් සහ අන්තර්කරණය සඳහා ප්‍රබල හැඟීමක් අවශ්‍යවේ.

### ක්‍රියාකාරකම 4.2. අත් ගැටය √

*(මූලාශ්‍රය : සහයෝගීතාව සහ එකට වැඩ කිරීම පිළිබඳ වටිනාකම් විෂයමාලා ක්‍රියාකාරකම් 7.2)*
Link: www.values4all.lk/Sinhala/chapter-07/activity-7.2.html

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. සිසුන් 06 දෙනා බැගින් ගෙන රවුමට අත් අල්ලා ගෙන සිටීමට පැවසීම. ඔවුන් අතර හොඳ සම්බන්ධතාවයක් පවතින බව අත් අල්ලා සිටීමෙන් නිරූපණය කිරීම.

2. අනතුරුව අත් බැමි ගලවා තමන්ට ඉදිරියෙන් සිටින සිසුවාගේ දකුණු අතින් අල්ලන ලෙස කීම. සම්බන්ධතා බිඳ වැටීමක් එමගින් නිරූපණය කිරීම.
3. පසුව දකුණු අත් අල්ලාගෙන නොමැති වෙනත් සිසුවකුගේ වම් අත අල්ලා ගැනීමට කීම. සම්බන්ධතා සංකීර්ණ වීම එමගින් නිරූපණය කිරීම.
4. මුල් අවස්ථාවේ පැවති ස්වරූපයට අත් ගැටය ගැලවීමකින් හෝ වෙනස් කිරීමකින් තොරව සාකච්ඡා මාර්ගයෙන් විසඳුමකට පැමිණීමට සිසුන්ට උපදෙස් හා සහයෝගය ලබා දීම.

### ඉගෙනුම් කරුණු:

- සාකච්ඡාවක අඩංගු විය යුතු ලක්ෂණ
    - සහයෝගය
    - විශ්වාසය
    - සියල්ලන්ම කැප කිරීම් කිරීමට ඇති සූදානම
- සාකච්ඡාව තුළින් ආරවුල් නිරවුල් කිරීමට ඇති සාමූහික කැමැත්ත හා විශ්වාසය.
- අවස්ථාව හා අවශ්‍යතාවය අනුව ගැටළුව දැනෙන ප්‍රමාණය වෙනස් වන බව.
- ආරවුල්කරුවන් ස්ථාවරයන්ට කොටු නොවී තමන්ගේ උවමනාවන් හඳුනා ගැනීම හරහා සාර්ථක එකඟතාවයකට පත් විය හැකි බව.

**සාකච්ඡාකරුවකු සතු ගුණාංග :-**

සාකච්ඡාකරුවකු සතු විය යුතු ගුණාංග සිසුන් සමඟ සාකච්ඡා කර වගුගත කිරීම. ඒ ඒ ගුණාංග තමා සතු වීමෙන් අත්වන ප්‍රතිලාභ පිළිබඳව ද අවබෝධය ලබා දීම. ගුණාංග සඳහා නිදසුන් කිහිපයක් පහතින් දක්වා ඇත.

- අපක්ෂපාතීබව
- නම්‍යශීලී බව
- අන් මත ඉවසීම
- සහකම්පනය
- සුහදශීලීබව
- කාරුණිකබව
- ප්‍රියමනාප බව
- හොඳින් ඇහුම්කන් දීම
- සන්නිවේදන ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම හා ඒවා භාවිතයේ හැකියාව
- අවාචික ප්‍රතිචාර තේරුම් ගැනීම හා ඒවාට සංවේදී වීම



## ක්‍රියාකාරකම 4.3: අභියෝගය කඩදාසිය මත සිට ගැනීම

**අවශ්‍ය ද්‍රව්‍ය :-**

- පත්තර පිටු කිහිපයක්

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

- කණ්ඩායම් 02 කට බෙදා, කණ්ඩායමකට පත්තර පිටුවක් බැගින් ලබා දී තත්පර 02 ක් සියළු දෙනාම එකම මොහොතක බිම ස්පර්ශ නොකර පත්තර පිටුව මත පමණක් සිටින ලෙස ප්‍රකාශ කර, පත්තර පිටුව බිමට දැමීම.
- එය ඉටු කළහොත් පත්තර පිටුවේ ප්‍රමාණය කුඩා කරමින් එම කණ්ඩායමට ලබා දීම.
- අභියෝගය ජය ගැනීමට කණ්ඩායම් අතර උද්වේගය ඇති කිරීම.
- අවසානයේ කුඩා තීරුවක් දක්වා පත්තරයේ ප්‍රමාණය කුඩා කිරීම.

**අවබෝධයට :-**

පත්තරය බිමට දමන නිසා එකිනෙකා මත නැගී පත්තර පිටුවේ සිට ගැනීමට උත්සාහ කිරීම ආදී වූ විවිධ ක්‍රම සිසුන් යොදා ගැනීම. බුද්ධි කලම්භනය තුළින් විවිධ නිර්මාණශිලී ක්‍රම ඇසුරින් අභියෝගය ජය ගැනීමට සිසුන් දිරි ගැන්වීම. පසුව කුඩා කොටස්වලට කඩා අතින් අල්ලාගෙන එකවර උඩ පැනීම දක්වා නිර්මාණශීලි බව දියුණු කර ගැනීමට සිසුන්ට සහය වීම. කණ්ඩායම් අතර තරගකාරි බව ඇති කිරීමෙන් ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමට පෙළඹවීම.

**ඉගෙනුම් කරුණු :-**

- සාමූහිකව අරමුණු ජය ගැනීමට කටයුතු කිරීමේ දී ඇතිවන බාධාවන් හා ශක්‍යතාවන් පෙන්වා දීම.
- අභියෝග ජය ගැනීමට අභිප්‍රේරණය වැදගත් වන ආකාරය පෙන්වා දීම.
- නිර්මාණශීලි බව.
- ක්ෂණික තීරණ ගැනීම.
- සියල්ලන්ටම ඇහුම්කන් දිමේ වැදගත්කම.

## ක්‍රියාකාරකම 4.4. එකිනෙකාට ගරු කිරීම

*(මූලාශ්‍රය: ගෞරවය දැක්වීම පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 3.2)*
Link: www.values4all.lk/Sinhala/chapter-03/activity-3.2.html

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

1. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
2. පේළියේ සිසුන් එකිනෙකා පසු පසට සිටින සේ සිටුවන්න.
3. පළමු සිසුවා පමණක් ඉදිරියට හරවා ඔහු අතට පැනක් දී එය පේළියේ අනිත් සිසුන් අතර අතින් අතට යවන ලෙස පවසන්න.
4. එම අවස්ථාව හොඳින් නිරීක්ෂණය කර අවස්ථාව පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
5. පසුව නැවතත් පැන මුල් පුද්ගලයා අතට ලබා දී එය මෙවර බොහෝ ගරු සරුව අතින් අතට යවන ලෙස පවසන්න.

**සිසුන් සමග සාකච්ඡා කරන්න:**

- මුල් අවස්ථාවේ පැන ලබා දීමේදී ඇති වූ හැඟීම සහ පසු අවස්ථාවේ ඇති වූ හැඟීම සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එකිනෙකාට ගරු කිරීමේ දී ඇති වූ හැඟීම සහ එකිනෙකාට ගරු කිරීමේ විවිධ ක්‍රම, ඉන් ඇතිවන සමාජ බලපෑම විස්තර කරන්න. මිනිසුන් එකිනෙකාට අගෞරව කරන අවස්ථා සහ එසේ අගෞරව කිරීමට බලපාන සමාජයීය සාධක සාකච්ඡා කරන්න.
- තමාට කිසිවෙක් අගෞරව කළහොත් ඇති වන හැඟීම සහ තමන් කිසියම් පුද්ගලයකුට අගෞරව කළහොත් පසුව එය සිහිපත් වන විට ඇති වන හැඟීම සාකච්ඡා කරන්න.
- සමථකරණ ක්‍රියාවලිය තුළ මැදිහත්කරුවකු වශයෙන් එකිනෙකාට ගරු කිරීමේ වැදගත්කම එම ක්‍රියාවලියේ සාර්ථකත්වයට බලපාන ආකාරය සිසුන්ට අවබෝධ කරවන්න.

**ඉගෙනුම් කරුණු :-**

- ගෞරවය හා අගෞරවය පුද්ගල ක්‍රියාකාරකම් වලට බලපාන ආකාරය.
- ගෞරවය පිළිබඳ සමාජ මත පිළිබඳ අවබෝධය ලබා දීම.
- සියල්ලන්ම ගෞරවය ලැබීමට ඇති කැමැත්ත.
- පුද්ගලයන්ට ගරු කරනු ලැබුවහොත් පෙරළා එම ගෞරවය තමන්ටත් ලැබෙන බව.
- ගෞරවනීය භාෂා භාවිතය හා නිගරු කිරීමේ දී පුද්ගල හැසිරීම් රටාවන් ප්‍රතිචාරවල ඇති වන වෙනස්කම් පැහැදිලි කිරීම.
- වෙනත් භාෂාවන්ට, ජාතීන්ට, වෙනස් ලෙස සිතන පුද්ගලයන්ට, ගරු කිරීමේ වැදගත් බව පැහැදිලි කිරීම.

## සමථකරණය යනු කුමක්ද?

සමථකරණය යනු, කිසියම් ආරවුලක් නිරාකරණයට එම ආරවුලට සම්බන්ධ නොවන මධ්‍යස්ථ, අපක්ෂපාතී, පිළිගතහැකි, තීන්දු තීරණ දීමේ අධිකරණ බලයක් නොමැති තුන් වන පාර්ශවයක මැදිහත් වීමයි. එය තව දුරටත් සවිස්තරව දක්වන්නේ නම්;

පිළිගත හැකි වූත්, අපක්ෂපාතී වූත්, මධ්‍යස්ථ වූත්, තීරණ ගැනීමේ අධිකාරී බලයක් නොමැති වූත්, තුන්වන පාර්ශවයක් විසින් ආරවුලට සම්බන්ධ සියළු පාර්ශවයන් ට ඔවුන්ගේ උවමනා ඉටුවන පරිදි හා ආරවුලේ මූල හේතුව ඉවත් වන පරිදි අන්‍යෝන්‍ය වශයෙන් සෑහීමකට පත් විය හැකි සම්මුතියකට ස්වේච්ඡාවෙන් ළඟා වීම සඳහා සහය වීමේ සාකච්ඡාමය ක්‍රියාවලියක් ලෙසින් ඉදිරිපත් කල හැක.

## සමථකරණයේ ඉතිහාසය හා විකාශනය

සමථකරණයේ ඉතිහාසය රාජාණ්ඩු ක්‍රමය දක්වා දිවෙන අතර රජු නීතියේ උල්පත විය. රජුගෙන් පසුව අමාත්‍යවරුන්ට අධිකරණ බලය හිමි වූවා සේම, ගම සම්බන්ධව කටයුතු කිරීමේ දී වැදගත්ම පාලන ඒකකය වූයේ ගම් සභාවයි. ගම් සභාවේ ප්‍රධානියා "ගමික" වශයෙන් හැඳින්වූ අතර, අනතුරුව 1948 න් පසුව ගම් සභා ක්‍රමයට විකල්පයක් වශයෙන් 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතින් ලංකාවේ සමගි මණ්ඩල ස්ථාපිත කරන ලදී.

පසු කාලීනව සමගි මණ්ඩල ක්‍රමයේ පැවති අක්‍රමිකතා හේතුවෙන් 1978 අංක 02 දරණ පවුල් උසාවි ක්‍රමය ආරම්භ කළේය. සුළු ආරවුල් නිරාකරණයේදී බලාපොරොත්තු වූ අරමුණු එමගින් ඉටු නොවූ හෙයින් ලෝකයේ සුළු ආරවුල් නිරාකරණයට පවතින වෙනත් විකල්ප තත්ත්වයන් අධ්‍යනය කිරීමෙන් පසුව, ලංකාවට සුදුසු ක්‍රමවේදයක් ලෙස 1988 අංක 72 දරණ පනතින් සමථ මණ්ඩල ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය.

එදින සිට වර්තමානය දක්වාම ආරවුල් නිරාකරණයට ඉතාමත් සුදුසු ක්‍රමවේදයක් ලෙසින් සමථ මණ්ඩල ක්‍රමය ක්‍රියාත්මක වන අතර දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටම එකක් බැගින් විශේෂ සමථ මූල මණ්ඩල ද ඇතුළත්ව සමථ මූල මණ්ඩල 338 ක් පමණ පිහිටුවා ඇත. එම සමථ මූල මණ්ඩලවල 9000 ට නොඅඩු සමථකාරවරුන් පිරිසක් ස්වේච්ඡාවෙන් සමථකරණ ක්‍රියාවලියේ නිරත වෙමින් ප්‍රජාවගේ ආරවුල් නිරවුල් කර ගැනීමට තම දායකත්වය සපයනු ලබයි.

ප්‍රජා සමථකරණ ක්‍රියාවලියට අත්වැලක් වෙමින් 2005 වර්ෂයේ දී සමථකරණ සංකල්පය පාසල් පද්ධතියට හඳුන්වා දෙනු ලැබීය. එමගින් සාමකාමී පාසල් පද්ධතියක් ඇති කිරීමටත් පාසල් සිසුන්ට හා ගුරුවරුන්ට සමථකරණය පිළිබඳ දැනුම ප්‍රවේශ කරලීමටත් හැකියාව ලැබී ඇත. වර්තමානය වන විට දිවයිනේ පාසල් 500 කට වැඩි ප්‍රමාණයක පාසල් සමථ ඒකකයන් සක්‍රීයව ක්‍රියාත්මක වේ.

## පෙර දින නිවැසි ක්‍රියාකාරකම ලබා ගැනීම.


### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

- නිවැසි ක්‍රියාකාරකම් අගය කිරීම.
- වැරදි අවස්ථාවන් නිවැරදි කිරීම.
- සංකල්පය තේරුම් ගැනීම විමසුමට ලක් කිරීම.
- ප්‍රශ්න ඇසීමට සිසුන් උනන්දු කිරීම.

## සමථකරණයේ වාසි පැහැදිලි කිරීම

- ආරවුලේ නියම ස්වරූපය හඳුනා ගැනීම.
- දෙපාර්ශවයටම ගැටළුව තේරුම් ගැනීමට අවස්ථාව දීම.
- ආරවුල්කරුවන් අතර නැවත සම්බන්ධතාවය ගොඩ නැගීම.
- ආරවුලට බලපෑ සැබෑ හේතුව ඉවත් කිරීම.
- පාර්ශවයන් ජය ජය තත්වයට පත් වීම.
- කාලය, ශ්‍රමය, ධනය ඉතිරි වීම.

පහත දැක්වෙන රූපය ගැන සිසුන් සමඟ සාකච්ඡා කරන්න



### සමථකරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීම :

## සමථකරණ පියවර 5

- Step 01 ■ සමථකරුවන්ගේ ආරම්භක ප්‍රකාශය
- Step 02 ■ ආරවුල හඳුනා ගැනීම
- Step 03 ■ ආරවුලේ විෂය කරුණු හා උවමනා පිළිබඳ වැඩිදුර සොයා බැලීම
- Step 04 ■ විකල්ප ජනනය සඳහා පාර්ශවයන් යොමු කිරීම
- Step 05 ■ පාර්ශවයන් එකඟතාවයට පත්වීම

*රූප සටහන13: සමථකරණ පියවර 5*

### සමථකරණ ක්‍රියාවලියේ පළමු පියවර :-

සමථකරුවන් හා ආරවුල්කරුවන් හඳුනා ගැනීම හා සමථකරණ ක්‍රියාවලිය පැහැදිලි කර ගැනීම.

1. පිළිගැනීම
2. අසුන් ගැන්වීම
3. හඳුන්වා දීම හා හඳුනා ගැනීම
4. ක්‍රියාවලිය පැහැදිලි කිරීම
5. එකඟතා ලබා ගැනීම
   - ✓ බාධා නොකරන බව
   - ✓ සිත් රිදෙන වචන කථා නොකරන බව
   - ✓ සත්‍යම ප්‍රකාශ කරන බව
   - ✓ රහස්‍ය භාවය ආරක්ෂා කරන බව
   - ✓ සටහන් තබා ගන්නා බව
   - ✓ වෙන්ව කථා කරන බව
6. සමථකරණ ක්‍රියාවලිය පිළිබඳව තවත් දැනගත යුතු දේවල් තිබෙනවාදැයි පාර්ශවකරුවන්ගෙන් විමසීම හා සාකච්ඡාව ඉදිරියට කරගෙන යාමට සහය ලබා ගැනීම.
7. පැමිණීමට ස්තුති කිරීම

## ක්‍රියාකාරකම 4.5 - ආගන්තුක අවස්ථාවක පිළිගැනීමෙන් ලැබෙන මානසික උත්තේජනය පිළිබඳ අවබෝධය ලබා දීම.

### ක්‍රියාකාරකමට උපදෙස් :-

- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර එක් සිසුවකු විසින් අනෙත් සිසුවාට ගැටළුවක් ඉදිරිපත් කිරීම.
- එහිදී හැසිරිය යුතු ආකාරයන් පිළිබඳව ගැටළුව අසන සිසුවා දැනුවත් කර තිබීම.
- ඒ අනුව පළමු අවස්ථාවේදී යහපත්ව ප්‍රතිචාර නොදක්වමින් ගැටළුවට සවන් දීම.
- දෙවන අවස්ථාවේ දී යහපත් ප්‍රතිචාර දක්වමින් ගැටළුවට ප්‍රතිචාර දැක්වීම.
- ඒ ඒ අවස්ථාවන්හි දී ඇතිවුණ මානසික තත්ත්වයන් පිළිබඳ ගැටළුව ඉදිරිපත් කල සිසුන්ගෙන් විමසීම මගින් කරුණු සාකච්ඡා කිරීම.

### ඉගෙනුම් කරුණු :-

- එම අවස්ථාවට මුහුණ දුන් සිසුන් සමග එහිදී ඇති වූ මානසික තත්ත්වයන් පිළිබඳව වෙන වෙනම සාකච්ඡා කිරීම.
- පිළිගැනීම තුළින් ඇති වන පුද්ගල මානසික තත්ත්වයන් තීරණයට වැදගත් වන ආකාරය පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දීම.
- යහපත් මානසික තත්ත්වයන් ඇති කිරීමට පිළිගැනීම වැදගත් වන බව අවබෝධ කරවීම.
- ආරවුලක් සහිත මානසික තත්ත්වයකින් සිටින පුද්ගලයකුට සමානව සැලකීම මගින් යහපත් මානසික තත්ත්වයක් ගොඩ නැංවීමට හැකි වන බව.

## දෙවන පියවරඃ ගැටළුව හඳුනා ගැනීම (විෂය කරුණු ගවේෂණය කිරීම)

1. ගැටළුව ප්‍රකාශ කිරීමට පාර්ශවයන්ට සම අවස්ථාවන් දීම.
2. සමථකරුවන් සමග පෞද්ගලිකව සහ රහසිගත ලෙස විශ්වාසයෙන් යුතුව කතා කිරීමේ අවස්ථාවක් ද එනම් වෙන්ව කථා කිරීමේ අවස්ථාවක් ද (උදාඃ අනෙක් පාර්ශවයෙන් වෙන්ව) මෙයට ඇතුළත්ය. මෙය 'කෝකස්' ක්‍රමවේදය ලෙස හඳුන්වන අතර එමගින් විසඳුමක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් සිසුන්ට තමන්ගේ පැතිකඩින් සමථකරු සමග කථා කිරීමට ඉඩ සලසයි.

> **ඊඃ සමථකරණය සඳහා ආධාරකයක් ලෙස 'කෝකස්' ක්‍රමවේදය**
>
> ආරවුල් ඇති පාර්ශවයන්ට ඒකාබද්ධ සැසිවාරයෙන් පිටත යම් කාලයක් ගත කිරීමට ඉඩ ලබා දීම තුළින් සමථකරු සමග පෞද්ගලිකව සහ රහසිගතව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලෙස 'කෝකස්' සංකල්පය නිර්මාණය කර ඇත.
>
> මෙම ක්‍රමවේදය නිසා කරුණු පැහැදිලි කර ගැනීමට, දිගු කාලීන හා කෙටිකාලීන අරමුණු ගැන මෙනෙහි කිරීමට, නව කරුණු එකතු කිරීමට, නව එකඟතාවයක් හෝ නිරවුල් කිරීමක් වර්ධනය කර ගැනීමට සහ චිත්තවේගී පීඩනය පිට කිරීමට අවශ්‍ය පරිසරයක් සඳහා ඉඩ සැලසීමක් සහ තීරණ තහවුරු කිරීමට උපකාරකයක් වේ.

3. සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතයෙන් ගැටළුව හඳුනා ගැනීම
   - ක්‍රියාකාරි සවන් දීම
   - නැවත ප්‍රකාශය

- පරාවර්තනය
- සාරාංශකරණය
- නැවත රාමු කිරීම
- විවෘතාන්ත ප්‍රශ්න
- උනන්දු කිරීම

## ක්‍රියාකාරකම 4.6- සිසුවෙකුට කණ්ඩායම මැදට පැමිණ ගැටළුවක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම.

### ක්‍රියාකාරකමට උපදෙස් :-

- සිසුන් සියළු දෙනා රවුමක් ආකාරයට සිට ගැනීම.
- ස්වෙච්ඡාවෙන් සිසුවකු කණ්ඩායම මැදට පැමිණීම.
- මැද සිටින සිසුවා තමන් නිර්මාණය කල ගැටළුවක් ඉදිරිපත් කිරීම.
- සෙසු පිරිස එක් අයෙක් බැගින් ක්‍රියාකාරි සවන් දීමෙන් හා සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතයෙන් ගැටළුව හඳුනා ගැනීමට උත්සාහ කිරීම.

### ඉගෙනුම් කරුණු :-

- සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතය පිළිබඳව ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබා දීම.
- සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතයේ දී සන්නිවේදන ක්‍රියාවලිය පහසු වන ආකාරය හා සන්නිවේදන ශිල්ප ක්‍රම නිසි ලෙස භාවිතා නොකිරීමෙන් සන්නිවේදනය අපහසු වන ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.

### තෙවන පියවර: විෂය කරුණු හා උවමනාවන් ගවේෂණය

1) ස්ථාවරයන්හි සිට උවමනාවන් දක්වා වෙනස් වීමට පාර්ශවයන්ට සහය වීම.
2) විෂය කරුණු හා උවමනාවන් හඳුනා ගැනීම
   - ✓ සන්නිවේදන ශිල්ප ක්‍රම තව දුරටත් භාවිතා කිරීම.
3) විෂය කරුණු හා උවමනාවන් වෙන්ව පාර්ශවයන්ට පෙන්වා දීම.
4) එක් එක් විෂය කරුණට අදාළ උවමනාවන් පෙළ ගැස්වීම.
5) පාර්ශවයන් අතර වැරදි වැටහීම් ඉවත් කිරීමට සහය වීම.
6) ගැටළුව සම්බන්ධයෙන් තව දුරටත් සාකච්ඡා කල යුතු කරුණු ඇත්දැයි විමසීම.

## ක්‍රියාකාරකම 4.7:- කථාවක් සිසුන්ට ප්‍රකාශ කිරීම හා අනතුරුව කථාව තුළ අන්තර්ගත ස්ථාවරයන් හා උවමනාවන් හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.

**ඉගෙනුම් කරුණු :-**

- ප්‍රකාශයක අන්තර්ගත ස්ථාවරයන් හා උවමනාවන් වෙන් කර ගැනීමට අවශ්‍ය නිපුණතාවය සිසුන්ට ලබා දීම
- ආරවුලකදී ස්ථවාරයන්වලට පසුව උවමනාවන් හඳුනා ගැනීමට සන්නිවේදන ශිල්ප ක්‍රමවල වැදගත්කම අවබෝධ කර දීම

**හතරවන පියවර: විකල්ප ජනනය (ගැටළුව නිරාකරණයට ඇති විසඳුම් පෙළ ගැස්වීම හා දෙපාර්ශවයටම ගැලපෙන විසඳුම හඳුනා ගැනීම)**

1) ගැටළුවට විසඳුම් හඳුනා ගැනීම.
   - ✓ සාරාංශකරණය හා බුද්ධි කලම්බන සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතය
2) නිර්මාණශීලි විසඳුම් ඇති කර ගැනීමට සහය වීම.
3) විසඳුම් පෙළ ගැස්වීම.
4) විසඳුම් අතරින් ගැළපෙන විසඳුම් තෝරා ගැනීමට සහය වීම.
5) විකල්ප විසඳුම් හුවමාරු කර ගැනීම.
6) විකල්ප විසඳුම් තක්සේරුවට පාර්ශවයන්ට සම අවස්ථාව ලබා දීම.
7) විකල්ප අතරින් හොඳම විකල්පය නියත කිරීමට අවස්ථාව ලබා දීම.

   **(කුමක්ද? කවුද? කවදාද? කොහේදිද? කෙසේද?)**

## ක්‍රියාකාරකම 4.8 ආරවුලක් සඳහා විසඳුම් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ඇති හඳුනා ගැනීම.

- පන්ති කාමරය තුළ හෝ එළිමහන් භූමියකට සිසුන් රැගෙන යන්න.
- පන්ති කාමරයේ හෝ එළිමහනේ පාලමක් ආකාරයට තීරුවක් සටහන් කර සිසුන්ට එම පාසල ආසන්නයේ ඇති පාලමක් මතක් කර ගන්නා ලෙස පවසන්න.
- පසුව එම පාලම මතින් එක් පසක සිට අනෙක් පසට සෑම සිසුවකුම ගමන් කල යුතු බව පවසන්න.
- අභියෝගය නම් එක් සිසුවකු ඇවිද ගිය ආකාරයට වෙනත් සිසුවකුට පාලම මතින් ඇවිද යාමට නොහැකි වීමයි.
- ඒ අනුව කණ්ඩායමේ සිසුන් 40 ක් සිටී නම් ආකාර 40 කින් පාලම තරණය කල යුතුය.
- පාලම මතින් කවුරුන් හෝ සිසුවකු තවත් සිසුවකු ඇවිද ගිය ආකාරයට සමාන අයුරින් ඇවිද ගියහොත් එම සිසුවාට ගීතයක් කීමට සිදුවනවා වැනි සුළු අභියෝගයක් ද ලබා දෙන්න.
- අනතුරුව කැමති සිසුවකුට ප්‍රථමයෙන් පාලම මතින් ඇවිද යන ලෙසට උපදෙස් දෙන්න.
- පසුව එම සිසුවා ළඟ සිට පිළිවෙලින් දෙපස සිසුන්ට එකිනෙකා බැගින් පෙර සිසුන් ඇවිද නොගිය ආකාරයකට පාලම මතින් ඇවිද යන ලෙස පවසන්න.
- සියළු සිසුන් ඇවිද ගිය පසු ප්‍රථමයෙන්ම පාලම මතින් ඇවිද ගිය සිසුවාට කිසිම සිසුවකු ඇවිද නොගිය ආකාරයට පාලම මතින් ඇවිද යන ලෙස පවසන්න.

- අභියෝගය ජය ගත් පසු සියළු සිසුන් ඇගයීමට ලක් කරන්න.

**ඉගෙනුම් කරුණු :-**

- පාලම මතින් සිසුන් ඇවිද ගිය ආකාරය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සැබෑ ජීවිතයේ දී මිනිසුන් සිසුන් ඇවිද ගිය ආකාරයට පාලම මතින් ඇවිද යන්නේදැයි ප්‍රශ්න කරන්න.
- නිදසුනක් ලෙස සිසුන් පාලම මතින් කවුරුන් හෝ දණ ගසාගෙන ගියේ නම් එසේ මිනිසුන් තමන්ට ශාරීරික අපහසුතාවක් නැත්තේ නම් පාලමක් මතින් සාමාන්‍යයෙන් ගමන් කරන්නේ දැයි සාකච්ඡා කරන්න.
- අභියෝගය ජය ගැනීමට සිසුන් කුමන හෝ ගමන් රටාවක් අනුගමනය කලේ නම් ඒ පිළිබඳව ඇගයීමට ලක් කර එයට වඩා පහසුවෙන් අභියෝගය ජය ගැනීමට හැකියාවක් ඇති ද යන වග සාකච්ඡා කරන්න.
- ඒ අනුව පාලම මතින් බයිසිකලයකින් යාම, කුඩයක් අතින් අරන් යාම, දුරකථන සංවාදයක් කරන අතරතුර ගමන් කිරීම, පාලමේ අත්වැට අල්ලා ගමන් කිරීම වැනි පහසු දේවල් සිසුන්ට අමතක වූවා නම් ඒ පිළිබඳව සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- ගැටුම්කාරී අවස්ථාවක ආරවුලකට ඇත්තේ එකම විසඳුමක් ලෙසට ආරවුල් කරුවන් සිතන්නේ ද මේ අයුරින් බව සිසුන්ට පහදා දෙන්න (පාලම මතින් ඇවිද යාමට ඇත්තේ එකම ආකාරයක් ලෙසට)

ගැටුම් සඳහා විවිධ විසඳුම් ඇති බවත් වඩා පහසු විසඳුම් තිබියදී ආරවුල නිරවුල් කර ගැනීමට අපහසු පීඩාකාරී විසඳුම්වලට යාම ඵලදායී නොවන බව සිසුන්ට ක්‍රියාකාරකම ඇසුරින් පහදා දීම හා සමථකරුවාගේ කාර්යයභාරය වන්නේ එම විසඳුම් කරා යාමට පාර්ශවයන් දිරි ගැන්වීම බව පෙන්වා දීම.

**පස්වන පියවර: එකඟතාවයට පත්වීම (විසඳුම නියත කිරීම හා කල්පවත්නා බව තහවුරු කර ගැනීම)**

1) එකඟතාවයට පත් වීම.

   ✓ සාරාංශකරණ සන්නිවේදන ශිල්ප ක්‍රමය භාවිතා කිරීම

2) සම්මුතිය පැහැදිලි අකුරෙන් ලේඛන ගත කිරීම.

   (උක්ත ආරවුල/වරද පහත සඳහන් එකඟතා මත සමථයට පත් කර ගතිමු)

3) මුදල් වටිනාකමක් නම් අකුරෙන් ලිවීම.

4) වෙනත් විසඳා ගත යුතු ප්‍රශ්න තිබේදැයි විමසීම.


5) සමථකරණය සඳහා පැමිණීම සම්බන්ධයෙන් පාර්ශවයන්ට ස්තුති වීම.

### ක්‍රියාකාරකම 4.9: ගැටළු කිහිපයක් සිසුන්ට ලබා දී එම ගැටළු සඳහා ආරවුල්කරුවන් ගත හැකි යැයි අපේක්ෂා කල හැකි විසඳුම් පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.

**ඉගෙනුම් කරුණු :-**

- එම විසඳුම් කල් පවත්නා බව තහවුරු වන අයුරින් සකසා ගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.

සාර්ථක සමථකරණයක ලක්ෂණ




*රූප සටහන 15 සාර්ථක සමථකරණයක ලක්ෂණ*

#### වැඩසටහන ඇගයීම සහ නිවැසි ක්‍රියාකාරකම් ලබා දීම

**දිනය ඇගයීම**

පසු දිනය සඳහා පිටු 40 කින් සමන්විත ආකර්ශනීය සමරු පොතක් සකසා ගෙන එන ලෙසට සිසුන් දැනුවත් කරන්න.

දිනය පිළිබඳ වචන 04 න් අදහස් දැක්වීම

# පස් වන දිනය

## උදෑසන එකමුතුව හා පෙර දින ඇගයීම

### ක්‍රියාකාරකම 5.1: මිතුරාගේ හොඳම ගුණාංගයක් ඉදිරිපත් කිරීම

#### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

තමාට දකුණු පසින් සිටින මිතුරාගේ නම සඳහන් කර මෙම දින 05 තුළ දුටු හොඳම ගුණාංගයක් ඉදිරිපත් කිරීම. මෙය ආරම්භක සිසුවා දක්වා එන තෙක් පිළිවෙලට සිදු කිරීම.

#### ඉගෙනුම් කරුණු :-

1. දින 05 තුළ සිසුන්ගේ යහපත් ගුණාංග ප්‍රකාශ කිරීම නිසා සිසුන්ට තමා තුළ ඇතැයි මිතුරන් ප්‍රකාශ කරන ගුණාංග පිළිබඳ අවබෝධයක් ලැබීම.
2. තමා පිළිබඳව හොඳ දෙයක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමේ දී ඇතිවන මානසික තෘප්තිය බව පිළිබඳව සාකච්ඡා කිරීම.
3. දින 05 තුළ හඳුනා ගත් එම ගුණාංග ඉදිරි කාලයේදීත් අඛණ්ඩව පවත්වා ගැනීමට සිසුන්ට ධෛර්‍යය දීම.
4. සෑම පුද්ගලයෙක් තුළම යහපත් ගුණාංගයන් පවතින බව හා අප විසින් ඉදිරිපත් කල යුත්තේ එම ගුණාංගයන් බව පැහැදිලි කිරීම.

## සමථ මණ්ඩල ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය

### ක්‍රියාකාරකම 5.2: සමථ මණ්ඩල ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම

#### ක්‍රියාකාරකම සඳහා උපදෙස්


1. පුහුණුකරුවන් විසින් සමථ මණ්ඩලයක ආරවුලක් නිරවුල් කරන ආකාරය පිළිබඳව ආදර්ශ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම.
2. ආදර්ශ භූමිකා රංගනය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.
3. භූමිකා රංගනය සඳහා සිසුන්ව 5 දෙනා බැගින් කණ්ඩායම් කිරීම.
4. සිසුන් තිදෙනෙක් සමථ මණ්ඩලය සඳහාත් ඉතිරි දෙදෙනා ආරවුල්කරුවන් ලෙසත් වෙන් කිරීම.
5. එසේ නිර්මාණය කල සමථ මණ්ඩල සඳහා ආරවුල් ලබා දී එම ආරවුල සමථකරණය කරන ලෙස සිසුන්ට උපදෙස් දී අවශ්‍ය අවස්ථාවලදී පුහුණු කරුවන් විසින් මඟ පෙන්වීම් සිදු කිරීම.
6. භූමිකා රංගනයෙන් පසු එහි සාර්ථක හා අසාර්ථක අවස්ථාවන් පිළිබඳව සාකච්ඡාවක් සිදු කිරීම.

**පාසල් සමථකරණයට අදාළ වීඩියෝ පටය ප්‍රදර්ශනය කිරීම**

- භූමිකා රංගනයෙන් අනතුරුව පාසල් සමථකරණයට අදාළ වීඩියෝ පටය ප්‍රදර්ශනය කිරීම.
- එහි සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතා කරන ආකාරය හා සාකච්ඡාව මෙහෙයවන ආකාරය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.

## සමථකරණ මූලධර්ම

එක් එක් ගුණාංග පිළිබඳව වෙන් වෙන්ව සාකච්ඡා කිරීම මගින් සිසුන් තුළ ඒවායේ වැදගත්කම තහවුරු කල හැක.




*රූප සටහන 16 සමථකරුවෙකු සතු ගුණාංග*

## ක්‍රියාකාරකම 5.3: අවංකභාවය පිළිබඳ චරිත නිරූපණය

*(මූලාශ්‍රය : අවංකභාවය පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 6.4)*
Link: www.values4all.lk/Sinhala/chapter-06/activity-6.4.html

### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

කෙටි සිදුවීමක් පවසා යහපත් ගුණාංග සහිත පුද්ගලයකු එයට මුහුණ දෙන ආකාරය හා එහි ප්‍රතිඵල ද, අයහපත් ගුණාංග සහිත පුද්ගලයකු එයට ප්‍රතිචාර දක්වන ආකාරය හා ඉන් ඇතිවන ප්‍රතිඵල ද පිළිබඳව, සාකච්ඡාවක් ගොඩ නැගීම මෙහිදි සිදු කල හැක.

අයේෂා විශේෂ උත්සවයකට සහභාගි වීම සඳහා මනා ලෙස ඇඳ පැළඳ අම්පාරේ සිට කොළඹ දක්වා පැමිණෙයි. කොළඹ ප්‍රධාන බස් නැවතුමේ සිට උත්සව ශාලාව දක්වා යාමට ත්‍රිරෝද රථයකට දීමට ඇය අත මාරු මුදල් නොමැති වීමෙන් ඇය අසළ ඇති කුඩා වෙළඳසැලකට පිය නගයි. ඇය එහිදී ඇය අත ඇති රු 5000 නෝට්ටුව මාරු කර දෙන මෙන් වෙළඳසැලේ සේවය කරන කාන්තාවගෙන් ඉල්ලා සිටී. වෙළඳසැල් සේවිකාව අයේෂාව සුහදව පිළිගෙන මුදල් මාරු කර දෙන අතර තොරතුරු විමසයි. එහිදී වෙළඳසැල් සේවිකාව පවසන්නේ තමා එම වෙළඳසැලේ සේවිකාව බවත් වෙළඳසැල් හිමිකරු එදින සේවයට නොපැමිණි බවත් ඇයගේ දෛනික වැටුප රු 1500 වන බවත්ය. ඇයට එදින තනිවම සේවය කල යුතු නිසා වැඩ අධික දිනයක් බව ද පවසයි. ඇය අයේෂාට රු 1000 නෝට්ටු 04 ක් සහ ඉතිරි රු 1000 සඳහා රු 500 නෝට්ටුවක් සහ අනෙත් රු 500 නෝට්ටුව වෙනුවට වැරදීමකින් රු 5000 නෝට්ටුවක් ලබා දී ඇති බව වෙළඳසැලෙන් පිටතට ගිය විට අයේෂාට දැන ගැනීමට හැකි වේ. මෙය දැනගත් පසු අයේෂා කුමක් කරනු ඇතිද?

1. අයේෂා වංක වුවහොත් ඇති වන ප්‍රතිඵලය පිළිබඳව සාකච්ඡාවක් ගොඩ නැගීම මෙහිදී සිදු කල හැක.
2. අයේෂා අවංක වුවහොත් ඇති වන තත්වය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
3. අයේෂාට, අලෙවිකාරිණිය හා සාප්පු හිමියාට ඇති වන බලපෑම කණ්ඩායම සමග සාකච්ඡා කරන්න.
4. සිසුන් දිරිගන්වමින් පුළුල් සාකච්ඡාවක් ගොඩ නගන්න.

## ක්‍රියාකාරකම 5.4: සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වය හා පාසල් සමථකරණ ඒකකය පිහිටුවීම (භූමිකා රංගනය)

මෙම අවස්ථාවේ දී සිසුන් අඩ රවුමක් ආකාරයට අසුන් ගැන්වීමට සලස්වා සිසුන්ට පෙර අවස්ථාවන්හි දී රඟ දැක්වූ භූමිකා රංගනයන් ද ආදර්ශනය කරමින්, සිසුන් අතරින් තිදෙනක් සමථකරුවන් ලෙසත් දෙදෙනෙක් ආරවුල්කරුවන් ලෙසත් තෝරා ගෙන ආරවුල නිරවුල් කර ගැනීමට අවස්ථාව ලබා දී ආරවුල නිරවුල් කරන අතරතුර සෙසු සිසුන් ද සමථකරුවන් ලෙස ගැටළුව නිරවුල් කර ගැනීමට සහය කර ගැනීම.

**ඉගෙනුම් කරුණු :-**

- ස්ථාවරයන් අතරින් උවමනාවන් හඳුනා ගැනීම
- සමථකරණ පියවර
- සන්නිවේදන ශිල්ප ක්‍රම භාවිතය පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම

## සහකම්පනය සහ අනුකම්පාව

සහකම්පනය යනු පුද්ගලයෙකුට දැනෙන හැඟීමක් ඒ අයුරින්ම තමන්ට දැනෙන බව එම පුද්ගලයාට දැන්වීමේ හැකියාවයි. එය කරදරයක ආරවුලක පැටලී සිටින පුද්ගලයකුගේ හැඟීම් තේරුම් ගැනීමයි. අනුකම්පාව සහ සහකම්පනය අතර වෙනසක් ඇත. දුකින් සිටින පුද්ගලයකු වෙනුවෙන් දයාව කරුණාව දැක්වීම අනුකම්පාවයි. නමුත් අනුකම්පා කිරීමේ දී එම පුද්ගලයාගේ හැඟීම් තේරුම් ගැනීමක් සිදු නොවේ. එසේම සහකම්පනය සහිත පුද්ගලයකු පූර්ව විනිශ්චය කිරීම්වලින් තොර ක්‍රියාකාරී සවන්දීමේ හැකියාවෙන් සන්නද්ධ පුද්ගලයකු විය යුතුයි.

## ක්‍රියාකාරකම 5.5 අනුකම්පාව

*(මූලාශ්‍රය : කරුණාව පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 4.3)*

Link: www.values4all.lk/Sinhala/chapter-04/activity-4.3.html

**ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-**

මෙම කතන්දරය කණ්ඩායම වෙතට කියවන්න:

> හර්ෂණ්ට එම ප්‍රදේශයට අළුතින් පැමිණි පුද්ගලයෙකි. සෑම දිනකම ඔහු පාවහන් රහිතව පා ගමනින් වෙළඳපොලට ගොස් තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගනියි. ඔහු නිරතුරුවම අසතුටින් සිටින බවක් පෙනේ. වෙළඳපොලට යන අතරමග ඔහු පසුපස ගමන් කරමින් ඔහුට විහිළු-තහළු කරන්නා වූ තරුණ පිරිමි ළමුන් කිහිපදෙනක් සිටිති. ඔවුහු ඔහුට මෝඩ පෙනුමක් ඇතැයි පවසති. ඔහුගේ හිසකෙස්, ඇට පෑදුණු පා, ඔහුගේ සමේ සහ ඇඳුම්වල පැහැය පිළිබඳ ඔවුහු ඔහුට විසුළු කරති. එක් දිනක, හර්ෂණ්ට විහිළු කරන කණ්ඩායමේ නායකයා වන මනූර, හර්ෂණ් වෙළඳපලේ සිට කෑම පාර්සලයකුත් ගෙන පිටතට පැමිණෙන අවස්ථාවේ ඔහුව තල්ලු කලේය. මනූර විසින් කෙතරම් තදින් හර්ෂණ්ව තල්ලු කලේ ද යත් ඔහු වැටෙන්නට ගිය අතර, ඔහුගේ කෑම පාර්සලය ද බිම වැටෙන්නට ගියේය. ඒ අසල තවත් පිරිස් වූ නමුත් ඔවුහු කිසිවක් නොපැවසූ අතර, කිසිදු උපකාරයක් නොකොට ඔහේ බලා සිටියහ. හර්ෂණ් වෙළඳපලට යන සෑම අවස්ථාවකම පාහේ මෙය සිදුවේ. හඬන්නට සිතෙන තරම් දුකක් හර්ෂණ්ට ඇති වන නමුදු ඔහු නොහඬයි. හැඬුවහොත් තත්ත්වය වඩාත් බරපතල වනු ඇතැයි ඔහු සිතයි. එනමුදු ලැජ්ජාව නිසා ඔහු මේ බව ඔහුගේ දෙමාපියනට හෝ ගුරුවරුනට නොපවසයි.

හර්ෂණ් මුහුණදුන් තත්වයට ඔබට මුහුණ දීමට සිදුවුවහොත් ඔබට කුමක් හැඟේද යන්න සහභාගීවන්නන්ගෙන් විමසන්න.

- ඔහුට කෙබඳු හැඟීමක් ඇතිවන්නට ඇතිදැයි ඔබ සිතන්නේද?
- හර්ෂණ් තුළ පැවතිය හැකි හැඟීම් නම් කිරීමට සහභාගීවන්නන්ට උපකාර කරන්න.

ඒ අවස්ථාවේ ඒ අසල සිටින අයෙකු අතරින් කෙනෙකු බවට ඔබ පත්වුවහොත් එකී තත්ත්වය කෙබඳු විය හැකිද යන්න සිතින් මවා ගන්නා ලෙස සහභාගීවන්නන්ට පවසන්න.

- ඒ දෙස බලා සිටින අනෙක් කුඩා ළමුන්ට කුමන හැඟීමක් ඇතිවන්නට ඇතිදැයි ඔබ සිතන්නේද?
- අසල බලා සිටින්නන් තුළ පැවතිය හැකි හැඟීම් නම් කරන ලෙස සහභාගීවන්නන්ට පවසන්න.
- සහභාගීවන්නන් සිවුදෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදෙන්න. කතාන්දරය පිළිබඳ සාකච්ඡාකොට හර්ෂණ්ට උපකාර කිරීම සඳහා අසළ බලා සිටින්නන් විසින් කල හැකිව තිබූ දේ වාක්‍ය දෙකකින් හෝ තුනකින් විස්තර කල හැකි පරිදි සූදානම් කර ගන්නා ලෙස දැනුම් දෙන්න.
- ප්‍රධාන කණ්ඩායමට නැවත පැමිණි පසු එක් කණ්ඩායමකින් එක් නියෝජිතයකු බැගින් ගෙන කණ්ඩායම තුළ සාකච්ඡා කරන ලද කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ ඔස්සේ මාතෘකාවට අදාළව සාකච්ඡාවක් ගොඩ නගන්න.

### ක්‍රියාකාරකම 5.6 - සහකම්පනය

*(මූලාශ්‍රය : ඉවසීම පිළිබඳ සාරධර්ම සංග්‍රහය ක්‍රියාකාරකම් 5.2)*
Link: www.values4all.lk/Sinhala/chapter-05/activity-5.2.html

තමා වැඩිපුර ඇසුරු නොකරන සිසුවකු පාර්ශවකරු ලෙස තෝරා ගෙන විනාඩි 05 ක් ඔහුව අනුකරණය කරන ලෙස පවසන්න.
පසුව චරිත මාරු කර ගන්න.

**ඉගෙනුම් කරුණු :-**

- අනෙකාව අනුකරණය හා අනෙකාව තේරුම් ගැනීම අතර ඇති වෙනස්කම සිසුන්ට පෙන්වා දීම.
- සහකම්පනය සමථකරණ ක්‍රියාවලියේදී වැදගත් වන ආකාරය පෙන්වා දීම.
- වෙනත් පුද්ගයකුගේ විවිධත්වයට සංවේදී වෙමින් එම පුද්ගලයා පිළිබඳව සාධාරණ ආකල්පයක් ඇති කර ගැනීමේ හැකියාව ප්‍රගුණ කර ගන්නා ආකාරය හා එහි වැදගත්කම සාකච්ඡා කිරීම.

ඒකකය පිහිටුවීමට පෙර සෑම කණ්ඩායමක්ම මැදිහත් වූ විවිධ ආකාරයන් සමාලෝචනය කිරීමෙන් සහ සෑම කණ්ඩායමක් සමගම අදහස් හුවමාරු කරගැනීමෙන්, පාසල් සමථකරණ ඒකකයේ කාර්යභාරය අවබෝධ කර ගැනීමට සිසුන්ට තව දුරටත් ඉඩ සලසන්න.

සෑම සාමාජිකයෙකුගේම යුතුකම් ගැන දැනුවත් කරන්න.

## සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වය හා පාසල් සමථ ඒකක පිහිටුවීම

**1. සභාපති**

පාසල් සමථ ඒකකයේ සාමාජිකයින් සමග එක් වී ඒකකය ක්‍රියාකාරිව හා යාවත්කාලීනව පවත්වා ගැනීම.

සමථ ඒකකය භාර ගුරුවරයා සමග එක් වී ඒකකයේ කටයුතු කලාප අධ්‍යාපන කාර්යාලය හා සමථ මණ්ඩල කොමිෂන් සභාව වෙත සම්බන්ධීකරණය කිරීම.

සමථ ඒකකය පාසල තුළ ප්‍රචාරණයට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

**2. ලේකම්**

පාසල් සමථ ඒකකයේ ලිපි ලේඛන හා වාර්තා නිවැරදිව පවත්වාගෙන යාම.

මාසික වාර්තාවන් නිවැරදිව කලාප අධ්‍යාපන කාර්යාලයට හා සමථ මණ්ඩල කොමිෂන් සභාවට යොමු කිරීම.

මාසිකව පවත්වන පාසල් සමථ ඒකකයේ රැස්වීම් වාර්තාවන් ගොනු කර තබා ගැනීම.

**3. භාණ්ඩාගාරික**

සමථ ඒකකයට ඒකරාශි වන මුදල් ගනුදෙනු ලේඛන ගත කර විනිවිද භාවයෙන් යුක්තව පවත්වා ගෙන යාම.

මාසික රැස්වීම්වලදී මුදල් වාර්තාවන් ඉදිරිපත් කිරීම.

### පාසල් සමථ ඒකකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :-

1. පාසල තුළ සමථ ඒකකය ස්ථාපනය කර ඇති බව පාසල තුළ ප්‍රචාරණය කිරීම.
2. ආරවුල් යොමු කරන ආකාරය පිළිබඳව හා පැමිණිලි පෙට්ටිය ස්ථාපනය කර ඇති ස්ථානය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම.
3. සමථකරණ සංකල්පය පාසල තුළ ප්‍රවර්ධනයට අදාළ කටයුතු සිදු කිරීම.
4. වාර්ෂික සැලැස්මකට අනුව සමථ ඒකකය ක්‍රියාත්මක කිරීම.
5. ඒකකය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට විදුහල්පතිගේ හා ගුරුවරුන්ගේ සහයෝගය ලබා ගනිමින් පවත්වාගෙන යාම.

### දින 05 පිළිබඳ මතක සටහන් කිරීම

- සමරු පොතක් ලිවීම.
- දින 05 තුළ දුටු හොඳ ගුණාංගයන් සමරු පොතක සටහන් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙහිදී සෑම සිසුවෙක්ම තමාට සමරු පොතක් සකස් කර ගෙන තිබිය යුතුය.
- සියළුම දෙනා රවුමක් ආකාරයට හිඳ ගැනීමට සලස්වන්න.
- කණ්ඩායමේ සියළු සිසුන් විසින් මෙම පුහුණු කාලය තුළ සමරු පොත හිමි පුද්ගලයාගේ තමන් දුටු යහපත් ගුණාංග වලින් එකක් සටහන් කර එයට යටින් තමාගේ නම සඳහන් කල යුතුය.
- පොත් පිළිවෙලට දකුණු පසට අතින් අතට යවමින් සමරු සටහන් ලබා ගැනීම.
- ඒ සඳහා සුදුසු කාලයක් ලබා දීම.

## ක්‍රියාකාරකම 5.7 - විලාසිතා දැක්ම

### අවශ්‍ය ද්‍රව්‍ය :-

- පත්තර පිටු (කණ්ඩායම් 05 ට ප්‍රමාණවත් පරිදි)
- සෙලෝ ටේප් (ලොකු) 05

### ක්‍රියාකාරකම සඳහා උපදෙස් :-

- සියලුම දෙනා කණ්ඩායම් 5 කට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම පත්තර කොළ 10 ක් හා සෙලෝ ටේප් එකක් බැගින් ලබා දීම.
- විනාඩි 30 ක් ඇතුළත නව විලාසිතාවක් ඉදිරිපත් කිරීම.

- ජයග්‍රාහකයන් 03 දෙනෙකු තෝරා ත්‍යාග ලබා දීම

## නිල ලාංඡන හා සහතික පත් ප්‍රදානය හා අවසන් දින උත්සවය

**අවසන් දින උත්සවය සඳහා න්‍යාය පත්‍රය.**

01. පිළිගැනීම.
02. අරමුණ පැහැදිලි කිරීම.
03. පස් දින පුහුණුව පිළිබඳව සිසුන්ගේ අදහස් ලබා ගැනීම.
04. සිසුන්ගේ ඉදිරිපත් කිරීම්.
05 සහතිකපත් හා නිල ලාංඡන ලබා දීම.
06. පාසල් සමථ ඒකකය භාර ආචාර්යවරයාගේ කථාව.
08. පුහුණු වැඩසටහන පැවැත්වූ නිලධාරීන් වෙනුවෙන් අදහස් දැක්වීම.
07. විදුහල්පතිතුමන්ගේ අදහස් දැක්වීම.
08. ආරාධිත කථාව.
09. ස්තුති කථාව.





# වැඩසටහන පසු විපරම හා අධීක්ෂණය

**01. පශ්චාත් පුහුණුව (දින 5)**

- පස් දින පුහුණුව අතරතුර වැඩසටහනේ අරමුණු ඉටුවන්නේ දැයි නිරීක්ෂණය මගින් තොරතුරු ලබාගැනීම

**02. පාසල් සමථ ඒකක රැස්වීම**

- පුහුණුවෙන් පසු පාසල් සමථ ඒකකයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය විදුහල්පති මගින් මාසිකව නිරීක්ෂණය කිරීම

**03. විදුහල්පතිගේ මාසික ප්‍රගති වාර්තාව**

- විදුහල්පති මගින් මාසික ප්‍රගතිය සමථ මණ්ඩල කොමිෂන් සභාවට පිටපතක් සහිතව කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කිරීම (ඇමුණුම වෙත යොමු වන්න)

**04. අධිකරණ අමාත්‍යංශය සඳහා MBC වාර්තාව**

- සමථ මණ්ඩල කොමිෂන් සභාව මගින් අධිකරණ අමාත්‍යංශයට මාසිකව ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීම (ඇමුණුම වෙත යොමු වන්න)



අනාගත නායකයින් සඳහා සමථකරණ සංකල්පය ප්‍රවේශ කරමින්
සහජීවනයෙන් යුක්ත තිරසාර ශ්‍රී ලංකාවක්
බිහි කිරීමට අප දරනු ලබන මහත් වූ පරිශ්‍රමය නිසැකයෙන්ම යථාර්තයක් වනු ඇත.

දරුවන් සඳහා සුරක්ෂිත හෙටක් ගොඩනැගීමට අධිකරණ අමාත්‍යාංශය සමඟින්

සමථ මණ්ඩල කොමිෂන් සභාව නිතැතින්ම

සවියක්ම වනු ඇත.



# ඇමුණුම්

ඇමුණුම 01

මාසික ප්‍රගති වාර්තාවන් ඉදිරිපත් කිරීම - 2022 . . . දින සිට 2022 . . . දක්වා

01. පාසලේ නම :-.....................................................................................................

.....................................................................................................

02. ලැබුණු ආරවුල් සංඛ්‍යාව :- ..........................................................................

03. නිරවුල් කල ආරවුල් සංඛ්‍යාව :-.................................................................

04. පාසල් සමථ ඒකකය මගින් සිදු කල ප්‍රචාරණ වැඩසටහන් පිළිබඳ විස්තර :-..............

.....................................................................................................

05. පාසල් සමථ ඒකකයේ අභිවෘද්ධිය වෙනුවෙන් මාසික රැස්වීම් වලදී ගනු ලැබූ යෝජනාවන් :- .......................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

සකස් කළේ,

.................................

ලේකම්,

පාසල් සමථ ඒකකය.

ඉහත වාර්තාව නිර්දේශ කරමි.

පාසල් සමථ ඒකකය භාර ගුරුභවතාගේ නම :-........................................................

අත්සන :-........................................................ දිනය :- ......................................

අනුමත කරමි,

විදුහල්පති,

අත්සන හා නිල මුද්‍රව

දිනය :-

ඇමුණුම 02

**පාසල් සමථ ඒකකයට ආරවුල් ඉදිරිපත් කිරීම සඳහා වන ආකෘති පත්‍රය**

01. ආරවුල ඉදිරිපත් කරන පළමු පාර්ශවයේ නම :-...................................................................

02. පළමු පාර්ශවය ඉගෙනුම ලබන පන්තිය :-...........................................................................

03. ආරවුලට සම්බන්ධ දෙවන පාර්ශවයේ නම :-.........................................................................

04. ආරවුලට සම්බන්ධ දෙවන පාර්ශවය ඉගෙනුම ලබන පන්තිය :- ........................................

05. ආරවුල කුමක් අරඹයා ද යන වග කෙටියෙන් :- ....................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

ආරවුල ඉදිරිපත් කරන පළමු පාර්ශවයේ නම හා අත්සන

ඇමුණුම 03

**පාසල් සමථ ඒකකය - නිරවුල් වීමේ සහතිකය**

01. ආරවුල ඉදිරිපත් කරන පළමු පාර්ශවයේ නම :- ....................................................................

02. ආරවුලට සම්බන්ධ දෙවන පාර්ශවයේ නම :- ....................................................................

03. ආරවුල නිරවුල් කර ගැනීමට එකඟ වූ ආකාරය :- ....................................................................

............................................................ ............................................................

පළමු පාර්ශවයේ අත්සන | දෙවන පාර්ශවයේ අත්සන

දිනය | දිනය

ප්‍රධාන සමථකරුගේ නම :- ....................................................................

ප්‍රධාන සමථකරුගේ අත්සන :- ....................................................................

සම සමථකරුගේ 1 නම :- ....................................................................

සම සමථකරුගේ 1 අත්සන :- ....................................................................

සම සමථකරුගේ 2 නම :- ....................................................................

සම සමථකරුගේ 2 අත්සන :- ....................................................................